Australian Government

Department of Immigration and Citizenship

# ඕස්ට්‍රේලියාවේ ජීවිතයක් ආරම්භ කිරීම

# Northern Territory

## වෙත සාදරයෙන් පිළිගනිම

## Sinhalese

සිංහල

2009 ජනවාරි

DIAC09/00530-224

**සංස්කරණ දිනය:** 2009 ජනවාරි.

**දුරකථන අංක:** 1800 න් ඇරඹෙන දුරකථන අංකවලට පුද්ගලික දුරකථනයකින් කථාකරන විට ගාස්තුවක් අය නොකරන අතර ගෙවන දුරකථනයකින් කථාකරන විට ප්‍රදේශීය දුරකථන ඇමතුමකට මෙන් අයකෙරේ. දුරකථන අංක 13 හෝ 1300 න් ඇරඹෙන අංකවලට අයකරනුයේ ප්‍රාදේශීය ඇමතුම් ගාස්තුව පමණි. සමහර 1300 සහ 1800 දුරකථන අංක ඇමතිය හැක්කේ ප්‍රධාන නගරයෙන් පිටත සිට පමණි. ජංගම දුරකථනවලින් ගන්නා ඇමතුම් සඳහා ජංගම දුරකථන ගාස්තු අය කෙරේ.

අංක 13, 1300 හෝ 1800 න් ආරම්භ නොවන අංක සඳහා: ඕස්ට්‍රේලියාවට පිටත සිට අමතන්නේනම්, ඕස්ට්‍රේලියාවේ අංකය වන 61 පළමුව අමතන්න, ඉන් පසුව 0 නැතිව ප්‍රාදේශීය අංකය අමතන්න, අවසානයට අවශ්‍ය අංකය අමතන්න. ඕස්ට්‍රේලියාව තුල සිට නමුත් ප්‍රාන්තයක (state) හෝ සන්තක ප්‍රදේශයක (Territory) පිටත සිට අමතන්නේ නම්, පළමුව ප්‍රදේශීය අංකය අමතා පසුව දුරකථන අංකය අමතන්න.

**වගකීම බැහැර කිරීම**: Department of Immigration and Citizenship (සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව) (දෙපාර්තමේන්තුව) සහ එයට දායක වන වෙනත් ආයතන මගින් මෙම පොත් පිංචෙහි ඇතුලත් කරුණු, මෙය පළකරන අවස්ථාවේ, නිවැරදි බවට වගබලාගෙන ඇති අතර මෙම පොත් පිංචෙහි ඇතුලත් කරුණු නිරතුරුව වෙනස්වීමට ඉඩ ඇත. මෙම පොත් පිංචෙහි ඇතුලත් කරුණු කෙරෙහි විශ්වාසය තැබීම නිසා යම් අයෙකු හට පාඩුවක් හෝ අලාභයක් සිදුවුවහොත් දෙපාර්තමේන්තුව හෝ එයට දායකත්වය දරණ කිසිවකු විසින් නොසැලකිල්ල සම්බන්ධව හෝ අන්‍යාකාරයකින් වගකීම භාරගනු නොලැබේ.

# පටුන


**හැඳින්වීම ..... 5**

**1. ඔබ මෙහි පැමිණි විගස කල යුතුදේ ..... 6**
- A. Tax File Number සඳහා අයදුම් කිරීම ..... 6
- B. Medicare සමගින් ලියාපදිංචිවී පුද්ගලික සෞඛ්‍යය රක්‍ෂණ ලබාගැනීමට සලකා බලන්න ..... 7
- C. බැංකු ගිණුමක් විවෘත කරන්න ..... 7
- D. Centrelink සමගින් ලියාපදිංචි වන්න ..... 8
- E. Health Undertaking Service සමගින් සම්බන්ධ වන්න ..... 8
- F. ඉංග්‍රීසි පංති සඳහා ලියාපදිංචි වන්න ..... 8
- G. ඔබගේ දරුවන් පාසැලකට ඇතුලත් කරන්න ..... 9
- H. රියදුරු බලපත්‍රයකට අයදුම් කරන්න ..... 9

**2. ඉංග්‍රීසි සඳහා උපකාර ..... 10**
- Translating and interpreting services ..... 10
- වැඩිහිටියන් සඳහා ඉංග්‍රීසි ඉගෙනීම ..... 11

**3. හදිසි සේවා ..... 13**
- Police ..... 13
- Ambulance ..... 14
- Fire Brigade ..... 14
- වෙනත් හදිසි දුරකථන අංක ..... 14

**4. උපකාර සඳහා යායුතු තැන් ..... 15**
- Adult Migrant English Program (AMEP) ..... 15
- වාර්ගික සහ ප්‍රජා සංවිධාන ..... 15
- තරුණ අය සඳහා සේවා ..... 16
- නීති ආධාර (Legal aid) ..... 17
- සැහැසිකම් ..... 17
- පාරිභෝගික අයිතීන් ..... 17
- පළාත් පාලන ආයතනය ..... 18
- The Australian Government Regional Information Service (AGRIS) ..... 18
- හදිසි සහන ..... 18
- ඥාතීන් සොයා ගැනීම ..... 18
- දුරකථන ආපදා උපදේශක සේවා ..... 19
- විවාහ සහ වෙනත් සම්බන්ධතා ..... 19
- ශාරීරික වධ හිංසා සහ චිත්තවේග උපදේශක සේවා ..... 19
- මූල්‍ය සේවා ..... 19
- බදු උපකාර ..... 20

**5. ඕස්ට්‍රේලියානු චාරිත්‍ර සහ නීති ..... 21**
- වගකීම් සහ වටිනාකම් ..... 21
- සමානතාවය සහ වෙනසකට ලක් නොකිරීම ..... 21
- අපරාධ වැරදි ..... 22
- රිය පැදවීම ..... 24
- මත් ද්‍රව්‍ය, දුම්පානය සහ මත්පැන් පානය ..... 24
- පරිසරය ..... 25
- ශබ්දය ..... 25
- සතුන් ..... 25
- මිනිසුන් හමුවීම සහ කථාබහ ..... 25
- ආචාරශීලී හැසිරීම ..... 26
- ඇඳුම් පැළඳුම් ..... 26
- පොදු ඕස්ට්‍රේලියානු යෙදුම් ..... 26

**6. නිවාස ..... 28**
- පුද්ගලික නිවාසයක් හෝ තට්ටු නිවාසයක් කුලියට ගැනීම ..... 28
- කුලී නිවෙස්කරුගේ අයිතිවාසිකම් සහ වගකීම් ..... 28

නිවෙසක් හෝ තට්ටු නිවෙසක් මිළට ගැනීම ... 28
රජයේ නිවාස ... 29
අත්‍යාවශ්‍ය ගෘහ සේවා ... 29

**7. රැකියා ... 31**
රැකියා සෙවීම ... 31
Job Network සේවා ... 31
වැඩි විස්තර ... 32
අධ්‍යාපන සුදුසුකම් ... 32
රැකියා තත්වයන් (සේවා යෝජක/සේවක අයිතීන්) ... 33
Superannuation ... 34
බදු ගෙවීම ... 34

**8. සමාජ ආරක්‍ෂණ (Social security) ... 37**
Centrelink ගෙවීම් ... 37
බලා සිටීමේ කාලය ... 37
මානව හිතවාදී පදනම යටතේ රටට ඇතුළුවන්නන් හට අර්බුද ගෙවීම් (Crisis Payment) ... 38
Family Assistance payments ... 38
තරුණ අය ... 38
Centrelink හෝ Family Assistance Office සමග ඔබ වෙනුවෙන් වෙනත් අයෙකු කටයුතු කිරීම ... 39
අයිතීන් සහ වගකීම් ... 39
Centrelink Multicultural Service Officers (බහුසංස්කෘතික සේවා නිලධාරීන්) ... 39
වැඩිදුර විස්තර ... 39

**9. ප්‍රවාහනය ... 41**
පොදු ප්‍රවාහනය ... 41
පුද්ගලික වාහන ... 41

**10. අධ්‍යාපනය සහ ළමා සුරැකුම් (child care) ... 42**
ළමා සුරැකුම් ... 42
පාසැල් ... 42
ඉංග්‍රීසි කථා නොකරන ළමුන් ... 43
භාෂා පරිවර්තකයන් ... 43
පාසැලට ඇතුලත් කිරීම ... 43
පාසැලට ඇතුලත් කිරීම ... 43
විශ්ව විද්‍යාල ... 43

**11. සෞඛ්‍යය ක්‍රමය ... 45**
Medicare ... 45
Centrelink Health Care Card ... 45
පුද්ගලික සෞඛ්‍යය රක්‍ෂණය ... 45
වෛද්‍ය සහාය ... 46
Community Health Centres ... 47
මානසික සෞඛ්‍යය ... 47
සංස්කෘතික හෝ භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වලින් පැමිණෙන අය සඳහා සේවා ... 47
එන්නත් කිරීම ... 48
දන්ත සේවා ... 48
වයෝවෘද්ධ රැකවරණ (aged care) ලබා ගැනීම ... 48
වැඩි විස්තර ... 49

**12 විනෝද ක්‍රියා සහ ජනමාධ්‍යය ... 50**
එළිමහන් ක්‍රියාකාරකම් ... 50
ජනමාධ්‍ය ... 50
ඉන්ටනෙට් ... 50

**13. Department of Immigration and Citizenship ... 51**
Resident Return Visas (නේවාසිකයන් නැවත පැමිණීමේ වීසා බලපත්‍ර) ... 51
ඥාතීන් බැලීමට ඕස්ට්‍රේලියාවට පැමිණීම ... 52

**14. පළාත් පාලනය සහ ප්‍රජා සේවා ... 53**

ප්‍රජා සේවා........................................................................................................ 53
බහු වාර්ගික සේවා.................................................................................................. 53
පුස්තකාල ............................................................................................................ 53
වෙනත් සේවා ........................................................................................................ 54
වැඩි විස්තර........................................................................................................... 54

# හැඳින්වීම

ඕස්ට්‍රේලියාව සහ විශේෂයෙන් නොදර්න් ටෙරිටරි (Northern Territory) වෙත ඔබ සාදරයෙන් පිළිගනිමු.

ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්ත, සන්තක ප්‍රදේශ, සහ පලාත් පාලන ආයතන සහ රාජ්‍ය නොවන ආයතන එක්ව ඕස්ට්‍රේලියානු වැසියන් හට සේවා රැසක් ලබාදේ. මෙම පොත් පිංච මගින්, ලබාදෙන සේවා සහ ලබා ගත හැකි උපකාර  සහ උපදේශ ලබා ගැනීම සඳහා යා යුත්තේ කා වෙතද යන්න සම්බන්ධයෙන් මූලික අදහසක් ලබාදේ.

මෙම පොත් පිංච අරමුණු කර ඇත්තේ මෙම රටට පැමිණීමට අපේක්ෂා කරන සහ අළුතින් පැමිණ ඇති සංක්‍රමණිකයන් හට වන අතර විශේෂිත අවධානය යොමුකර ඇත්තේ ස්ථිර සංක්‍රමණිකයන් සම මානව හිතවාදී ලෙස රටට ඇතුළුවන්නන් මෙන්ම ඔවුන් හට අනුග්‍රහය දක්වන අයට මෙන්ම සේවා සපයන්නන් වෙතය. සරණාගතයන් සහ මානව හිතවාදී පදනම මත රටට ඇතුළුවන්නන් විසින් Department of Immigration and Citizenship (DIAC) මගින් විශේෂිතව ඔවුන් සඳහා ලබාදෙන තොරතුරු බැලිය යුතුය.

මෙම පොත් පිංච අරමුණු කර ඇත්තේ මෙම රටට පැමිණීමට අපේක්ෂා කරන සහ අළුතින් පැමිණ ඇති සංක්‍රමණිකයන් හට වන අතර විශේෂිත අවධානය යොමුකර ඇත්තේ ස්ථිර සංක්‍රමණිකයන් වෙතය. මෙය කියවන සියළුම පාඨකයන් හට සියළුම තොරතුරු අදාල ලෙස සැකසීම දුෂ්කරය. ස්ථිර ලෙස පැමිණෙන සමහර සංක්‍රමණිකයන් සහ බොහෝ තාවකාලික වීසා බලපත්‍ර ලාභීන් සියළුම සේවා සඳහා සුදුසුකම් නොලබනු ඇත.

කරුණාකර මෙම පොත් පිංච කල්පනාකාරීව කියවීමට වේලාව යොදාගන්න. ඕස්ට්‍රේලියාවේ නව ජීවිතයක් අරඹන ඔබට මෙය ප්‍රයෝජනවත් වන බව අපගේ විශ්වාසයයි. ඔබ විසින් වඩාත්ම අළුත් සංස්කරණය කියවිය යුතු අතර, බොහෝ පදිංචි කිරීමේ සේවා සපයන්නන් වෙතින් සහ ‘Living in Australia’ වෙබ් අඩවිය වන www.immi.gov.au/living-in-australia මගින්ද මෙය ලබාගත හැක. ඔබ විසින් ප්‍රථමයෙන් පරිච්ඡේද 1-4 දක්වා කියවීම සුදුසු බව අපි යෝජනා කරමු. ඔබට ප්‍රථම සති හතර තුල ඇතිවිය හැකි ගැටළු මෙම පරිච්ඡේද මගින් සාකච්ඡා කෙරේ.

ඔබගේ ජීවිතය ඕස්ට්‍රේලියාවේදී ආරම්භ කිරීමේදී ඔබට මුහුණ දීමට වන ගැටළු සංකීර්ණ වන අතර ඒවා වෙනස්වේ. ඔබ ඉදිරියේ අභියෝගයන් ඇති අතර ඔබට ප්‍රතිලාභද ලැබේ. අවසානයේදී ඔබගේ සාර්ථකත්වය තීරණය වන්නේ ඔබගේ උත්සාහයන් මෙන්ම ඔබට උපකාර කිරීමට කැමැත්තෙන් සිටින අයගේද හොඳ හිත මතය. ඔබව සාදරයෙන් පිළිගන්නා අතරම අපි ඔබට සුභ පතමු!

# 1. ඔබ මෙහි පැමිණි විගස කල යුතුදේ

ඕස්ට්‍රේලියාවට පැමිණි විගස ඔබ විසින් කල යුතු වැදගත් කරුණු 8 ක් ඇතුලත් ලැයිස්තුවක් පහත දැක්වේ. ඔබ මේවා සිදුකරන අතරම සළකුණු කර ගන්න.

| හරි වැරදි බැලීමේ ලේඛණය | ✓ |
|---|---|
| **A. Tax File Number** සඳහා අයදුම් කරන්න | ☐ |
| **B. Medicare** සමගින් ලියාපදිංචි වන්න | ☐ |
| **C.** බැංකු ගිණුමක් විවෘත කරන්න | ☐ |
| **D. Centrelink** සමගින් ලියාපදිංචි වන්න | ☐ |
| **E. Health Undertaking Service** හා සම්බන්ධ වන්න | ☐ |
| **F.** ඉංග්‍රීසි පංති සඳහා ලියාපදිංචි වන්න | ☐ |
| **G.** ඔබගේ දරුවන් පාසැලකට ඇතුලත් කරන්න | ☐ |
| **H.** රියදුරු බලපත්‍රයකට අයදුම් කරන්න | ☐ |

භාෂා පරිවර්තන සේවා සහ ලියකියවිලි පරිවර්තනය කිරීම සම්බන්ධ තොරතුරු සඳහා 2 වන පරිච්ඡේදයේ, *ඉංග්‍රීසි සඳහා උපකාර* බලන්න.

ඔබ හට ස්ථාපනයවීමට අදාල ගැටළු සම්බන්ධයෙන් උපකාර කල හැකි සංවිධාන සම්බන්ධ තොරතුරු සඳහා 4 වන පරිච්ඡේදයේ, *උපකාර සඳහා යායුතු තැන්* බලන්න.

## A. Tax File Number සඳහා අයදුම් කිරීම

**මෙය මුලින්ම කරන්න.** ඕස්ට්‍රේලියාවේ ආදායමක් ලැබීමට ඔබහට **Tax File Number** (TFN) තිබීම අවශ්‍යවේ. ආදායම යනු රැකියාවලින් ලැබෙන වැටුප් හෝ වේතන, රජයෙන් ලැබෙන දීමනා, සහ ඉතිරි කිරීමේ ගිණුම්වලින් ලැබෙන පොළී ඇතුළුව ආයෝජන වලින් ලැබෙන මුදල්ද ඇතුලත්වේ.

### Tax file number සඳහා අයදුම් කරන ආකාරය

ඕස්ට්‍රේලියාවේදී **Australian Taxation Office** (ATO) වෙත දුරකථනයෙන් කථාකර ඔබ වෙත අයදුම් පතක් ගෙන්වා ගත හැක. එසේ නැතිනම් ATO වෙබ් අඩවිය වෙත ගොස් දිනකට පැය 24 පුරාද, සතියකට දින 7 පුරාද TFN සඳහා අයදුම් කල හැක. ATO හෝ Centrelink කාර්යාලවලින් අයදුම් පත්‍ර ලබා ගත හැක. White Pages දුරකථන නාමාවලියෙන් දුරකථන අංක ලබා ගත හැක.

### Australian Taxation Office (ATO) හා සම්බන්ධ වන ආකාරය

| | |
|---|---|
| දුරකථන | **13 2861** |
| **TFN** සඳහා **online** අයදුම් කරන්න | Online individual TFN registration |
| පුද්ගලිකව අයදුම් කිරීම සඳහා | ATO shopfront locations |
| | Centrelink shopfront locations |
| **ATO** වෙබ් අඩවිය | www.ato.gov.au |

බදු සම්බන්ධ වැඩි විස්තර සඳහා 7 වන පරිච්ඡේදයේ, *රැකියා* බලන්න.

## B. Medicare සමගින් ලියාපදිංචිවී පුද්ගලික සෞඛ්‍යය රක්ෂණ ලබාගැනීමට සලකා බලන්න

ඕස්ට්‍රේලියානු රජය විසින් **Medicare** නැමැති වැඩසටහනක් ඔස්සේ වෛද්‍ය වියදම් පියවා ගැනීම සඳහා උපකාර ලබාදේ. රජය මගින් Pharmaceutical Benefits Scheme (PBS) යටතේ බෙහෙත් සම්බන්ධයෙන් වන වියදම් සඳහාද සහනාධාර ලබාදේ. Medicare සහ PBS පරිපාලනය කරනු ලබන්නේ Medicare Australia මගිනි.

ඔබට Medicare හා සම්බන්ධවී සෞඛ්‍යය රැකවරණ සේවා සහ වැඩසටහන්වල ප්‍රතිලාභ ක්ෂණිකව ලබා ගැනීමට සුදුසුකම් තිබිය හැක. මෙම ප්‍රතිලාභ අතර නොමිළේ ලබාගත හැකි රජයේ රෝහල් රැකවරණ, රෝහල්වලින් පිටත ලබාගන්නා රැකවරණ සඳහා සහාය සහ සහනාධාර පදනම යටතේ ලැබෙන බෙහෙත්ද ඇතුළත්ය. සියළුම සංක්‍රමණිකයන් Medicare සහාය ලබා ගැනීමට හිමිකම් නොකියන බව වැදගත් වන අතර ඔබ සුදුසුකම් ලබයිද යන්න සොයා බැලීමට Medicare හා සම්බන්ධ විය යුතුය.

Medicare සතුව **Information Kit** ඇති අතර මෙය භාෂා 19 කට පරිවර්තනය කර ඇත. තවද මෙය ඉංග්‍රීසි, බ්‍රේල් සහ සීඩී සහ කැසට් ආකාරයෙන්ද ඇත. මෙහි Medicare සහ වෙනත් රජයේ සෞඛ්‍යය සේවා විස්තර කර ඇති අතර ප්‍රතිලාභ සහ දීමනා සඳහා සුදුසුකම් ලැබීමට ඇති අවශ්‍යතාද පැහැදිලි කර දේ. ඔබගේ පළාතේ Medicare කාර්‍යාලය හෝ Migrant Resource Centre වෙත ගියවිට මෙය ඉල්ලා සිටින්න, නැතිනම් වෙබ් අඩවිය වෙත යන්න.

### Medicare සමගින් ලියාපදිංචි වන ආකාරය

Medicare සමගින් ලියාපදිංචිවීම සඳහා ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණ දින 7 සිට 10 කට පමණ පසු Medicare කාර්‍යාලයක් වෙත ඔබගේ ගමන් බලපත්‍රය, ගමන් ලියකියවිලි සහ ස්ථිර වීසා බලපත්‍රය රැගෙන යායුතුය. සියළුම ලියාපදිංචිවීමේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇතිනම්, ඔබගේ Medicare කාඩ්පත සති 3 කින් පමණ ඔබට තැපෑලෙන් ලැබෙන තෙක් භාවිතා කිරීමට ඔබගේ Medicare කාඩ්පත් අංකය ඔබට ලබා දිය හැක. අතර ඔබගේ කාඩ්පත සති 3 කට පමණ පසුව ඔබට තැපැල් කර එවනු ඇත. බොහෝ අවස්ථාවල ඔබගේ වෛද්‍ය වියදම් සඳහා ඔබ විසින් ගෙවීම් කල යුතු අතර ගෙවන ලද මුදලින් කොටසක් ඔබට නැවත ලබා දෙනු ඇත. **ඔබට හදිසියේ වෛද්‍යවරයකු හමුවීමට අවශ්‍යනම්**, ඔබට දින 7 සිට 10 තෙක් බලා නොසිට Medicare සමගින් ලියාපදිංචි විය හැකි අතර තාවකාලික අංකයක් ඉල්ලා සිටිය හැක.

**රජයේ රෝහල්වල** 'Casualty' **සහ** 'Emergency' **අංශවල දවසකට පැය** 24 **පදනමින් හදිසි ප්‍රතිකාර** ලබාගත හැක.

### Medicare හා සම්බන්ධ විය හැකි ආකාර

| | |
|---|---|
| දුරකථන | **13 2011** |
| පුද්ගලිකව | Medicare offices |
| **Medicare Information Kit**<br>(ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් ලබාගත හැක) | Information Kit |
| **Medicare වෙබ් අඩවිය** | www.medicareaustralia.gov.au |

Medicare වලට අමතරව, Medicare මගින් ආවරණය නොවන දත්, බොහෝමයක් ඇස් සහ ගිලන් රථ ප්‍රවාහනය වැනි සේවා ආවරණය කිරීම සඳහා විවිධ පුද්ගලික සෞඛ්‍යය රක්ෂණ අරමුදල් ඇත.

පුද්ගලික සෞඛ්‍යය රක්ෂණය සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා 11 පරිච්ඡේදයේ, *සෞඛ්‍යය ක්‍රමය* බලන්න.

## C. බැංකු ගිණුමක් විවෘත කරන්න

ඕස්ට්‍රේලියාවේ මිනිසුන් මුදල් තැන්පත් කරන්නේ බැංකුවක, ගොඩනැගිලි සමිති (building society) හෝ ණය සමිතියකය (credit union). වැටුප් සහ වේතන සහ රජයේ ප්‍රතිලාභ ඇතුළු බොහොමයක් ඉපයීම් කෙලින්ම ගිණුමකට ගෙවනු ලැබේ. බොහෝ කටයුතු සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානුවන් උපයෝගී කර ගන්නේ බැංකු කාඩ්පත් (bankcards) හෝ ක්‍රෙඩිට් කාඩ්පත්ය (credit cards).

**ඔබ රටට පැමිණ සති 6 ක් ඇතුලත** බැංකු, ගොඩනැගිලි සමිති හෝ ණය සමිති ගිණුමක් විවෘත කිරීම වඩා සුදුසු වන්නේ සාමාන්‍යයෙන් මෙම කාලය ඇතුලත ඔබව හඳුනා ගැනීම සඳහා අවශ්‍ය වන්නේ ගමන් බලපත්‍රය පමණක් බැවිනි. සති 6 කට පසුව ගිණුමක් ආරම්භ කිරීමට අමතර හඳුනා ගැනීමේ ලියකියවිලි අවශ්‍ය වන අතර, ඔබ සතුව ප්‍රමාණවත් ලියකියවිලි නොමැතිනම් ඔබට දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවිය හැක. ඔබ උපයන පොළී සම්බන්ධයෙන් වඩා ඉහළ අනුපාතවලින් බදු ගෙවීමෙන් වැළකීමට ඔබගේ බැංකුව වෙත ඔබගේ Tax File Number (TFN) ලබා දෙන්න.

බැංකු ගිණුමක් විවෘත කිරීම සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා පහත වෙබ් අඩවිය වෙත යන්න.

| | |
|---|---|
| **Smarter Banking – make the most of your money** | www.bankers.asn.au |

## D. Centrelink සමඟින් ලියාපදිංචි වන්න

**Centrelink** ලෙසින් හැඳින්වෙන රාජ්‍ය ආයතනය මගින් රැකියා සොයාගැනීමට උපකාර කිරීම, සමාජ ආරක්ෂණ ගෙවීම් කිරීම සහ වෙනත් උපකාර ලබාදේ. රැකියා සොයා ගැනීමට, විදේශයන්හි ලබාගත් කුසලතාවයන් මෙරටදී පිළිගැනීමට ලක්කර ගැනීමට සහ යෝග්‍ය පාඨමාලා සොයා ගැනීම සම්බන්ධ උපකාර ලබා ගැනීමට අළුතින් මෙරටට පැමිණි අයහට Centrelink සමඟින් ලියාපදිංචි විය හැක. තවද Centrelink හි Tax File Number අයදුම්පත්‍රද ඇති අතර Tax Office වෙත ඔබගේ අයදුම්පත්‍රය යොමුකිරීමටද උපකාර ලබා ගැනීම මගින් ඔබ හට ලබා ගත හැකි යම් දීමනා ඇතොත් ප්‍රමාදයකින් තොරව ලබාගත හැකි වනු ඇත. ඔබ Centrelink වෙත ගිය දිනයේ සිට දීමනා ලබා ගත හැකිවනු ඇත. ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණි දින සිට දීමනා ලබා ගැනීමට නම්, එදිනම Centrelink හා සම්බන්ධවිය යුතු අතර දින 14 ක් ඇතුලත ඔබගේ ඉල්ලීම යොමු කල යුතුය.

මානව හිතවාදී පදනම යටතේ රටට ඇතුළුවන්නන් හට Centrelink වෙතින් Crisis Payment ලබා ගැනීමට සුදුසුකම් ලබයි. මෙවැනි අය ඕස්ට්‍රේලියාවට ඇතුළුවී දින 7 ක් ඇතුලත ඉල්ලීම ඉදිරිපත් කල යුතුය නැතිනම් මෙරටට පැමිණ දින 7 ක් ඇතුලත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ අරමුණින් Centrelink හා සම්බන්ධවී දින 14 ක් ඇතුලත ඉල්ලීම ඉදිරිපත් කල යුතුය. වැඩිදුර විස්තර සඳහා 8 වන පරිච්ඡේදයේ, *සමාජ ආරක්ෂණ* බලන්න.

ඔබට දරුවන් සිටිනම්, ඔවුන් හදාවඩා ගැනීම සඳහා රජය විසින් අරමුදල් ලබාදෙන Family Assistance ගෙවීම් සඳහා ඔබ සුදුසුකම් ලැබිය හැක.

වැඩිදුර විස්තර සඳහා 2 වන පරිච්ඡේදයේ, *ඉංග්‍රීසි සඳහා උපකාර*; 3 වන පරිච්ඡේදයේ, *රැකියා*; සහ 8 වන පරිච්ඡේදයේ, *සමාජ ආරක්ෂණ* බලන්න.

### Centrelink හා සම්බන්ධ විය හැකි ආකාර

| | |
|---|---|
| දුරකථන | **13 1021** |
| ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් උපකාර සඳහා | **13 1202** |
| පුද්ගලිකව | Centrelink offices |
| **Centrelink** වෙබ් අඩවිය | www.centrelink.gov.au |
| අළුතින් පැමිණි සංක්‍රමණිකයන් හට | Have you recently moved to Australia to settle? |
| වෙනත් භාෂාවලින් තොරතුරු | Centrelink assistance – we speak your language |

## E. Health Undertaking Service සමඟින් සම්බන්ධ වන්න

Department of Immigration and Citizenship (DIAC) විදේශ කාර්යාලයක ඉල්ලීම මත ඔබ **Health Undertaking** (ෆෝරම 815) සඳහා අත්සන් කලේ නම්, ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණි පසු Health Undertaking Service ඇමතිය යුතුය.

ඔබ Health Undertaking Service ඇමතීමෙන් පසු, ඔබගේ වෛද්‍ය පරීක්ෂණ පසු විපරම් සඳහා ඔබට යා හැකි ළඟම ඇති Health Authority Clinic සම්බන්ධයෙන් ඔබට උපදෙස් ලබා දෙනු ඇත.

| | |
|---|---|
| **Health Undertaking Service** | **1800 811 334**<br>(සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9 සිට ප.ව. 4 දක්වා) |

## F. ඉංග්‍රීසි පංති සඳහා ලියාපදිංචි වන්න

**ඉංග්‍රීසියෙන් කථා කිරීම ඉතා වැදගත්** වන අතර ඔබගේ සාර්ථකත්වයට මෙය මහෝපකාරීවේ. ඔබට ඉංග්‍රීසි කථා කිරීමට නොහැකි නම්, ඔබ මෙහි පැමිණි විගස ඉංග්‍රීසි ඉගෙනීමට අපි ඔබව දැඩි ලෙස උනන්දු කරමු.

ඕස්ට්‍රේලියාවට අළුතින් පැමිණෙන අය වෙනුවෙන් **Adult Migrant English Program** (AMEP) යටතේ ඉංග්‍රීසි භාෂා පාඨමාලා ලබාදේ. අළුතින් පැමිණි අයෙකු වශයෙන්, පැය 510 තෙක් ඉංග්‍රීසි භාෂා උපකාරක පංති සඳහා ඔබට හිමිකම් තිබිය හැක. AMEP මගින් ඉගෙනීම් ආකාර ගණනාවක් ලබාදෙන බැවින් ඔබගේ රාජකාරි, පවුලේ හෝ වෙනත් වගකීම් තිබුණද, ඉංග්‍රීසිද ඉගෙන ගත හැක. වැඩිදුර විස්තර සඳහා 2 වන පරිච්ඡේදයේ, *ඉංග්‍රීසි සඳහා උපකාර* බලන්න.

## G. ඔබගේ දරුවන් පාසැලකට ඇතුලත් කරන්න

ඕස්ට්‍රේලියානු නීතිය යටතේ වයස අවුරුදු 5 සහ 15 අතර ළමුන් අනිවාර්‍යයෙන් පාසැල් යා යුතුය. ඔබගේ දරුවන්ව හැකි විගස පාසැලකට ඇතුලත් කල යුතුය. වැඩිදුර විස්තර සඳහා 10 වන පරිච්ඡේදයේ, *අධ්‍යාපනය සහ ළමා රැකවරණ* බලන්න.

## H. රියදුරු බලපත්‍රයකට අයදුම් කරන්න

ඔබට නිත්‍ය වාසී වීසා බලපත්‍රයක් ඇතිනම් සහ ඉංග්‍රීසියෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පරිවර්තිත වෙනත් රටක දැනට වලංගු රියදුරු බලපත්‍රයක් ඇතිනම්, මෙරටට පැමිණි දින සිට මාස 3 ක් යනතෙක් රියදුරු පැදවිය හැක. ඉන් පසුව ඔබට රිය පැදවීමට අවශ්‍ය නම්, ඔබ සතුව නිසි ඕස්ට්‍රේලියානු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය. මේ සඳහා දැනුම පරීක්ෂණයක් (knowledge test), ප්‍රායෝගික රිය පැදවීමේ පරීක්ෂණයක් (practical driving test) සහ ඇස් පරීක්ෂණයක් සමත් විය යුතුය. ඕස්ට්‍රේලියාවේ රියදුරු බලපත්‍ර නිකුත් කරන්නේ ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශ මගිනි.

ඔබට වෙනත් රටකින් නිකුත් කල රියදුරු බලපත්‍රයක් නැතිනම් පුහුණුවීමේ බලපත්‍රයක් (learner's permit) ලබා ගැනීම සඳහා Driver Knowledge Test සමත් විය යුතුය.

**Motor Vehicle Registry Info Hotline** **1300 654 628**

http://www.nt.gov.au/transport/mvr/licensing/index.shtml

Motor Vehicle Registry කාර්යාල පහත ලිපිනයන්හි ඇත:

Ethos House
Trower Road
CASUARINA NT 0810

18 Goyder Road
PARAP NT 0820

Shop 2B
Palm Plaza
University Avenue
PALMERSTON NT 0830

NT Government Centre
First Street
KATHERINE NT 0850

North Stuart Highway & Parsons Street
ALICE SPRINGS NT 0870

Greatorex Building
Bath Street
ALICE SPRINGS NT 0870

Transport and Works Building
John Flynn Drive
Industrial Estate
NHULUNBUY NT 0880

NT Government Centre
Peko Road
TENNANT CREEK NT 0860

Jabiru Town Plaza
Tasman Crescent
JABIRU NT 0886

Police Station
Yulara Drive
YULARA NT 0872

**කරුණාවෙන් සලකන්න:** ඕස්ට්‍රේලියාවේ රථවාහන සහ මත්ව රිය පැදවීම සම්බන්ධ දැඩි නීති ඇති අතර ඒවාට ඔබ අනුකූල විය යුතුය. වැඩිදුර විස්තර සඳහා 5 වන පරිච්ඡේදයේ, *ඕස්ට්‍රේලියානු චාරිත්‍ර සහ නීති* බලන්න.

රියදුරු බලපත්‍රයක් නිල වශයෙන් පරිවර්තනය කර ගැනීම සඳහා 2 වන පරිච්ඡේදයේ, *ඉංග්‍රීසි සඳහා උපකාර* බලන්න.

# 2. ඉංග්‍රීසි සඳහා උපකාර

## Translating and interpreting services

**භාෂා පරිවර්තනය**

**Translating and Interpreting Service (TIS National)** මගින් භාෂා සහ ප්‍රාදේශීය භාෂා (dialects)120 ක් සඳහා දුරකථන මගින් භාෂා පරිවර්තකයන් ලබා දිය හැක. ප්‍රාදේශීය දුරකථන අංක ගාස්තුවට (ජංගම දුරකථනයකින් කථා කිරීමේදී ගාස්තු වෙනස් විය හැක) ඔබට TIS National වෙත කථා කල හැක. දිනකට පැය 24 ක් පුරාද, සතියකට දින 7 ක් පුරාද TIS National සේවාව ලබා ගත හැකි අතර හදිසි තත්වයන් හිදී ඕස්ට්‍රේලියාවේ ඕනෑම තැනක සිට උපකාර කල හැක.

ඔබට රජයේ ආයතනයකට කථා කිරීමට අවශ්‍ය වුවද ඉංග්‍රීසි කථා කිරීමට හෝ අවබෝධ කර ගැනීමට නොහැකි නම් රජයේ ආයතනය විසින් TIS National හා සම්බන්ධවී ඔබට එම ආයතනය සමඟ කථා කිරීමට උපකාර කරන ලෙස ඉල්ලා සිටින්න. සාමාන්‍යයෙන්, දුරකථන භාෂා පරිවර්තකයෙකුගේ සහාය ලබා දෙන අතර, අවශ්‍යතාවය අනුව පුද්ගලිකව පැමිණෙන භාෂා පරිවර්තකයෙකුගේ සහාය පිළියෙල කර දීමට රජයේ ආයතනයකට හැකිය. භාෂා පරිවර්තකගේ වියදම රජයේ ආයතනය විසින් දැරිය යුතුය. කථා කිරීමට පෙර රජයේ ආයතනයේ කාර්යාල වේලාවන් සොයා ගැනීමට වග බලා ගන්න.

රජයේ ආයතනයේ පටිගත කර ඇති ස්වයංක්‍රීය දුරකථන ක්‍රමය අවබෝධ කර ගැනීමේ අපහසුතා ඇතිනම්, කෙළින්ම TIS National අමතන්න. ඔවුන් ඔබට උපකාර කරනු ඇති.

ඔබගේ වෛද්‍යවරයා හමුවන විට ඔබට භාෂා පරිවර්තකයෙකුගේ සහාය අවශ්‍ය නම්, දුරකථන භාෂා පරිවර්තකයෙකු සූදානම් කර ගැනීමට Doctor's Priority Line ඔස්සේ TIS National හා සම්බන්ධ කර දෙන ලෙස ඔබට ඉල්ලා සිටිය හැක. අවශ්‍ය නම්, වෛද්‍යවරයා හට අදාල ස්ථානයට පැමිණෙන භාෂා පරිවර්තකයෙකුද පිළියෙල කල හැක.

| | |
|---|---|
| **Translating and Interpreting Service (TIS National)** | **131 450** |
| **TIS National වෙබ් අඩවිය** | www.immi.gov.au/tis |

ඔබට Centrelink හා කථා කිරීමට අවශ්‍යනම් සහ භාෂා පරිවර්තන සහාය අවශ්‍යනම්, ඔබ හට Centrelink වෙත පහත අංක ඔස්සේ කෙළින්ම කථා කල හැක:

| | |
|---|---|
| **Centrelink (භාෂා පරිවර්තන සහාය සමඟින්)** | **13 1202** |
| **Centrelink වෙබ් අඩවිය** | www.centrelink.gov.au |

ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් භාෂා කථා කරන ඕස්ට්‍රේලියානු ප්‍රජාවේ සාමාජිකයන් හට භාෂා පරිවර්තන සේවාවන් සපයන, කොන්ත්‍රාත් පදනම යටතේ භාෂා පරිවර්තකයන් ලෙස කටයුතු කිරීමට උනන්දුවක් ඇති ඕස්ට්‍රේලියානු නිත්‍ය වැසියන් සහ ඕස්ට්‍රේලියානු පුරවැසියන්ගේ විමසීම් TIS National විසින් පිළිගැනේ. ඔබට ඉංග්‍රීසි ඇතුළුව අවම වශයෙන් වෙනත් එක භාෂාවක් සම්බන්ධව මනා කුසලතාවයන් ඇතිනම්, TIS National සමඟින් කොන්ත්‍රාත් ක්‍රමයට වැඩ කරන භාෂා පරිවර්තකයකු වීමට සලකා බැලීමට අයදුම් කල හැක. භාෂා පරිවර්තකයන් බඳවා ගැනීම සහ රාජකාරි කොන්දේසි සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා අංක 1300 132 621 ඔස්සේ TIS Contract Manager හා සම්බන්ධ විය හැක.

**'මට භාෂා පරිවර්තකයෙකු අවශ්‍යයි' කාඩ්පත**

ඉංග්‍රීසි භාෂාව කථා නොකරන භාෂා පරිවර්තකයන්ගේ සහාය අවශ්‍ය අයගේ භාවිතය සඳහා 'මට භාෂා පරිවර්තකයෙකු අවශ්‍යයි' කාඩ්පත TIS National මගින් සකස් කර ඇත. ජාතික භාෂා පරිවර්තකයන්ගේ සංකේතය ඇති, සාක්කුවේ දැමිය හැකි ප්‍රමාණයේ මෙම කාඩ්පත පිළියෙල කර ඇත්තේ ඉංග්‍රීසි කථා නොකරන අය රජයේ ආයතන, ප්‍රජා කණ්ඩායම් සහ ව්‍යාපාර සමඟ සම්බන්ධවීමට භාෂා පරිවර්තකයෙකුගේ සහාය ඉල්ලා සිටින විට උපකාරී වීමටය. ඉංග්‍රීසි කථා නොකරන අය විසින් තමා හට භාෂා පරිවර්තකයෙකු අවශ්‍ය බව කීමට, මෙම කාඩ්පත පෙන්වීම පමණක් ප්‍රමාණවත්වේ.

කාඩ්පතේ ඉදිරිපස ඇති පටියක ඉංග්‍රීසි කථා නොකරන අයගේ භාෂාව ලිවීමට ඉඩ සලසා ඇති අතර පසුපස TIS National හා සම්බන්ධ විය හැකි තොරතුරු ඇත. කාඩ්පත ඕස්ට්‍රේලියාවේ ඉංග්‍රීසි හැර වෙන භාෂාවක් කථා කරන, සන්නිවේදනය කිරීමට භාෂා පරිවර්තකයෙකුගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය කරන හෝ අදහස් කරන ඕනෑම අයෙකු හට භාවිතා කල හැකිය.

TIS National මගින් මෙම කාඩ්පත ප්‍රජා මට්ටමේ සිය ඉංග්‍රීසි කථා නොකරන සේවා දායකයන් හට නොමිළේ බෙදා දීමට විවිධ රජයේ ආයතනවලට, ප්‍රජා කණ්ඩායම්වලට සහ ලාභ නොලබන ආයතනවලට ලබාදේ. මෙම කාඩ්පත TIS National සේවාදායක සම්බන්ධීකරණ සහ ප්‍රවර්ධන කණ්ඩායම (TIS Client Liaison and Promotions team) වෙත tispromo@immi.gov.au ලිපිනයට ඊමේල් කිරීම මගින් ඇණවුම් කල හැක.

**සටහන:** සාමාන්‍යයෙන් TIS National ක්‍රියාත්මක වන්නේ සේවා සඳහා අයකරන පදනමකින් වන අතර පරිවර්තන ගාස්තු අදාල විය හැක.

### ඔබගේ වැදගත් ලියකියවිලි පරිවර්තනය කර ගැනීම

Department of Immigration and Citizenship (DIAC) මගින් ඔබට ඕස්ට්‍රේලියාවේ පදිංචිය සඳහා අවශ්‍ය සමහර ලියකියවිලිවල සාරාංශ/උද්ධෘත ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය නොමිලේ කර දිය හැක. මෙම ලියකියවිලි අතර උප්පැන්න සහ විවාහ සහතික, රියදුරු බලපත්‍ර, අධ්‍යාපනික සුදුසුකම් සහ රැකියා කල බවට සඳහන් ලියුම් විය හැක.

ඔබ හට පරිවර්තනයන් නොමිලේ ලබා ගැනීමට අවශ්‍යනම්, ඔබ ස්ථිර පදිංචිකරුවකු හෝ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු විය යුතු අතර ඔබ රටට ඇතුළුවීමෙන් හෝ ඔබගේ ස්ථිර නේවාසිකත්වය ප්‍රදානය කිරීමෙන් වසර 2 ක් ඇතුලත මේ සඳහා අයදුම් කල යුතුය. පරිවර්තනය සඳහාවූ ඔබගේ ඉල්ලීම **Adult Migrant English Program (AMEP)** සේවා සපයන්නෙකු මගින් (පහත බලන්න) ඉදිරිපත් කල යුතුය.

වෙනත් ලියකියවිලි පරිවර්තනය, ගාස්තු ගෙවීමේ පදනම යටතේ පිළිගත් පරිවර්තකයෙකු මගින් කරවා ගත හැක. ඔබගේ භෂාව සඳහා පිළිගත් පරිවර්තකයන්ගේ ලැයිස්තුවක් සඳහා **National Accreditation Authority for Translators and Interpreters (NAATI)** වෙබ් අඩවිය වෙත යන්න.

| | |
|---|---|
| **NAATI Hotline** | **1300 557 470** |
| **NAATI වෙබ් අඩවිය** | www.naati.com.au/ |

## වැඩිහිටියන් සඳහා ඉංග්‍රීසි ඉගෙනීම

## Adult Migrant English Program (AMEP)

ඕස්ට්‍රේලියාවේ හොඳින් ස්ථාපනය වීම සහ ඔබගේ අරමුණු ඉටුකරගැනීමට ඔබ විසින් ප්‍රථමයෙන්ම සහ වැදගත්ම වශයෙන් කලයුතු වන්නේ ඉංග්‍රීසි ඉගෙනීමයි. ඔබ සුදුසුකම් ලබයිනම්, AMEP විසින් ඔබ හට එදිනෙදා සාමාජ තත්වයන්ට මුහුණ දීමට සහ රාජකාරී කටයුතු කර ගැනීමට අවශ්‍ය මූලික ඉංග්‍රීසි භාෂා ඉගෙනීමට උපකාර ලබාදේ.

ඔබ AMEP සඳහා හිමිකම් ලබයි නම්, ඔබට පැය 510 ක් හෝ ඔබට ක්‍රියාකාරී ඉංග්‍රීසි මට්ටමට පැමිණෙන තෙක් යන දෙකෙන් එකක් ලබා ගන්නා තෙක් ඔබට ඉංග්‍රීසි ඉගෙන ගත හැක. ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර වධහිංසාවලට පත්වී සිට දුෂ්කරතාවලට මුහුණ දුන් මානව හිතවාදී පදනම යටතේ පැමිණි අයෙකු නම් හෝ ඉතාම සීමාසහිත විධිමත් පාසැල් අධ්‍යාපනයක් ලැබුවේ නම්, ඔබට වඩා වැඩි ඉංග්‍රීසි පාඩම්වලට සහභාගි වීමේ අවස්ථාව ඇත.

ඔබ AMEP සඳහා සුදුසුකම් ලබයිද යන්න දැන තීරණය කිරීමට, ඔබගේ ඉංග්‍රීසි කියවීම, කථා කිරීම, ලිවීම සහ සවන්දීම පරීක්ෂා කර බැලිය යුතුය. ඔබගේ සංක්‍රමණ අයදුම්පත්‍රයේ කොටසක් වශයෙන් විදේශයේදී ඔබගේ ඉංග්‍රීසි භාෂාව පරීක්ෂා කලේ නැතිනම්, ඔබ ඕස්ට්‍රේලියාවේ AMEP පංති සඳහා ලියාපදිංචි වන විට එය පරීක්ෂා කර බලනු ඇත.

ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණ හෝ නිත්‍ය වාසය ලැබී මාස 3 ක් ඇතුලත AMEP පංති සඳහා ලියාපදිංචි විය යුතුය. ඔබ අවුරුදු 1 ක් ඇතුලත පංති ආරම්භ කල යුතුය, නැතිනම් AMEP සමගින් ඉංග්‍රීසි ඉගෙනීමට නොහැකි විය හැක. ඔබට පවුලේ කටයුතුවලට සහභාගි වීමට හෝ රාජකාරි හෝ වෙනත් වගකීම් ඇති නිසා පංතිවලට සහභාගිවීම අපහසු නම්, ලියාපදිංචිවීමෙන් පසුව පංති පටන් ගැනීම ප්‍රමාද කල හැක.

AMEP විසින් ඉගෙනීමට විවිධ ආකාරයේ අවස්ථාවන් ලබා දෙනු ඇත. ඔබට පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව, දිවා කාලයේ, හවස් කාලයේ හෝ සති අන්තයේ පංතිවලට සහභාගි විය හැක. පංති, නගරයේ සහ ගම්බද ප්‍රදේශවල පැවැත්වේ. ඔබට නිවසේ සිට දුරස්ථ ආකාරයට හෝ නිවසට පැමිණෙන ගුරුවරයෙකු මගින් හෝ ඉංග්‍රීසි ඉගෙනිය හැක. ඔබට පාසැල් යන වයසට අඩු වයසේ ළමුන් සිටීනම්, ඔබ ගේ සේවා සපයන්නා විසින් ඔබ පංතියේ සිටින අතරතුර නොමිළේ ළමා රැකවරණ පිළියෙල කර දිය හැක.

| | |
|---|---|
| **Enquiries Line** | **131 881** |
| **AMEP website** | www.immi.gov.au/amep |
| **Settlement Services Locator** | www.immi.gov.au/living-in-australia/settle-in-australia/find-help/where-to-help/index.htm |

ඔබ AMEP සඳහා සුදුසුකම් ලබයිද යන්න සොයා බැලීමට හෝ ලියාපදිංචි වීමට කැමතිනම්, ඔබට ලඟම ඇති සේවා සපයන්නා හා සම්බන්ධ වන්න (පහත දක්වා ඇත).

**Adult Migrant English Program**
Charles Darwin University
Casuarina Campus
Ellengowan Drive
CASUARINA NT 0909
Tel: **(08) 8946 6578**
or **1800 019 119**
Fax: (08) 8946 7055

**ඉංග්‍රීසි ඉගෙනීමේ වෙනත් ආකාර**

Department of Education, Employment and Workplace Relations (DEEWR) සහ ප්‍රාන්ත/සන්තක ප්‍රදේශ මගින් පවත්වන, අරමුණු කර ගත් වැඩසටහන් මගින්ද ඉංග්‍රීසි භාෂා පංති ලබාදේ. DEEWR සතුව වැඩ කරන වයසේ (වයස අවුරුදු 15 - 64) වැඩිහිටියන් සඳහා වන රැකියා සම්බන්ධ භාෂා වැඩසටහන් 2 ක් ඇත.

පළමුවැන්න නම් **Language, Literacy and Numeracy Program (LLNP)** වන අතර මේ මගින් අඩු ලිවීමේ/කියවීමේ හෝ ඉංග්‍රීසි භාෂා නිපුණතාවය හේතුවෙන් රැකියා සොයා ගැනීමේ අපහසුතාවය ඇති අය හට පැය 800 දක්වාවූ භාෂා, ලිවීමේ/කියවීමේ සහ ගණිතමය හැකියාව සම්බන්ධ පුහුණුව ලබාදේ.

ඔබ දැනටමත් AMEP පාඨමාලාවක් හදාරා අවසාන නම් හෝ ඔබ AMEP සඳහා සුදුසුකම් නොලබන අවස්ථාවල ඔබ LLNP සඳහා සුදුසුකම් ලැබිය හැක. LLNP හි ඇත්තේ ඔබට රැකියාවක් සොයා ගැනීමට උපකාරී වන ඉංග්‍රීසි ලිවීම, කථා කිරීම, සවන්දීම, කියවීම, ගණිතය සහ වෘත්තීය ඉගෙනීම ආදී කරුණුය. මේ සඳහා සුදුසුකම් ලැබීමට, ඔබ Centrelink හි Job Seeker ලෙස ලියාපදිංචි විය යුතුය.

| | |
|---|---|
| **Centrelink** | **13 1021** |
| **ඔබ ඉංග්‍රීසි කථා නොකරයි නම්** | **13 1202** |
| **LLNP වෙබ් පිටු** | www.centrelink.gov.au/internet/internet.nsf/services/literacy_numeracy.htm |

දෙවැන්න නම් **Workplace English Language and Literacy (WELL)** වැඩසටහන වන අතර මේ මගින් ශ්‍රමිකයන්ව ඉංග්‍රීසි භාෂාව, ලිවීම/කියවීම සහ ගණිත නිපුණතාවයන් සම්බන්ධයෙන් පුහුණු කිරීම කරන සංවිධානවලට අරමුදල් සැපයේ.

| | |
|---|---|
| **WELL වැඩසටහන** | **1300 363 079** |
| **වෙබ් අඩවිය** | www.deewr.gov.au |

DEEWR මගින් **English as a Second Language for New Arrivals (ESL-NA)** වැඩසටහන යටතේ සුදුසුකම් ඇති අළුතින් පැමිණි අවුරුදු 18 ට අඩු වයසේ ශිෂ්‍යයන් හට කඩිනම් ඉංග්‍රීසි භාෂා පංති ලබාදේ. මෙම වැඩසටහන මගින් අරමුණු කරන්නේ ඉංග්‍රීසි කථා නොකරන පසුබිම් වලින් අළුතින් පැමිණෙන සිසුන්ගේ අධ්‍යාපනික අවස්ථාවන් වැඩි දියුණු කිරීමත් ඔවුන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතාවය වර්ධනය කිරීම සහ මූලික අධ්‍යාපන ක්‍රියාකාරකම්වලට සහභාගිවීම පහසු කිරීම මගින් ඔවුන්ගෙන් වඩා හොඳ ප්‍රථිපල ලබා ගැනීමත්වේ.

| | |
|---|---|
| **ESL-NA වැඩසටහන** | **1300 363 079** |
| **වෙබ් අඩවිය** | www.deewr.gov.au |

වෙනත් අධ්‍යාපනික ආයතන සහ ප්‍රජා මධ්‍යස්ථාන මගින්ද ඉංග්‍රීසි පාඨමාලා ලබාදේ. 7 වන පරිච්ඡේදයේ, *රැකියා* සහ 10 වන පරිච්ඡේදයේ, *අධ්‍යාපනය සහ ළමා රැකවරණ* යටතේ *වෘත්තීය අධ්‍යාපනය* බලන්න.

# 3. හදිසි සේවා

හදිසියකදී පහත සේවා සඳහා, දුරකථන අංක 000 අමතන්න:

- **Police** (පොලීසිය)
- **Ambulance** (ගිලන් රථ)
- **Fire Brigade** (ගිනි නිවීමේ අංශය)

000 සඳහා වන ඇමතුම් සඳහා ගාස්තු නොම්ලේය. ඔබගේ නම, ලිපිනය සහ දුරකථන අංකය (ඔබට අංකයක් ඇතිනම්) සමග ඔබට කුමන සේවාව අවශ්‍යයද යන්න දැක්වීමට සූදානමින් සිටින්න.

ඔබට ඉංග්‍රීසි කථා කිරීමට නොහැකිනම්, දුරකථන ක්‍රියාකරවන්නා හට පළමුවෙන්ම තමාට අවශ්‍ය කුමන ආකාරයේ උපකාරයක්ද යන්න ("**Police**", "**Ambulance**" හෝ "**Fire**" යන්න සරලව කියන්න) දක්වා, ඉන්පසුව ඔබගේ භාෂාව කියන්න. ඔබව කෙළින්ම Translating and Interpreting Service (TIS National) වෙත සම්බන්ධ කරනු ඇත, එබැවින් දුරකථනය විසන්ධි නොකරන්න. TIS National භාෂා පරිවර්තකයා විසින් පොලීසිය, ගිලන් රථ හෝ ගිනි නිවීමේ අංශය වෙත ඔබගේ ලිපිනය සහ වෙනත් තොරතුරු ලබා ගැනීමට සහාය ලබාදේ.

## Police

**හදිසි අවස්ථාවකදී**, දුරකථන අංක 000 අමතා "**Police**" ඉල්ලා සිටින්න.

**හදිසි නොවන** කටයුතු සඳහා, අංක 131 444 හෝ ඔබගේ පළාතේ පොලිස් ස්ථානය අමතන්න. ඔවුන්ගේ අංක White Pages දුරකථන නාමාවලියේ 'Police stations' යටතේ දක්වා ඇත. පොලිස් සේවා සඳහා අයකිරීමක් නොමැත.

ඕස්ට්‍රේලියාවේ පොලීසිය හමුදා බලකායන්ට අයත් නොවන අතර දේශපාලනමය කාර්‍ය භාරයක් ඉටු නොකරයි. ඔවුන්ගේ අරමුණ වන්නේ ප්‍රජාව තුල ජීවිත සහ දේපල ආරක්ෂා කිරීමත්, අපරාධ වැළැක්වීම සහ සොයා ගැනීමත් සහ සාමය ආරක්ෂා කිරීමත්ය. පොලීසිය ගෘහස්ථ ආරවුලක් හෝ ශාරීරික, ලිංගික හෝ මානසික ලෙස බලපෑම් කරන බවට සැකකරන අවස්ථාවල පවුල් කටයුතු සම්බන්ධයෙන් මැදිහත් විය හැක.

හදිසි නොවන පොලිස් කටයුතු සඳහා ඇමතීමට දුරකථන අංක:

| | |
|---|---|
| **Police Assistance** (පැය 24 පුරා ඇති සාමාන්‍ය පොලිස් විමසීම්) | **131 444** |
| **Darwin** | **131 444** |
| **Casuarina** | **131 444** |
| **Nightcliff** | **131 444** |
| **Palmerston** | **131 444** |
| **Alice Springs** (පැය 24 පුරා) | **8951 8888** |
| **Katherine** (පැය 24 පුරා) | **8973 8000** |
| **Nhulunbuy** | **8987 1333** |
| **Tennant Creek** (පැය 24 පුරා) | **8962 4444** |
| **Yulara** | **8956 2166** |
| **Batchelor** | **8976 0015** |
| **Daly River** | **8978 2466** |
| **Humpty Doo** | **131 444** |
| **Jabiru** | **8979 2122** |

## Ambulance

ඔබට ගිලන් රථයක් අවශ්‍ය නම්, දුරකථන අංක 000 අමතා "**Ambulance**" ඉල්ලා සිටින්න. ගිලන් රථ මගින් ඉක්මණින් රෝහල් වෙත රැගෙන යන අතර කඩිනම් වෛද්‍ය අවධානයට ලක් කරයි. ඔබ ඉංග්‍රීසි කථා කරන්නේ නැතිනම්, **දුරකථනය විසන්ධි නොකරන්න.** ඔබගේ භාෂාව කී විට භාෂා පරිවර්තකයෙකු ඔබට උපකාර කරනු ඇත.

සමහර ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශවල ඕස්ට්‍රේලියානු රජයේ විශ්‍රාම වැටුපක් ලබා ගන්නා අය හෝ Health Care Card ඇති අය (අඩු ආදායම් ඇති අය වශයෙන් තක්සේරු කර Centrelink මගින් මෙය ලබාදී ඇති අය) හට ගිලන් රථ සේවා නොමිළේ හෝ සහනදායී ගාස්තුවකට ලබා ගත හැක. ඔබට මෙම ප්‍රතිලාභ නැතිනම්, මෙම සේවාව වියදම් අධික විය හැක. එබැවින් මෙම වියදම් ආවරණය වන ලෙස ඔබ හට ගිලන් රථ සාමාජිකයෙකුවීමට හෝ පෞද්ගලික සෞඛ්‍යය රක්‍ෂණ අරමුදලකට සම්බන්ධවීමට හෝ කැමති විය හැක. 11 වන පරිච්ඡේදයේ, *සෞඛ්‍යය ක්‍රමය* බලන්න.

| | |
|---|---|
| **ගිලන් රථ සාමාජිකත්වය** | **8922 6200** |

හදිසි නොවන විමසීම් පහත අංකවලින් කල හැක:

| | |
|---|---|
| **Casuarina** | **8922 6200** |
| **Alice Springs** | **8951 6616** |
| **Katherine** | **8973 8555** |
| **Nhulunbuy** | **8987 0200** |
| **All other areas** | **8922 6200** |

## Fire Brigade

හදිසි අවස්ථාවකදී, දුරකථන අංක 000 අමතා "**Fire Brigade**" ඉල්ලා සිටින්න. ගිනි නිවන හමුදාව විසින් ගින්දර නිවා දැමීමත්, ගිනි ගන්නා ගොඩනැගිලිවලින් මිනිසුන් බේරා ගැනීමත්, ගෑස් හෝ රසායනික ද්‍රව්‍ය අනතුරුදායක වන අවස්ථාවලදී උපකාර කිරීමත් සිදු කරයි. හදිසි නොවන අවස්ථාවලදී, White Pages දුරකථන නාමාවලියේ 'Fire brigades' යටතේ දක්වා ඇති අංක භාවිතා කල හැක.

### වෙනත් හදිසි දුරකථන අංක

ඔබ පළාතේ White Pages දුරකථන නාමාවලියේ ඉදිරිපස ප්‍රයෝජනවත් හදිසි දුරකථන අංක දක්වා ඇත. එවා නම්:

| | |
|---|---|
| **Poisons Information Centre**<br>(පැය 24 පුරා ඇති දුරකථන අංකය) | **13 1126** |
| **Child Abuse Prevention Services (CAPS)**<br>(පැය 24 පුරා නොමිළේ කථා කල හැකි ආපදා දුරකථන අංකය) | **1800 688 009** |
| **NT Health Direct Medical Advice Line** (පැය 24 පුරා) | **1800 186 026** |

# 4. උපකාර සඳහා යායුතු තැන්

## අළුතින් පැමිණි සංක්‍රමණිකයන් හට ස්ථාපනය වීමේ සේවා

මෑතකදී මානව හිතවාදී පදනම යටතේ රටට පැමිණි අය හටද, අඩු ඉංග්‍රීසි නිපුණතාවය ඇති පවුල් සංක්‍රමණිකයන් හටද **Settlement Grants Program (SGP)** මගින් ස්ථාපනයවීමේ සේවා සපයන අතර Department of Immigration and Citizenship (DIAC) මගින් මේ සඳහා අරමුදල් සපයයි.

විවාහ වීම අපේක්ෂාවෙන් පැමිණෙන කාලාත්‍රයා සහ සමලිංගික සබඳතා යටතේ පැමිණෙන තාවකාලික වීසා බලපත්‍රලාභීන් ඇතුළු කුසලතා සංක්‍රමණිකයන්ගේ යැපෙන්නන් සහ ප්‍රාදේශීය පළාත්වල සිටින අඩු ඉංග්‍රීසි නිපුණතාවයක් ඇති අය හටද මෙම සේවා ලබා ගත හැක.

SGP යටතේ, අළුතින් පැමිණෙන අය හට මෙහි පැමිණි විගස ස්වශක්තියෙන් කටයුතු කරගැනීමට උපකාර කරන සහ ඕස්ට්‍රේලියානු සමාජයේ කටයුතුවලට සමානව සහභාගිවීමට උපකාර කරන ව්‍යාපෘති සපයන සංවිධානවලට අරමුදල් සපයයි. ව්‍යාපෘතිවල ක්ෂේත්‍රයන් නම්, ඕස්ට්‍රේලියානු ජීවිතයට හැඩ ගැසීම, ප්‍රජාවන් සංවර්ධනය සහ ඕස්ට්‍රේලියානු සමාජය තුළට අන්තර්ග්‍රහණයවීම ආදියවේ.

SGP මගින් අරමුදල් සපයන සංවිධානවල විස්තර ඇතුළුව SGP සම්බන්ධ වැඩි විස්තර පහත ලෙස ලබා ගත හැකඃ

| | |
|---|---|
| **Settlement Grants Program (SGP)** | www.immi.gov.au/living-in-australia/delivering-assistance/settlement-grants/ |
| **Settlement Services Locator** | www.immi.gov.au/living-in-australia/settle-in-australia/find-help/where-to-help/index.htm |

## Adult Migrant English Program (AMEP)

ඔබගේ **AMEP** ගුරුවරුන් ඔබහට ඉංග්‍රීසි ඉගැන්වීම කරනවා මෙන්ම, ඕස්ට්‍රේලියානුවන්ගේ ජීවන රටාව සහ බැංකු කටයුතු කිරීම, සාප්පු සවාරි යාම, රැකියා සඳහා අයදුම් කිරීම සහ ප්‍රජා කටයුතුවලට සහභාගි වීම වැනි දිනපතා කරන කටයුතු අවබෝධ කර ගැනීමට උපකාර ලබාදේ. ඔබගේ පංතියේ සිටින අනිත් අයද ඔබට සමාන තත්වයක සිටින බැවින්, ඔබ හා බෙදාහදා ගැනීමට ප්‍රයෝජනවත් තොරතුරු තිබිය හැක. AMEP සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා 2 වන පරිච්ඡේදයේ, *ඉංග්‍රීසි සඳහා උපදෙස්* බලන්න.

| | |
|---|---|
| **Settlement Services Locator** | www.immi.gov.au/living-in-australia/settle-in-australia/find-help/where-to-help/index.htm |

## වාර්ගික සහ ප්‍රජා සංවිධාන

ඔබට උපකාර කිරීමට හෝ ඔබට මඟ පෙන්විය හැකි අය වෙත යොමු කල හැකි බොහෝ වාර්ගික සහ ප්‍රජා සංවිධාන ඇත. තවද ඔබ සම්බන්ධවීමට කැමත්තක් දැක්විය හැකි සංගම්, සමාගම් සහ ආගමික සංවිධාන තිබිය හැක. මේවා Yellow Pages දුරකථන නාමාවලියේ ‘Clubs’ සහ ‘Organisations’ යටතේ ලැයිස්තුගත කර ඇත. ඔබගේ අවශ්‍යතාවයන්ට සහ ඔබගේ උනන්දුවට සරිලන සංගම් සහ සංවිධාන ලැයිස්තුවක් ලබාදීමට ඔබගේ Migrant Resource Centre හෝ Migrant Service Agency සතුටින් ඉදිරිපත් වනු ඇත.

**Multicultural Community Services of Central Australia (MCSCA)**
2/20 Parsons Street
ALICE SPRINGS NT 0870
Tel: **8952 8776**
Email: mcsca@alicesprings.net.au

**Multicultural Council of the Northern Territory**
Malak Shopping Centre
Shop 15, Malak Place
MALAK NT 0812
Tel: **8945 9122**
Email: mcnt@mcnt.org.au

**Anglicare**
5 Nemarluk Drive
LUDMILLA NT 0820
Tel: **8985 0000**
www.anglicare.org.au
Email: anglicare@anglicare-nt.org.au

ඔබට පහත අංකද ඇමතිය හැක:

| | |
|---|---|
| **Multicultural Council of the Northern Territory** | **89 459122** |
| **ඊමේල්:** | mcnt@mcnt.org.au |
| **Office of Multicultural Affairs** | **89 993859** |
| **ඊමේල්:** | multiculturalaffairs.dcm@nt.gov.au |

## මානව හිතවාදී පදනම යටතේ පැමිණෙන්නන් හට මූලික ස්ථාපනයවීමේ සහාය

දෙපාර්තමේන්තුවේ **Integrated Humanitarian Settlement Strategy (IHSS)** මගින් මානව හිතවාදී පදනමක් මත අළුතින් පැමිණෙන අය හට ආරම්භයේ දැඩි අවධාරණයෙන් ලබාදෙන ස්ථාපනයවීමේ සහාය සාමාන්‍යයෙන් මාස 6 කට පමණ ලබාදේ. කෙසේවුවද, අමතර අභියෝගයන්ට මුහුණ දෙන අය හට මෙම කාලය දික්කල හැක.

IHSS අරමුණු කරන්නේ මානව හිතවාදී පදනමක් මත පැමිණෙන අය හට අවශ්‍යතාවය මත පදනම්වූ විශේෂිතවූ සහාය ලබාදීම මගින් හැකි විගස ඔවුන්ව ස්වයංපෝෂිත කිරීමය. කරුණු කළමණාකරණ (case management) ප්‍රවේශයක් මගින්, මානව හිතවාදී පදනමක් මත පැමිණෙන අයගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන සහාය ලබාදීම සඳහා සැලැස්මක් සම්පාදනය කෙරේ.

IHSS මගින් අරමුදල් සපයන සංවිධාන ඇතුළුව IHSS සම්බන්ධ වැඩි විස්තර පහත ලෙස ලබා ගත හැකඃ

| | |
|---|---|
| **Integrated Humanitarian Settlement Strategy (IHSS)** | www.immi.gov.au/living-in-australia/settle-in-australia/find-help/ihss |

**Melaleuca Refugee Centre**
Torture & Trauma Survivors
Service of the NT
Shop 33
Rapid Creek Business Village
78 Tower Road
MILLNER NT 0810
Tel: 8985 3311

## තරුණ අය සඳහා සේවා

තරුණ සේවකයන් (Youth workers) හට තරුණ අය සමඟ එක්ව කටයුතු කිරීමට සුදුසුකම් ඇති අතර අත්දැකීම්ද ඇත. ඔවුන් වැඩ කරන්නේ Youth Centres, Migrant Resource Centres සහ පළාත් පාලන ආයතනවල වන අතර තරුණ අය හට ආරක්‍ෂාකාරී පරිසරයක තොරතුරු, උපකාර සහ ක්‍රියාකාරකම් සපයයි.

**The Source** යනු කොමන්වෙල්ත් රජයේ තරුණයන් සඳහා වන වෙබ් අඩවිය වන අතර මේ මගින් තරුණ අය හට තොරතුරු රාශියක් ලබාදේ.

| | |
|---|---|
| **Kids Helpline** (පැය 24 පුරා) | **1800 551 800** |
| **Kids Help** වෙබ් අඩවිය | www.kidshelp.com.au |
| **The Source** | www.thesource.gov.au |

## නීති ආධාර (Legal aid)

සෑම ප්‍රාන්තයකම සහ සන්තක ප්‍රදේශයකම මිනිසුන් හට සිය නෛතික අයිතිවාසිකම් සහ වගකීම් කියාදීමට සහ තමා හට අධිකරණ ක්‍රමය වෙත යාමට ඇති අවස්ථාව වැඩිකරදීමට කටයුතු කරන ප්‍රජා සංවිධාන ඇත.

| | |
|---|---|
| Legal Information Service (Free call) | **1800 019 343** |
| Northern Territory Legal Aid Commission | **8999 3000** |
| Darwin Community Legal Service | **8982 1111** |
| **Darwin Community Legal Service** (Free call) | **1800 812 953** |
| NT Legal Aid Commission, Alice Springs | **8951 5377** |
| NT Legal Aid Commission, Katherine | **8973 8704** |
| **Top End Women's Legal Service** | **8982 3000** |
| **Central Australia Women's Legal Service** | **8952 4055** |

## සැහැසිකම්

අපරාධ සහ නිවසේදී සිදුවන හිංසනය (ගෘහස්ථ හිංසනය - domestic violence) ඇතුළු හිංසනවලට ගොදුරු වන අය හට උපකාර කිරීම සඳහා විවිධ සේවා ඇත. වෙනත් සේවා මගින් පිරිමින්, කාන්තාවන් සහ ඔවුන්ගේ පවුල්වල බොහෝ අවස්ථාවල ගෘහස්ථ සහ පවුල් හිංසනවලට හේතු වන මානසික පීඩා පාලනය කිරීමට ඔවුන් හට උපකාර ලබාදේ. කරුණාකර 5 වන පරිච්ඡේදයේ, *ඕස්ට්‍රේලියානු චාරිත්‍ර සහ නීති* බලන්න.

| | |
|---|---|
| **Domestic Violence Counselling Service** | **8945 6200** |
| **Violence Against Women** (පැය 24 පුරා ඇති Helpline) | **1800 200 526** |
| **Violence Against Women** වෙබ් අඩවිය (ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් විස්තර) | www.australiasaysno.gov.au |
| **Child Abuse Prevention Services (CAPS)** (පැය 24 පුරා නොමිළේ ඇති Crisis Line) | **1800 688 009** |
| **CAPS** වෙබ් අඩවිය | www.childabuseprevention.com.au |

## පාරිභෝගික අයිතීන්

රජයේ ආයතන, පුද්ගලික සමාගම් සහ සමහර කර්මාන්ත සම්බන්ධ පැමිණිලි විමර්ශණය කිරීමට **Ombudsman** කාර්යාල ඇත. ඔවුන් විසින් නීති විරෝධී, අසාධාරණ හෝ වෙනසකට ලක්කරන ආකාරයට කරන සැලකිලි නැවැත්වීමට පියවර ගත හැක, නැතිනම් ඔබට වඩා සාධාරණ ප්‍රථිඵලයක් ලබාදීමට උත්සාහ කිරීමට මැදිහත් විය හැක.

**Australian Communications and Media Authority (ACMA)** මගින් රූපවාහිණිය, ගුවන් විදුලිය සහ ඉන්ටනෙට් වැනි ප්‍රචාරක සේවාවල යෝග්‍ය නොවනදේ පළකිරීම සම්බන්ධ පැමිණිලි විමර්ශණය කෙරේ. පළමුවෙන් පැමිණිල්ල කල යුත්තේ සේවාවේ හිමිකරු වෙතය. පැමිණිල්ල සමථයකට පත් නොවිණි නම්, ඔබගේ පැමිණිල්ල ACMA වෙත යොමු කල හැක. වැඩි විස්තර සඳහා පහත බලන්න:

| | |
|---|---|
| **Australian Communications and Media Authority** (නොමිලේ අංක) | **1800 226 667** |
| **TTY** (ඇසීම සහ කථා කිරීම ආබාධිත අය සඳහා) | **(03) 9963 6948** |
| **ACMA** වෙබ් අඩවිය | www.acma.gov.au |

**Australian Competition and Consumer Commission (ACCC)** මගින් මිළ, තරගකාරී නොවන සහ අසාධාරණ වෙළඳපල ක්‍රියාකාරකම් සහ නිෂ්පාදනවල ආරක්ෂාව යන ක්ෂේත්‍රවල අසාධාරණ ව්‍යාපාර පුරුදුවලට එරෙහිව පාරිභෝගිකයන් හට යම් ආරක්ෂාවක් ලබාදේ.

ඇමතිය හැකි සමහර අංක නම්:

| | |
|---|---|
| Australian Competition & Consumer Commission | 1300 302 502 |
| Commonwealth Ombudsman | 1300 362 072 |
| Advertising Standards Bureau | (02) 6262 9822 |
| Banking and Financial Services Ombudsman | 1300 780 808 |
| Credit Union Dispute Resolution Centre | 1300 780 808 |
| Financial Ombudsman Service | 1300 780 808 |
| Insurance Ombudsman Service | 1300 780 808 |
| Financial Co-operative Dispute Resolution Scheme | 1300 780 808 |
| Private Health Insurance Ombudsman | 1800 640 695 |
| Superannuation Complaints Tribunal (SCT) | 1300 780 808 |
| Telecommunications Industry Ombudsman | 1800 062 058 |

### පළාත් පාලන ආයතනය

ඔබ පළාතේ ඇති සේවා සම්බන්ධ තොරතුරු සඳහා ඔබගේ නගර ශාලාව හෝ නගර සභා කාර්යාලය සමඟද සම්බන්ධ විය හැක. White Pages දුරකථන නාමාවලියේ 'Local councils' යටතේ මේවා ලැයිස්තු ගත කර ඇත (14 වන පරිච්ඡේදයේ, *පළාත් පාලන ආයතන* බලන්න).

## The Australian Government Regional Information Service (AGRIS)

**Australian Government Regional Information Service** යනු ඕස්ට්‍රේලියානු රජයේ සේවා සහ පළාත් සහ ප්‍රාදේශීය ඕස්ට්‍රේලියා වැඩසටහන් සම්බන්ධ තොරතුරු සේවාවකි. ඒ මගින් '**Australian Government Regional Information Directory**', පළ කරන අතර පහත ආකාරයට එය ලබාගත හැක:

| | |
|---|---|
| **Australian Government Regional Information Service** | **1800 026 222** |
| **AGRIS Regional Entry Point website** | www.regionalaustralia.gov.au |

### හදිසි සහන

ඔබට හදිසියේ ආහාර, ඇඳුම්, නිවාස හෝ ගෘහභාණ්ඩ අවශ්‍ය නම්, පහත ආකාරයේ රජයේ නොව සංවිධානවලින් උපකාර ඉල්ලා සිටිය හැක:

| | |
|---|---|
| St Vincent de Paul Society | |
| **Darwin** | **8981 7783** |
| **Katherine** | **8971 0446** |
| **Palmerston** | **8932 3691** |
| The Salvation Army | |
| **Darwin** | **8927 9566** |
| **Palmerston** | **8932 2103** |

උපකාර ඉල්ලා සිටීමට බිය නොවන්න. සුදුසුකම් ලැබීමට සපුරාලිය යුතු අවශ්‍යතා තිබිය හැකි අතර විවිධ තත්වයන්හි සිටින අය හට උපකාර කිරීමට ආයතන බොහෝමයක් ඇත. ඔබගේ ප්‍රදේශයේ ඇති සංවිධාන සොයා ගැනීමට MRC හෝ පළාත් පාලන ආයතනය හා සම්බන්ධ විය හැක.

### ඥාතීන් සොයා ගැනීම

යුද්ධය, සිවිල් කෝලහාල සහ ස්වාභාවික ව්‍යාසන හේතුවෙන් වෙන්වුණු ඥතීන් සොයා දීමත් ඔවුන් හට පණිවුඩ යැවීමත් යන සේවා සපයන සේවාවක් **Australian Red Cross** මගින් ලබාදේ.

| | |
|---|---|
| **Australian Red Cross** | **8924 3900** |

## දුරකථන ආපදා උපදේශක සේවා

දිනකට පැය 24 පුරා සහ සතියකට දින 7 පුරා නොමිලේ ආපදා උපදේශක සේවා ලබාදෙන **Lifeline** ඇතුළු විවිධ දුරකථන උපදේශක සේවා ඇත. ඔබට බලාපොරොත්තු සුන්වූ හැඟීමක් තිබිය හැකි අතර කුමන අයෙකුට හෝ කථා කිරීමේ අවශ්‍යතාවය තිබිය හැක නැතිනම්, ඔවුන්ගේ විශේෂඥ මූල්‍ය, සුදු හෝ තරුණ උපදේශක සේවා පාවිච්චි කිරීමට අවශ්‍ය විය හැක.

| | |
|---|---|
| **Lifeline** (24 Hour Crisis Line) | **13 1114** |
| **Lifeline** වෙබ් අඩවිය | www.lifeline.org.au |

## විවාහ සහ වෙනත් සම්බන්ධතා

**Relationships Australia** මගින් තනි පුද්ගලයන්, යුවල්, සහ පවුල් සඳහා උපදේශක සේවා, අධ්‍යාපනය සහ මැදිහත්වීමේ සේවා ලබාදේ. ඔබගේ ආදායම් මට්ටම අනුව ඔවුන් ගාස්තු අයකරන අතර, අවශ්‍ය නම්, භාෂා පරිවර්තකයන් පිළියෙල කර දිය හැක.

| | |
|---|---|
| **Relationships Australia** | **1300 364 277** |
| **Relationships Australia website** | www.relationships.com.au |

**Men’s Line Australia** මගින් සිය පවුල් ජීවිතය හෝ සිය මූලික සම්බන්ධතා හා සම්බන්ධ ගැටළු ඇති පිරිමින් හට උපදේශක සේවා, තොරතුරු ලබාදීම සහ යොමු කිරීම් සිදු කරයි. මේ මගින් සිය සහකරුවන්, ස්වාමි පුරුෂයන් හෝ පියවරුන් ගැන කණස්සල්ලෙන් සිටින කාන්තාවන් සහ පවුලේ අය හටද සහාය සහ තොරතුරු ලබාදේ. වැඩි විස්තර සඳහා පහත තොරතුරු බලන්න**:**

| | |
|---|---|
| **Men's Line Australia** (පැය 24 පුරා දුරකථන සේවාව) | **1300 789 978** |
| **Men's Line Australia** වෙබ් අඩවිය | www.menslineaus.org.au |

## ශාරීරික වධ හිංසා සහ චිත්තවේග උපදේශක සේවා

**Melaleuca Refugee Centre Torture & Trauma Survivors Service of the NT** මගින් සරණාගතයන් සහ සරණාගත ආකාර පසුබිම්වලින් පැමිණෙන අය සඳහා උපදේශ සේවා සහ උපකාර සපයයි.

විවිධ භාෂාවලින් කථා කරන පුහුණුවලත් උපදේශකයන් සිටින අතර කාර්‍ය මණ්ඩලය විසින් කථා නොකරන භාෂා සම්බන්ධයෙන් භාෂා පරිවර්තකයන් පිළියෙල කල හැක. Melaleuca Refugee Centre Torture & Trauma Survivors Service යනු ආගමික නොවන, දේශපාලනමය වශයෙන් මධ්‍යස්ථ රහස්‍යභාවය රකින සේවාවකි.

| | |
|---|---|
| **Melaleuca Refugee Centre Torture & Trauma Survivors Service of the NT** | **8985 3311** |
| **Website** | www.mmha.org.au |

## මූල්‍ය සේවා

ඕස්ට්‍රේලියාවේ විවිධ ආකාරවල බැංකු, රක්ෂණ, superannuation සහ ආයෝජන සේවා ඔබට දැකිය හැකිවනු ඇත. මූල්‍ය සේවා අළෙවි කල හැක්කේ රජය මගින් බලයලත් ව්‍යාපාර හට පමණි. බලපත්‍රයක් නොමැතිව මූල්‍ය සේවා අළෙවි කිරීම නීතියට පටහැනිය.

| | |
|---|---|
| **Understanding Money** වෙබ් අඩවිය | www.understandingmoney.gov.au/content/ |

තමා හට මුදල් ගෙවන ලෙස ඔබ රවටා ඔබගෙන් මුදල් සොරකම් කිරීමට උත්සාහ කරන අය සිටිය හැක. මුදල් තැන්පත් කිරීම, ව්‍යාපාර ණය, රක්ෂණය, superannuation, ආයෝජනය හෝ මූල්‍ය උපදෙස් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඇතිනම් හෝ ආයෝජනයක් සම්බන්ධයෙන් ඔබට විශ්වාසයක් නැතිනම් හෝ සැක සහිත නම්, **Australian Securities and Investments Commission (ASIC)** හා සම්බන්ධවන්න.

| | |
|---|---|
| **ASIC Infoline** | **1300 300 630** |
| **ASIC** වෙබ් අඩවිය | www.fido.asic.gov.au |

### බැංකු කටයුතු

බැංකු කටයුතු සපයන්නේ බැංකු, building societies සහ credit unions මගිනි. මුදල් ලබා ගැනීමට ඔබට බැංකුවකට යා හැක, නැතිනම් **ATM** (Automatic Teller Machine) මගින් මුදල් ලබා ගැනීමට ඔබගේ බැංකු කාඩ්පත සහ ඔබගේ **PIN** (Personal Identification Number) උපයෝගී කර ගත හැක. ඔබගේ PIN අංකය ඔබගේ බැංකු කාඩ්පතේ ලිවීමෙන් වළකින්න. **ඔබගේ බැංකු කාඩ්පත කවුරුන් හෝ සොරා ගතහොත් හෝ නැතිවුවහොත් – හැකි විගස බැංකුවට දැනුම් දෙන්න.**

### ණය සහ ණය මුදල්

Loan or credit යනු ඔබ මුදල් ණයට ගෙන පසු දිනකදී පොළිය නමින් හැඳින්වෙන අමතර ගෙවීමක් සමග ගෙවීමට එකඟවීමයි. විවිධ ආකාරවල ණය වර්ග නම් පුද්ගලික ණය (personal loans), නිවාස ණය (home loans) ක්‍රෙඩිට් කාඩ්පත් සහ ණය අයිරාවන් (overdrafts) ය. ණයක මුළු වියදම තීරණය වන්නේ ණය වර්ගය, ණය ලබා දෙන්නා, ණය ගෙවීමට ගතවන කාලය, පොළී අනුපාතය සහ ගාස්තු ප්‍රමාණයන් මතය. **ඔබට ආපසු ගෙවීමට නොහැකි ණයක් ගැනීම හෝ ක්‍රෙඩිට් කාඩ්පතක් භාවිතා කිරීමෙන් වැළකී සිටීම වැදගත්වේ.**

ඔබට අසනීපවීම හෝ ඔබගේ රැකියාව අහිමිවීම නිසා ඔබගේ ණය ගෙවීමට අපහසුනම්, ඔබ ණය නැවත ගෙවන ක්‍රමය වෙනස් කිරීමට ඉල්ලා සිටිය හැක. ඔබට සහාය අවශ්‍ය නම්, පහත අංකය අමතන්න:

| | |
|---|---|
| **Centrelink's Financial Information Service** | **13 2300** |

Financial counsellors (මුල්‍ය උපදේශකයන්) විසින් රහසිගතව, අයකිරීමකින් තොරව උපදෙස් ලබාදේ. ඔබට ආසන්නයේ සිටින මුල්‍ය උපදේශකවරයෙකු සොයා ගැනීමට Australian Securities and Investments Commission (ASIC) හෝ Centrelink's Financial Information Service අමතන්න.

### රක්ෂණය

Insurance යනු යම් දෙයක් ඔබ සිතන ආකාරයට නොවුනහොත් සිදුවන මුදල් හානියෙන් ඔබව ආරක්ෂා කර ගැනීම සඳහා වාර්ෂිකව ඔබ විසින් මුදලක් ගෙවීමවේ. බොහෝ සුලබ ආකාරයේ රක්ෂණයන් නම් නිවාස රක්ෂණය, නිවාස තුල ඇති භාණ්ඩ රක්ෂණය (home contents insurance) සහ වාහන රක්ෂණයවේ. ඔබට වාහනයක් අයිති නම්, ඔබ වෙනත් අයෙකු හට හදිසි අනතුරකදී තුවාල සිදුකලහොත් එම අයව ආවරණය කිරීමට තුන්වන පාර්ශවයේ රක්ෂණයක් (third party insurance) ලබා ගැනීම අත්‍යාවශ්‍යවේ.  වඩා පුළුල් රක්ෂණ ආවරණය සලසන පූර්ණ වාහන රක්ෂණයක් (comprehensive car insurance) ලබා ගැනීමට ඔබට මනාපයක් තිබිය හැක.

## බදු උපකාර

ඕස්ට්‍රේලියානු බදු වර්ෂය (හෝ 'financial year') ඇත්තේ ජූලි 1 දින සිට ජුනි 30 දක්වාය. ඕස්ට්‍රේලියානු නීතිය යටතේ බොහෝ අය සිය tax returns සෑම වසරකම ජුනි 30 සහ ඔක්තෝබර් 31 අතර කාලය තුල Australian Tax Office සමග ගොනු කල යුතුය.

**Tax Help** අඩු ආදායම් ලබන්නන්, ජ්‍යෙෂ්ඨයන් (seniors), සංස්කෘතික සහ භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වලින් එන අය, Aboriginal හෝ Torres Strait Islander යන අයගෙන් පැවතෙන්නන් හෝ ආබාධිතයන් සඳහා ලබා ගත හැක. Tax Help යනු නොමිලේ ලබාදෙන සේවාවක් වන අතර ජූලි 1 සිට ඔක්තෝබර් 31 දක්වා ලබා ගත හැක. ඔබට හිමිකම් ඇතිද සහ ළඟම ඇති **Tax Help Centre** සොයා ගැනීම සඳහා අමතන්න:

| | |
|---|---|
| **Tax Help** | **13 2861** |

# 5. ඕස්ට්‍රේලියානු චාරිත්‍ර සහ නීති

ඕස්ට්‍රේලියානු චාරිත්‍ර සහ නීති දැනගැනීම සහ අවබෝධකර ගැනීම මගින් ඕස්ට්‍රේලියානු ජීවිතයට හුරුවීමට උපකාරීවේ.

ඕස්ට්‍රේලියාව, විවිධ සංස්කෘතික සහ වාර්ගික පසුබිම්වලින් පැමිණෙන අයගෙන් සමන්විත ඉවසිලිවන්ත, විවිධාකාර සමාජයකි. ඕස්ට්‍රේලියානුවන් ලොව දස දෙසින් පැමිණෙයි. ඕස්ට්‍රේලියානුවන්ගෙන් සියයට 45 ක් පමණ ඔවුන් හෝ ඔවුන්ගේ දෙමාපියන් පිටරටවල ඉපිදී ඇත. ඉංග්‍රීසි ජාතික භාෂාව වුවද, ඕස්ට්‍රේලියාව තුල දේශීය භාෂා ඇතුළුව භාෂා 300 ක් පමණ කථා කරයි. ඕස්ට්‍රේලියානුවන් විවිධ ආකාරයේ ආගම් අදහති.

ඕස්ට්‍රේලියාවේ, නීතියේ සීමාවන් තුල සිය සංස්කෘතික සහ ආගමික සම්ප්‍රදායන් ප්‍රකාශ කිරීමටත් පවත්වා ගෙන යාමටත් සෑම කෙනෙකුටම නිදහස ඇති අතරම ඕස්ට්‍රේලියානුවන් වශයෙන් සිටීමටද අවස්ථාව ඇත. මුලදී ඔබ හට මෙම විවිධත්වය නුපුරුදු විය හැක. කෙසේවුවද, ඔබ විවෘත නම් සහ වෙනත් මිනිසුන් සහ ඔවුන්ගේ අදහස් සහ සම්ප්‍රදායන්ට ගරු කරයි නම්, ඔබ සමාජයට හුරුවී ඔබගේ නව ජීවිතය සාර්ථකවනු ඇත.

## වගකීම් සහ වටිනාකම්

අප ඕස්ට්‍රේලියාවේ භුක්ති විඳින නිදහස සහ සමානත්වය, තම තමන් විසින් සිය යුතුකම් ඉටු කිරීම මත රඳා පවතී. ඔබ ඕස්ට්‍රේලියාවට පක්ෂපාතී වන බවටත්, අපගේ ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවට සහ එහි ඇති සාරධර්මවලට සහාය දෙන බවටත්, ඕස්ට්‍රේලියාවේ පිළිගන්නා බව, සමාජය තුල සිටින බව සහ සැමදෙනාට සාධාරණබව යන සම්ප්‍රදායන් පවත්වා ගැනීමට උපකාර වන බවටත් අපි බලාපොරොත්තු වෙමු.

ඕස්ට්‍රේලියාවේ නිදහස් සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයට පදනම සලසන්නේ අපගේ වටිනාකම් මගිනි. මේවා අතරඃ

- සමාන වටිනාකම්වලට, ගෞරවනීය බවට සහ එක් එක් අයගේ නිදහසට ගරු කිරීම
- කථා කිරීමේ නිදහස
- ආගමක් ඇදහීමේ නිදහස සහ
- සමාගම් පැවැත්වීමේ නිදහස
- පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට සහාය දීම සහ නීතියේ ආධිපත්‍යය
- නීතිය ඉදිරියේ සමානතාවය
- පිරිමින්ගේ සහ කාන්තාවන්ගේ සමානතාවය
- අවස්ථා ලබා ගැනීමේ ඇති සමානතාවය
- සාමකාමීත්වය
- අවශ්‍ය අයට ඉවසීමේ හැකියාව, අන්‍යෝන්‍ය ලෙස ගරු කිරීම සහ අනුකම්පාව වැළඳ ගැනීම පිළිබඳ සමානතාවය

## සමානතාවය සහ වෙනසකට ලක් නොකිරීම

ඔබහට ගරුසරු ලැබීමේ අයිතිය ඇති අතර අනෙක් සියළුම අයගේ අවශ්‍යතා මෙන්ම ඔබගේ අවශ්‍යතාද සාධාරණ ලෙස සැලකිල්ලට ගැනීමේ අයිතිය ඇත. එසේම, ඔබද අනෙක් අය හට ඔවුන් ඕස්ට්‍රේලියාවේ ඉපදුනද ඔබ මෙන් සංක්‍රමණය කලද ගරු කල යුතුය.

ෆෙඩරල් සහ ප්‍රාන්ත/සන්තක ප්‍රදේශවල වෙනසකට ලක් නොකිරීමේ නීති (anti-discrimination laws) යටතේ යම් අයෙකුගේ වයස, ජාතිය, උපන් රට, ගැහැණු පිරිමි බව අනුව, විවාහක අවිවාහක තත්වය අනුව, ගර්භනී බව අනුව, දේශපාලන හෝ ආගමික විශ්වාස අනුව, ආබාධිත බව හෝ ගැහැණු හෝ පිරිමි අය හට ඇති මනාපය අනුව වෙනත් අයෙකුට වඩා අඩු සැලකිල්ලකට ලක් නොකල යුතුය. මෙය රැකියා, අධ්‍යාපන, වාසස්ථාන, බඩු මිළට ගැනීම, වෛද්‍යවරුන්, බැංකු සහ හෝටල් වැනි ස්ථානවල සේවා ලබා ගැනීම ඇතුළු බොහෝ ක්ෂේත්‍රයන්ට අදාලවේ. ගැහැණුන් සහ පිරිමින් නීතිය ඉදිරියේ මෙන්ම වෙනත් සෑම කරුණක් සම්බන්ධයෙන්ම සමානය.

ඕස්ට්‍රේලියාවේ නිදහසේ කථා කිරීම සම්බන්ධ සම්ප්‍රදායක් ඇත. කෙසේවුවද, යම් පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක ජාතිය, ගැහැණු පිරිමි බව, විවාහක අවිවාහක තත්වය, ගර්භනී බව හෝ දේශපාලන හෝ ආගමික විශ්වාසයන් මත නින්දා කිරීම, ලැජ්ජාවට පත් කිරීම, වැරදි කරුවකු කිරීම, හෝ තර්ජනය කිරීම නීති විරෝධීවේ.

ඕස්ට්‍රේලියානු රජයේ **Living in Harmony** (සාමකාමීව ජීවත්වීම) වැඩසටහන මගින් ඉහතින් සඳහන් කල ඕස්ට්‍රේලියානු සාරධර්ම වන අන්‍යෝන්‍ය වගකීම සහ විවිධ පසුබිම්වලින් පැමිණෙන්නන් අතර අවබෝධය වැඩි දියුණු කෙරේ. මේ මගින් නොරුස්සන බව සම්බන්ධයෙන් කටයුතු කරයි. මෙය කරන්නේ පහත දේ මගිනි:

- පළාත් ප්‍රජා ව්‍යාපෘති
- ජාතික සංවිධාන සමග හවුල්කාරිත්වය
- මහජනයා දැනුවත් කිරීමේ උපායන්, සෑම වසරකම මාර්තු 21 දින පවත්වන Harmony Day මෙයට ඇතුලත්ය.

වැඩි විස්තර සඳහා පහත විස්තර බලන්න:

| | |
|---|---|
| **Harmony Day** | **1800 331 100** |
| **Funded community projects** | **1800 782 002** |
| **Living in Harmony** වෙබ් අඩවිය | www.harmony.gov.au |

**Human Rights Commission** මගින් මානව හිමිකම්, වෙනසකට ලක් නොකිරීම සහ සමජ යුක්තිය යන ක්ෂේත්‍රයන්හි කොමන්වෙල්ත් නීතිය පරිපාලනය කරයි.

| | |
|---|---|
| **Australian Human Rights Commission** | **1300 369 711** |
| **TTY** (ඇසීමේ සහ කථා කිරීමේ ආබාධ ඇති අය සඳහා) | **1800 620 241** |
| **HREOC** වෙබ් අඩවිය (ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් තොරතුරු සඳහා) | www.hreoc.gov.au |

## අපරාධ වැරදි

අපරාධය සාමාන්‍ය වශයෙන් හඳුන්වන්නේ නීතියට පටහැනි දඬුවම් ලැබිය හැකි හැසිරීමක් හෝ ක්‍රියාවක් වශයෙනි. ඕස්ට්‍රේලියාවේ සිටින සියළුම දෙනා සියළුම ඕස්ට්‍රේලියානු නීතිවලට අනුව කටයුතු කල යුතු බවට බලාපොරොත්තුවේ. අපරාධ වැරදි සම්බන්ධ වැඩි විස්තර සඳහා සහ ඕස්ට්‍රේලියාවේ පොලීසියේ කාර්යභාරය සඳහා, www.apmab.gov.au/pubs/PoliceGuide.html වෙත යන්න (භාෂා 8 කින් ඇත).

ඔබ අපරාධයක් ඇසින් දුටුවේ නම් හෝ පොලිසිය විසින් යම් අපරාධයක් විසඳීමට අවශ්‍ය තොරතුරු ඔබ දන්නේ නම්, පහත අංකය අමතන්න:

| | |
|---|---|
| **Crime Stoppers** | **1800 333 000** |

ආගමික සහ සංස්කෘතික පුහුණු දැනට පවතින ඕස්ට්‍රේලියානු නීතියට අනුකූල විය යුතුය. උදාහරණ වශයෙන්, ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශ නීති මගින් ලිංගික අවයව කපා දැමීම සහ නිවෙස්වල සිදුකරන හිංසනය තහනම් කර ඇත.

### ගෘහස්ථ හෝ පවුල් හිංසනය

වෙනත් රටවල මෙන්ම ඕස්ට්‍රේලියාවේද වෙනත් අයට එරෙහිව කරන හිංසා නීති විරෝධී වන අතර ඉතා දරුණු ලෙස සලකයි. මේ අතර නිවෙස තුල සහ විවාහ සම්බන්ධතා තුල සිදුවන, ගෘහස්ථ හෝ පවුල් හිංසනය ඇතුලත්වේ. පුද්ගලයෙකුගේ මෙම හැසිරීම මගින් හානියට පත්වන්නා ශාරීරික, ලිංගික හෝ මානසික හිරිහැර සහ හානිය අත්දැකීම හෝ ඒ සම්බන්ධ බියෙන් සිටීම, බලෙන් ලිංගික ක්‍රියාවල නිරතවීම, බලෙන් තනිකර තිබීම හෝ ආර්ථික වශයෙන් අහිමි කිරීම සිදු කෙරේ.

| | |
|---|---|
| **Violence Against Women** (පැය 24 පුරා Helpline) | **1800 200 526** |

**Violence Against Women** වෙබ් අඩවිය (ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් තොරතුරු සඳහා)
www.australiasaysno.gov.au

**Alice Springs – Domestic and Personal Violence Protection Unit**
Alice Springs Police Station
Parsons St
ALICE SPRINGS NT 0870
Tel: 8951 8859

**NT - Domestic and Personal Violence Protection Unit**
Nightcliff Police Station
Cnr Phoenix & Parvonia Pl
NIGHTCLIFF NT 0810
Tel: 8948 0110

**Domestic Violence Counselling Service** **8945 6200**

**Domestic Violence Legal Service**
NT Legal Aid Commission
6th Floor, 19-11 Cavenagh St
DARWIN NT 0800
Tel: 8999 3000

**Men's Line Australia** (පැය 24 පුරා දුරකථන) **1300 789 978**

**Men's Line Australia** වෙබ් අඩවිය www.menslineaus.org.au

පාසැලේදී සහ නිවසේදී ළමුන් හට ශාරීරික, ලිංගික සහ මානසික හිරිහැර කිරීම, නොසලකා හැරීම සහ හිංසනය සම්බන්ධයෙන් ළමුන්ව නීතියෙන් ආරක්ෂා කර තිබේ. මෙම අපරාධවලට වැරදිකරුවන් වෙන අයහට නීතියෙන් දඬුවම් ලබාදේ. ඔබ හට හෝ ඔබ දන්නා වෙනත් අයෙකු හට හිංසනයෙන් හෝ හිරිහැර වලින් ආරක්ෂාව අවශ්‍යනම්, ඔබ පොලීසිය හෝ **Child Abuse Prevention Service** (3 වන පරිච්ඡේදයේ, *හදිසි සේවා* බලන්න) හා සම්බන්ධ වන්න, නැතිනම් 4 වන පරිච්ඡේදයේ, *උපකාර සඳහා යා යුතු තැන්* හි ඇති සංවිධානයක ආධාර ඉල්ලා සිටින්න.

## The legal age of consent

### කැමැත්ත දීමේ නීත්‍යානුකූල වයස

**කැමැත්ත දීමේ වයස,** එනම්, නීතිය විසින් ඔබ හට තව පුද්ගලයෙකු සමඟින් ලිංගික ක්‍රියාවල යෙදීමට කැමැත්ත දිය හැකියයි නීතිය සලකන වයස, ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්තයෙන් ප්‍රාන්තයට වෙනස්වේ. කැමැත්ත දීමේ වයසට අඩු අයෙකු සමග ලිංගික ක්‍රියාවල යෙදීම නීතියට පටහැනි වන අතර මෙම නීතිය කඩන අයහට දැඩි දඬුවම් පැමිණවිය හැක.

**Northern Territory තුල ගැහැණු පිරිමි දෙපාර්ශවයටම කැමැත්ත දීමේ වයස අවුරුදු 16 කි.** මේ මගින් අඩු වයස් අය වැරදි ක්‍රියාවල යොදවා ගැනීම සම්බන්ධයෙන් නීතියේ ආරක්ෂාව ලබාදේ.

කැමැත්ත දීමේ වයස සම්බන්ධ වැඩි විස්තර වෛද්‍යවරයෙකුට කථා කිරීම මගින් හෝ ලිංගික සෞඛ්‍යය චිකිත්සා හෝ පවුල් සැලසුම් චිකිත්සා වෙතින් සොයා ගත හැක.

**Child Abuse Prevention Service (CAPS)** **1800 688 009**
(පැය 24 පුරා ඇති නොමිළේ කථා කල හැකි Crisis Line)

**CAPS** වෙබ් අඩවිය www.childabuseprevention.com.au

### ළමුන්ගේ අයිතිවාසිකම්

ළමුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාවේ දැඩි කැපකිරීමක් ඇති අතර මෙය වෙනත් සංස්කෘතීන්හි ළමුන් හදාවඩා ගැනීමේ ක්‍රමවලට වඩා වෙනස් විය හැක. ඕස්ට්‍රේලියානු නීතිය යටතේ නීති විරෝධී ලෙස දරුවන් හදාවඩා ගැනීමේ ක්‍රම අතර කලින් දරුවන් හට විවාහ වීමට බල කිරීම සහ කාන්තාවන්ගේ ලිංගේන්ද්‍රිය කපා දැමීම ඇතුලත්වේ. කලින් දරුවන් හට විවාහ වීමට බල කිරීම සඳහා හෝ කාන්තාවන්ගේ ලිංගේන්ද්‍රිය කපා දැමීම සඳහා දරුවකු විදේශයකට යැවීම හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් අයෙකුව සංවිධානය කිරීමද නීති විරෝධීවේ. මෙම පුරුදුවලට ප්‍රතිචාර දැක්වීමට සේවාවන් ඇත.

නිවසේදී සහ පාසැලේදී ළමුන්ව කායිකව, ලිංගිකව සහ මානසිකව අපවාදයට ලක් කිරීම, නොසලකා හැරීම සහ හිංසා කිරීමට ලක් කිරීමෙන් නීතිය මගින් ආරක්ෂා කරනු ලබන අතර ඔවුන්ව අධීක්ෂණය කිරීමට සහ රැකබලා ගැනීමට සාධාරණ ලෙස ප්‍රතිපාදන සැලසිය යුතුය. කායික ලෙසින් ළමුන්ව විනය ගරුක කිරීම සාමාන්‍ය වශයෙන් උනන්දු නොකරන අතර, මේ මගින් සැහෙන හානියක් සිදුවන්නේ නම් එය නීති විරෝධීය. මෙය පාසැලේදී සිදු කිරීමට ඉඩ නොමැත.

යම් පුහුණුවක් මගින් ළමයෙකු හෝ තරුණ අයෙකු හට හානි සිදුවන හෝ හානි සිදුවීමට හැකි අවස්ථාවක, ඔවුන්ගේ සුභසිද්ධිය සම්බන්ධයෙන් ළමා ආරක්ෂණ සේවා මැදිහත් විය හැක. ඔබට හෝ ඔබ දන්නා වෙනත් අයෙකු හට හිංසන හෝ අපචාරයන්ගෙන් ආරක්ෂාව අවශ්‍ය නම්, ඔබ විසින් පොලීසිය හෝ ළමා ආරක්ෂණ සේවා හා සම්බන්ධ විය යුතුය.

### ළමුන් ආරක්ෂාකිරීම

**Child Abuse Prevention Service** **1800 688 009**
**(CAPS)** (24 Hour Freecall Crisis Line)

**CAPS website** www.childabuseprevention.com.au

**කලින් දරුවන් හට විවාහ වීමට බල කිරීම**

| | |
|---|---|
| **International Social Service (ISS) Australian Branch** | **1300 657 843** |
| **ISS website** | [www.iss.org.au](http://www.iss.org.au) |

**කාන්තාවන්ගේ ප්‍රජනන සෞඛ්‍යය සහ අයිතිවාසිකම්**

කාන්තාවන්ගේ ලිංගේන්ද්‍රියන් කපා දැමීමේ පුහුණුව හෝ කාන්තාවන්ගේ ලිංගේන්ද්‍රියයන් වෙනස් කරන ආකාරයේ ඕනෑම ක්‍රියාවක් ඕස්ට්‍රේලියාවේ නීති විරෝධීවේ. තවද ළමයෙකුව මෙය සිදු කිරීමට වෙනත් රටකට යැවීම හෝ වෙනත් අයෙකු ලවා මෙය සංවිධානය කිරීම නීති විරෝධීවේ. මෙම පුහුණුව නිසා ඕස්ට්‍රේලියාවට පැමිණෙන කාන්තාවන් සහ ගැහැණු ළමුන් හට සෞඛ්‍යය ප්‍රශ්න තිබිය හැක. මෙම අයට උපකාර කිරීමට විශේෂ සේවාවන් ඇත.

| | |
|---|---|
| **NT Women’s InfoNet** | **1800 813 631** |

## රිය පැදවීම

ඕස්ට්‍රේලියාවේ වාහනයක් පැදවීමට, ඔබට රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර ඔබ පදවන වාහනය රජයේ ලියාපදිංචිවී තිබිය යුතුය. රියදුරු බලපත්‍ර සහ මෝටර් වාහන ලියාපදිංචිය සම්බන්ධයෙන් 1 වන පරිච්ඡේදයේ, *මෙහි පැමිණි විගස කල යුතු දේ* බලන්න.

මාර්ග නීතිවලට ගරු නොකිරීම හෝ කැඩීම විශාල දඩයන්ට යටත්වීමට හේතුවන අතර ඔබගේ රියදුරු බලපත්‍රය අහිමිවීම හෝ සිර දඬුවම් ලැබීම හෝ සිදුවිය හැක. රිය පදවන විට 'handsfree' කට්ටලයක් නොමැතිව ජංගම දුරකථන පාවිච්චිය නීතියට පටහැනිය.

සියළුම කාර්වල වැඩිහිටියන් සහ වයසින් වැඩි ළමුන් හට ආසනපටි ('restraints' ලෙසින්ද හැඳින්වේ) ඇත. කුඩා ළමුන් සහ බිළිඳුන් හට රජය මගින් අනුමත විශේෂ ආසන අවශ්‍යවේ. නීතියට අනුව කාරය තුල සිටින සෑම අයෙකුම ආසන පටියක් (seatbelt) හෝ නිසි ළමා ආසනයක් (child restraint) භාවිතා කල යුතු අතර, ඔබ මාර්ග අනතුරකට ලක්වුවහොත් හැකි විගස පොලීසියට දැනුම් දිය යුතුය.

සමහර ප්‍රදේශවල ළමුන් හට ආසන පටි කුලියට ලබා ගැනීමට හැක. ඔබගේ ප්‍රදේශයේ මෙම සේවාව තිබේද යන්න සොයා බැලීම සඳහා පහත අංක හා සම්බන්ධ විය හැකඃ

| | |
|---|---|
| **Kidsafe NT** | **8985 1085** |
| **Help in languages other than English** | **131 450** |
| **Website** | [www.kidsafe.com.au](http://www.kidsafe.com.au) |

වේග සීමා සහ මත්පැන් පානයෙන් පසු රිය පැදවීම සම්බන්ධ නීතිය විශේෂයෙන්ම දැඩිය. රුධිරයේ පැවතිය හැකි මත්පැන් මට්ටම ප්‍රාන්තය හෝ සන්තක ප්‍රදේශය අනුව සහ දරණ රියදුරු බලපත්‍රයේ පංතිය අනුව වෙනස්වේ. රිය පදවන අතර මත්පැන් පානය නීති විරෝධීවේ. වැඩි විස්තර සඳහා පහත විස්තර බලන්න:

| | |
|---|---|
| **Alcohol and Drug Information Service** | **1800 131 350** |
| **වෙබ් අඩවිය** | [http://www.alcohol.gov.au/](http://www.alcohol.gov.au/) |

## මත් ද්‍රව්‍ය, දුම්පානය සහ මත්පැන් පානය

මත් ද්‍රව්‍ය ලඟ තබා ගැනීම සහ භාවිතා කිරීම සම්බන්ධ නීති ගණනාවක් ඇත. මත් ද්‍රව්‍ය නීති කඩ කිරීම **දැඩි දඬුවම්** වලට හේතුවේ. ඕස්ට්‍රේලියාවේ මත් ද්‍රව්‍ය නීතිය මත් ද්‍රව්‍ය භාවිතා කරන අය සහ මත් ද්‍රව්‍ය සැපයීම, නිපදවීම සහ විකිණීම ව්‍යාපාරයක් කරගෙන සිටින අය වෙන්කර හඳුනා ගනියි.

රජයේ කාර්යාල, සෞඛ්‍යය චිකිත්සා සහ රැකියා ස්ථාන ආදී ඕස්ට්‍රේලියාවේ බොහෝ ස්ථානවල දුම් පානය තහනම් කර ඇත. බොහෝ ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශවල භෝජන ශාලා සහ සාප්පු සංකීර්ණවල දුම්බීම තහනම්ය. දුම්බීම තහනම් ස්ථානවල බොහෝ විට 'no smoking' සළකුණ ඇති අතර හැමවිටම එසේ නොවේ.

සිල්ලර කඩවල බාල වයස් කරුවෙකුට (එනම් වයස අවුරුදු 18 ට අඩු අයෙකු) දුම්කොළ නිපැයුම් විකිණීම වරදකි. බොහෝ ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශවල බාලවයස් කරුවෙකුට දුම්වැටි සැපයීම තහනම්ය.

ඕස්ට්‍රේලියාවේ මත්පැන් පානය නීත්‍යානුකූල වන අතර මෙය සමහර ස්ථානවල සහ සමහර වේලාවලදී පමණි. ඕනෑම අයෙකු විසින් වයස අවුරුදු 18 ට අඩු අයෙකුට (බාලවයස්කාරයෙකු) මත්පැන් විකිණීම හෝ සැපයීම නීතියට පටහැනිය. පුද්ගලික නිවසක් වැනි පුද්ගලික ස්ථානයක හැර වෙන කිසිම ස්ථානයක බාලවයස්කරුවෙකු මත්පැන් පානයද නීතියට පටහැනිය. සමහර පොදු ස්ථානවල මත්පැන් ගැනීම තහනම්වේ.

**Australian Drug Information Network** www.adin.com.au
(ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් තොරතුරු සඳහා)

## පරිසරය

පිරිසිදු පරිසරයක් සහ ස්වභාව ධර්මය රැකගැනීම ඕස්ට්‍රේලියානුවන් හට වැදගත්වේ. අවසර නැතිව අපිරිසිදු කිරීම, පරිසරය දූෂණය කිරීම හෝ කුණු කසළ අතහැර දැමීම නීති විරෝධීවේ. රටට ආවේණික සතුන්, මත්ස්‍යයන්, කටුව සහිත මත්ස්‍යයන් (shellfish) සහ ගස්වැල් නීති මගින් ආරක්ෂා කර ඇත. ඔබට අවසර පත්‍රයක් නොමැතිව මත්ස්‍යයන් ඇල්ලීම, ගස්වැල් හෝ කටුව සහිත මත්ස්‍යයන් රැස් කිරීම නොකරන්න. මීට අමතරව, National Parks (ජාතික වනෝද්‍යාන) වැනසීමෙන් ආරක්ෂා කිරීම සඳහා විශේෂ නීති ඇත.

## ශබ්දය

ඕස්ට්‍රේලියානුවන්ව අධික ශබ්දයෙන් ආරක්ෂා කිරීමට නීති ඇත. මෙම රෙගුලාසි ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශ අනුවද, අදාල ප්‍රදේශය වාණිජ, කාර්මික හෝ නේවාසික ලෙස කාණ්ඩ කර ඇතිද යන්න අනුව වෙනස්වේ. සාමාන්‍ය වශයෙන් අසල්වාසීන් ඉඳහිට ඇතිවන ශබ්ද ඉවසන අතර නිතර සිදුවුවහොත් හෝ එසේත් නැතිනම් රාත්‍රියේදී සිදුවුවහොත්, පළාත් පාලන, ප්‍රාන්ත හෝ සන්තක ප්‍රදේශ පරිසර අධිකාරියට හෝ පොලීසියට පැමිණිලි කල හැක.

## සතුන්

ඕස්ට්‍රේලියාවේ සතුන් හට වධහිංසා කිරීම හෝ නොසලකා හැරීම සම්බන්ධයෙන් ආරක්ෂා කිරීමට නීති ඇත. සිය පසුපස ගෙවත්තේ සතුන් මැරීම තහනම්ය. සතුන් සහ කුරුල්ලන් හට වැරදි ලෙස සලකන අයහට දඩ නියම කිරීම හෝ සිරගත කිරීම කල හැක. කුමන සතුන් නිවසේ ඇති කල හැකිද යන්න සම්බන්ධව පළාතේ නීති ඇත. බල්ලන් වැනි නිවසේ ඇතිකරන සුරතල් සතුන් පළාත් පාලන ආයතනයෙහි ලියාපදිංචි කල යුතුය. ඔබගේ White Pages දුරකථන නාමාවලියේ 'Government' කොටසේ 'Dog' යටතේ බලන්න.

සුරතලට ඇතිකරන සතෙක් ඔබට සිටීනම්, කෑම ලබාදීම සහ පිරිසිදුවට තබා ගැනීම ඇතුළුව නිසි ලෙස රැකබලා ගැනීම ඔබගේ වගකීමවේ. බොහෝ සුරතල් සතුන් හට නිතිපතා එන්නත් ලබාදීම අවශ්‍ය වන අතර අසනීප හෝ තුවාලවූ අවස්ථාවල පශු වෛද්‍යවරයෙකු වෙතින් ප්‍රතිකාර ලබා ගත යුතුය. සුරතල් සතුන් de-sex (නිර්ලිංග) කිරීම හෝ micro-chip දැමීම ඕස්ට්‍රේලියාවේදී අපේක්ෂා කරන අතර මේවා සුරතල් සතුන්ගේ අයිතිකරුවන්ගේ වගකීම්වේ. ඔබගේ පළාතේ පශු වෛද්‍යවරයා හෝ **Royal Society for the Prevention of Cruelty to Animals (RSPCA)** වෙතින් වැඩි විස්තර ලබා ගත හැක.

**Royal Society for the Prevention of Cruelty to Animals (RSPCA)** **8984 3795**

**RSPCA e-mail** DarwinRSPCA@bigpond.com

**RSPCA වෙබ් අඩවිය** www.rspca.org.au

## මිනිසුන් හමුවීම සහ කථාබහ

යම් අයෙකු පළමු වතාවට හමුවන විට, ඕස්ට්‍රේලියානු ක්‍රමයට අනුව අනෙක් අයගේ දකුණු අතට සිය දකුණු අත දිගු කර ආචාර කිරීම සාමාන්‍ය ක්‍රමයවේ. එකිනෙකා හඳුනන්නේ නැති අවස්ථාවල හමුවීමකදී සාමාන්‍යයෙන් සිප වැළඳ ගැනීම සිදු නොකරයි.

බොහෝ ඕස්ට්‍රේලියානුවන් අන් අය සමග කථා කරන විට ඇස් දෙස බලාගෙන කථා කරන අතර, මෙය ඔවුනට ගරු කිරීමක් ලෙසත් තමා අන් අයට සවන් දෙන බවට කරන ඉඟියක් ලෙසත් සැලකේ. කෙසේවුවද සමහර අය මේ මගින් අපහසුතාවයට පත්විය හැක.

අළුතින් පුද්ගලයෙකු හමුවූ විට තමාගේ වයස, විවාහය, ළමුන් හෝ මුදල් සම්බන්ධ ප්‍රශ්න අසනවාට බොහෝ ඕස්ට්‍රේලියානුවන් අකමැතිය.

තමාව යම් අයෙකුව පළමු නමින් හඳුන්වා දී නොමැති අවස්ථාවක හෝ තමාට පළමු නමින් කථා කරන ලෙස ඉල්ලා සිට අවස්ථාවක හැර, සාමාන්‍යයෙන් පුද්ගලයාගේ පදවි නාමය සහ වාසගමින් ඇමතීම යෝග්‍යවේ (උදා. Mr Wong, Ms Smith, Mrs Brown, Dr Lee). රැකියා ස්ථානවල සහ මිතුරන් අතරේ සාමාන්‍යයෙන් ඕස්ට්‍රේලියානුවන් එකිනෙකාට කථා කරන්නේ මුල් නමිනි.

## ආචාරශීලී හැසිරීම

ඕස්ට්‍රේලියානුවන් සාමාන්‍යයෙන් යම් දෙයක් හෝ සේවාවක් ඉල්ලා සිටින විට “**please**” යන්න සඳහන් කරන අතර යම් අයෙකු උපකාර කරන විට හෝ යමක් ලබා දුන් විට “**thank you**” යන්න සඳහන් කරයි. Please හෝ thank you යන්න සඳහන් නොකිරීම අචාරශීලී නොවන හැසිරීමක් ලෙස දකියි.

ඕස්ට්‍රේලියානුවන් සාමාන්‍යයෙන් යම් අයෙකුගේ අවධානය ලබා ගැනීමට “**excuse me**” යන්න භාවිතා කරන අතර හදිසියේ අන් අයෙකුගේ ඇඟේ හැපුණු විට “**sorry**” යන්න භාවිතා කරයි. ඕස්ට්‍රේලියානුවන් පොදු තැනකදී හෝ වෙනත් අයෙකුගේ නිවසකදී රාම තෙල් අරින විට (burp or belch) “excuse me” හෝ “pardon me” යන්න සඳහන් කරයි.

සැම විටම රැස්වීම් හෝ හමුවීම් වලට යනවිට වේලාවට යා යුතුය. ඔබ ප්‍රමාද වන බව ඔබට හැගේ නම්, අදාල පුද්ගලයා හා සම්බන්ධවී ඒ බව එම පුද්ගලයාට දැනුම් දෙන්න උත්සාහ ගන්න. වෘත්තීය හමුවීම්වලදී ඔබ ප්‍රමාද වුවහොත් හෝ අදාල පුද්ගලයාට කලින් දැනුම් නොදී හමුවීමට නොගියහොත්, ඔබ ගාස්තු ගෙවීමට යටත් විය හැකි බැවින් මෙය වැදගත්වේ. සැම විටම ප්‍රමාද වන පුද්ගලයෙකු විශ්වාස තැබිය නොහැකි අයෙකු ලෙස සැලකිය හැක.

ඔබට 'RSVP' යන අකුරු සහ දිනය සහිතව ලිඛිත ආරාධනාවක් ලැබිය හැක. මෙයින් අදහස් වන්නේ ඔබට ආරාධනාව එවන අය ඔබ එම අවස්ථාවට පැමිණෙන හෝ නොපැමිණෙන බව දැන ගැනීමට කැමති බවයි. මෙවැනි අවස්ථාවක, දක්වා ඇති දිනට පෙර පිළිතුරු යැවීම ආචාරශීලීවේ.

බොහෝ ඕස්ට්‍රේලියානුවන් නහය සුරන්නේ ලේන්සුවකට හෝ ටිෂූ කඩදාසියකට මිස පදික වේදිකාවට නොවේ. කෙළ ගැසීම සම්බන්ධයෙනුත් මෙය සත්‍යය. ඔබ කිවිසුම් යවන විට බොහෝ අය “bless you” යන්න සඳහන් කරයි - මෙහි ආගමික අදහසක් නැත.

සමහර හැසිරීම් ආචාරශීලී නොවනවා පමණක් නොව නීතියටද පටහැනි බව දැන ගැනීම වැදගත්වේ. ප්‍රසිද්ධියේ පරුෂ වචන කීම, පෝලිම්වල තල්ලු කිරීම, ප්‍රසිද්ධ හෝ පුද්ගලික වැසිකිළියක් නොවන තැනක මුත්‍රා හෝ මළ පහ කිරීම ආදිය උදාහරණවේ.

## ඇඳුම් පැළඳුම්

ඕස්ට්‍රේලියාව විවාධාකාර සමාජයකි. මෙම විවිධත්වය මිනිසුන් අඳින ඇඳුම්වලින් නිරූපණයවේ. බොහෝ අය සමාජ තත්වය හෝ කාලගුණය අනුව නිදහස් හෝ අවිධිමත් ආකාරයට ඇඳුම් ඇඳීමට නැඹුරුවක් ඇත. බොහෝ අය විශේෂ අවස්ථාවලදී ආගමික හෝ චාරිත්‍රානුකූල වන සම්ප්‍රදායික ඇඳුම් පැළඳීමට තෝරා ගනී.

රැකියා අවස්ථා සහ සමහර ස්ථානවල නියමිත ඇඳුම් ඇඳීමේ අවශ්‍යතාවය තිබුණද, ඇඳුම් සම්බන්ධයෙන් ඇති නීති සහ රීතීන් සීමිතය. උදාහරණ ලෙස ඉදිකිරීම් කරන ස්ථානවල ආරක්ෂක හේතු නිසා ආරක්ෂක පාවහන් (safety boots) සහ ශක්තිමත් හිස්වැසුම් (hard hats) පැළඳිය යුතු අතර පොලිස්, හමුදා සහ සමහර ව්‍යාපාරවල කාර්ය මණ්ඩල විසින් නිල ඇඳුම් පැළඳිය යුතුය.

ක්‍රීඩා සමාජ (Clubs), සිනමා ශාලා සහ වෙනත් සමහර ස්ථානවලට පැමිණෙන අය ක්‍රමානුකූල, පිරිසිදු ඇඳුම් සහ නිසි පාවහන් පැළඳිය යුතුය.

සමහර ඇඳුම් විලාසිතා මතභේදයට තුඩුදෙන හෝ අපහාසාත්මක ලෙස ඔබට සිතෙනු ඇත. උදාහරණ වශයෙන්, සමහර කාන්තාවන් සිය සිරුර බොහෝසේ නිරාවරණය කර ඇඳුම් පළඳී. ඔබ කලින් පැමිණි රටෙහි සම්මතයන්ට අනුව ඔවුන්ව විනිශ්චය නොකල යුතුය. ඕස්ට්‍රේලියාවේ කාන්තාවකගේ ඇඳුම් විලාසිතාව කුමක් වුවද, ඔවුන් හට අඩු සදාචාරාත්මක වටිනාකම් ඇති බවට හෝ පිරිමින්ගේ අවධානය ලක්කර ගැනීමට උත්සාහ කරන බවට හෝ අර්ථ නිරූපණය නොකල යුතුය.

## පොදු ඕස්ට්‍රේලියානු යෙදුම්

ඕස්ට්‍රේලියාවට අළුතින් පැමිණෙන අය හට බොහෝ පොදු ඕස්ට්‍රේලියානු යෙදුම් හෝ ව්‍යවහාර (slang) අමුතු ලෙස දැකිය හැක. යම් ප්‍රකාශයක අර්ථය ඔබට නොතේරේ නම්, කිසිවෙකුගෙන් හෝ ඇසිය හැක. සමහර පොදු උදාහරණ නම්:

- **Bring a plate** – ඔබට සමාජ හෝ රැකියා උත්සව අවස්ථාවකට ආරාධනා කර, "bring a plate" යන්න සඳහන් කල විට, මෙයින් අදහස් වන්නේ අනිත් අය සමග බෙදාහදාගෙන කෑමට ආහාර ඇතුලත් දීසියක් රැගෙන එන ලෙසයි.
- **BYO** – මෙයින් අදහස් වන්නේ '**B**ring **Y**our **O**wn' drink නැතිනම් ඔබගේ පානය රැගෙන එන්න යන්නය. මෙයට මත්පැන්, යුෂ වරග, සිසිල් බීම වරග හෝ වතුර ඇතුලත් විය හැක. සමහර ආපනශාලා BYO වේ. වීදුරු සැපයීම සහ පිරිසිදු කිරීමට 'corkage' ලෙසින් නම් කරන ගාස්තුවක් තිබුණද, ඔබගේ බෝතල්වල ඇති වයින් රැගෙන යා හැක.

- **Fortnight** – 'Fortnight' යනු සති දෙකක කාලයකි. බොහෝ ඕස්ට්‍රේලියානුවන් හට වැටුප් හෝ වේතන ලැබෙන්නේ සති දෙකකට වරක්ය.

# 6. නිවාස

## පුද්ගලික නිවාසයක් හෝ තට්ටු නිවාසයක් කුලියට ගැනීම

නිවසක් හෝ තට්ටු නිවසක් කුලී නිවෙස් හිමියන් වෙනුවෙන් කටයුතු කරන real estate agent කෙනෙකු මගින් කුලියට ගැනීම සාමාන්‍ය වශයෙන් සිදුවන අතර කෙළින්ම කුලී නිවෙස් හිමියකුගෙන් හෝ කුලියට ගත හැක. කුලී නිවෙස් සම්බන්ධ දැන්වීම් විශේෂයෙන් බදාදා සහ සෙනසුරාදා දිනවල පුවත්පත්වල‘To let’ සහ ‘Accommodation vacant’ යන කොටස්වල පළකෙරේ. ඔබ හට real estate agent කාර්යාල වෙත ගෙස් ඔවුන්ගේ හිස්වී ඇති කුලී නිවෙස් ලැයිස්තු ලබා දෙන ලෙස ඉල්ලා සිටිය හැක. **ඕස්ට්‍රේලියාවේ නිවාස සොයා ගැනීම දුෂ්කර විය හැකි අතර කුලිය වියදම් අධික විය හැක.**

ඕස්ට්‍රේලියාවේදී, කුලී නිවෙස් කරු සහ කුලී නිවෙස් හිමිකරු අතර කොන්දේසි ඉතා පහසුවෙන් හඳුනා ගත හැකි ලිඛිත ගිවිසුමක් තිබීම වඩා යෝග්‍යවේ. 'lease' හෝ 'residential tenancy agreement' එකක් යනු කුලී නිවෙස් කරු සහ කුලී නිවෙස් හිමිකරු අතර ඇතිකරගත් ලිඛිත ගිවිසුමක් වන අතර සාමාන්‍යයෙන් මෙය මාස 6 හෝ 12 ක් සඳහා වුවකි. කෙසේ වුවද, ඔබ ගිවිසුමට අත්සන් කිරීමට පෙර කුලී නිවෙස් හිමියා හෝ නියෝජිතයා සමඟ මෙම කාලය සාකච්ඡා කර තීරණය කර ගත හැක. නිශ්චිත කාලය අවසානයේදී, බද්ද නැවත අළුත් කර ගැනීමට ඔබට හැකිවනු ඇත.

එකඟවූ කාලයට පෙර බදු ගිවිසුමක් කඩ කලහොත් අමතර ගෙවීම් සිදුකල යුතු බැවින්, ඔබට සිටීමට හැකි කාලයට වඩා දිගු කාලයකට බද්දකට අත්සන් නොකරන්න. **බදු ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු ඔබ එයට නීතියෙන් බැඳෙන නිසා, කුලී නිවෙස පරීක්ෂා කර ලියවිල්ලේ ඇති සියළුම කොන්දේසි සම්පූර්ණ ලෙස අවබෝධ කර නොගෙන, බදු ගිවිසුමක් අත්සන් නොකරන්න.** වැඩිදුර විස්තර සඳහා, පහත ඇති *කුලී නිවෙස් කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්* බලන්න.

බදු ගිවිසුමක් ආරම්භයේදී සාමාන්‍යයෙන් ඔබට මාසයක කුලිය කල් ඇතිව ගෙවීමට සිදුවන අතර rental bond ද ගෙවීමට සිදුවේ. Rental bond යනු කුලී නිවෙස් හිමිකරු වෙත ගෙවන තැන්පතුවක් වන අතර සාමාන්‍යයෙන් මෙය මාසයක කුලියට වඩා වැඩි නොවිය යුතුය.  කුලී නිවෙස් හිමිකරු හෝ නියෝජිතයා විසින් මෙම ඇපකරය Residential Tenancies Bond Authority වෙත තැන්පත් කල යුතුය.

ඔබ කුලී නිවෙසට පැමිණීමට පෙර, 'condition report' ලෙස හඳුන්වන ලියවිල්ලක කුලී නිවෙසේ තත්වය වාර්තා කර ඔබ සහ කුලී නිවෙස් හිමියා හෝ ඔහුගේ නියෝජිතයා විසින් සම්පූර්ණ කල යුතුය. මෙම ලියවිල්ල මගින් ඔබ කුලී නිවසින් ඉවත්ව යනවිට ඇතිවිය හැකි එකඟ නොවීම් මඟ හැර ගත හැකි වන්නේ ඔබ කුලී නිවෙසට පැමිණෙන විට තිබුණු අලාභහානි මේ වනවිටත් එහි සඳහන් කර ඇති බැවිනි. ඔබ කුලී නිවෙසක් හැරයාමේදී, ඔබ කිසිදු කුලියක් හිඟ නොමැතිනම් සහ කුලී නිවෙස අලාභ හානි වලින් තොරව පිරිසිදුවට ඇතිනම්, ඔබ විසින් තබන ලද ඇප මුදල නැවත ලබා ගත හැක.

ඔබගේ කුලී ඇපකරය සහ පළමු මස කුලිය කල් ඇතිව ගෙවීම සම්බන්ධයෙන් මුදල් උපකාර ලබා ගැනීමට ඔබ හට හිමිකම් තිබිය හැක. ඔබගේ කුලිය ගෙවීම සඳහා **Rent Assistance** සඳහාද ඔබ සුදුසුකම් ලැබිය හැක. මෙම ගෙවීම් සම්බන්ධ තොරතුරු Centrelink වෙතින් ලබා ගත හැක.

## කුලී නිවෙස්කරුගේ අයිතිවාසිකම් සහ වගකීම්

පුද්ගලික නිවාස කුලියට ගන්නා විට කුලී නිවෙස්කරුගේ අයිතිවාසිකම් සහ වගකීම් සම්බන්ධ විස්තර සඳහා හෝ අදාල විස්තර පත්‍රිකාව ලබා ගැනීම සඳහා පහත විස්තර බලන්න:

| | |
|---|---|
| **Consumer & Business Affairs** | **1800 019 319** |
| **Website** | www.caba.nt.gov.au |

## නිවෙසක් හෝ තට්ටු නිවෙසක් මිළට ගැනීම

විකිණීමට ඇති නිවාස සහ තට්ටු නිවාස සම්බන්ධ දැන්වීම් සාමාන්‍යයෙන් පුවත් පත්වල පළකරන අතර අන්තර්ජාලයේද පළකරනු ඇත. Real estate ageny මගින් විකිණීමට ඇති නිවාස සම්බන්ධයෙන් ලැයිස්තු ඔවුන්ගෙන්ද ලබා ගත හැක. ඔබ ඕස්ට්‍රේලියාවේදී නිවසක් ප්‍රථම වතාවට මිළට ගන්නේ නම්, 'First Home Owner Grant' යන ඕස්ට්‍රේලියානු රජය මගින් ලබාදෙන ප්‍රදානයකට හිමිකම් කිව හැක.

ඔබට නිවෙසක් මිළට ගැනීමට මුදල් ණයට ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔබගේ බැංකුව හෝ වෙනත් මුල්‍ය ආයතනය හා සම්බන්ධවන්න. ඕස්ට්‍රේලියාවේදි නිවසක් මිළට ගන්නා විට, ඔප්පු පරීක්ෂා කර ගැනීමට සහ ලියවිලි පිළියෙල කර ගැනීමට සාමාන්‍යයෙන් සොලිසිටර්වරයකු හෝ නොතාරිස්වරයකු (conveyancer) ගේ සහාය ලබා ගනී. **සියළුම කොන්දේසි හොඳින් අවබෝධ කර නොගෙන කිසිම ගිවිසුමකට අත්සන් නොකරන්න.**

## රජයේ නිවාස

ඔබ දීමනා ලබා ගන්නේනම් හෝ අඩු ආදායමක් ලබන අයෙකු නම්, ඔබට රජයේ නිවාස කුලියට ලබා ගැනීමට අයදුම් කල හැක. රජයේ නිවාස සඳහා බලා සිටීමේ කාලය ඔබ ජීවත්වීමට කැමති ප්‍රදේශය, ඔබගේ නිවසේ සිටින සංඛ්‍යාව සහ ඔබගේ නිවාස අවශ්‍යතාවයේ හදිසි බව අනුව තීරණයවේ. රජයේ නිවාස සම්බන්ධ විස්තර සඳහා, පහත විස්තර බලන්න:

| | |
|---|---|
| **Territory Housing** | **8999 8427** |

**Casuarina**
Ethos House Trower Rd
CASUARINA NT 0810
Tel: **8922 5526**

**Darwin**
Construction House
Cnr Mitchell & Briggs Streets
DARWIN NT 0800
Tel: **8999 8814**

**Alice Springs**
Housing & Local Government Building
Cnr Leichardt & Gregory Terrace
ALICE SPRINGS NT 0870
Tel: **8951 5344**

**Palmerston**
Highway House
Chung Wah Terrace
PALMERSTON NT 0830
Tel: **8999 4602**

**Katherine**
NT Government Centre
First St
KATHERINE NT 0850
Tel: **8973 8536**

**Tennant Creek**
Government Building
Peko Rd
TENNANT CREEK NT 0860
Tel: **8962 4565**

**Nhulunbuy**
Shop 2 Arnhem House
Endeavour Square Arnhem Rd
NHULUNBUY NT 0880
Tel: **8987 0534**

## අත්‍යාවශ්‍ය ගෘහ සේවා

ඔබ නිවෙසක් කුලියට ගත්තද මිළට ගත්තද, ඔබගේ නිවෙසට සම්බන්ධ කල යුතු ගෘහ සේවා රාශියක් ඇත. ඔබ අළුත් නිවෙසකට යාමට දින කිහිපයකට පෙර මෙම සේවා සපයන්නන් හට දැනුම් දීමට උත්සාහ ගන්න.

ගෘහ සේවා සම්බන්ධ ගිවිසුම්වලට අත්සන් කිරීමට පෙර, ඔබගේ ජීවන රටාවනට එම සේවාවන් අවශ්‍යයද යන්න සොයා බලන්න. සමහර අවස්ථාවල තමුන් තාවකාලික නිවාසවල ජීවත්වුවද, විදුලි බලය ලබා ගැනීම සඳහා වසර 3 ක ගිවිසුම්වලට ඇතුළුවූ අවස්ථා ඇත. ගෘහ සේවා සඳහා සේවා සපයන්නන් සමඟ ගිවිසුම් අත්සන් කිරීමට පෙර එකඟතාවයේ ඇති කොන්දේසි අවබෝධ කර ගැනීම වැදගත්වේ.

**විදුලිබලය, ගෑස් සහ වතුර**

| | |
|---|---|
| **Power and Water** | **1800 245 092** |
| **Emergencies** | **1800 245 090** |
| **Origin Energy** | www.originenergy.com.au |
| **Natural Gas** | **13 2461** |
| **LP Gas** | **13 2462** |
| **Gas Appliance Repairs & Installation** | **13 2774** |
| **Power and Water** | **1800 245 092** |
| | www.powerwater.com.au |

**දුරකථන**

රජයට අර්ධ වශයෙන් අයත් Telstra ඇතුළු දුරකථන සමාගම් Yellow Pages දුරකථන නාමාවලියේ 'Mobile telephones and accessories' සහ 'Telephones – long distance' යටතේ ලැයිස්තු ගත කර ඇත.

මේවායින් සමහරක් සේවා සඳහා සම්බන්ධ කිරීමේ ගාස්තුවක් අවශ්‍ය විය හැක. ඔවුන්ගේ ගිවිසුම අත්සන් කිරීමට පෙර කරුණාකර සේවා සපයන්නන්ගෙන් විස්තර සොයා දැනගන්න. ඔවුන්ගේ සේවා සඳහා යන වියදම් දක්වා නිතිපතා ඔබ හට බිල්පතක් එවනු ඇත. ඔබ ගෙවිය යුතු මුදල නිසි දිනට ගෙවිය නොහැකි නම් හෝ දිගු කාල පරතර වලින් ලැබෙන ගණන් වැඩි බිල් පත් වලට වඩා කෙටි කාල පරතර වලින් ලැබෙන ගණන් අඩු බිල් පත් ලැබීමට ඔබ කැමති නම්, කෙළින්ම ඔවුන් සමඟ කථා කරන්න. වෙනත් රටවලට ගන්නා දුරකථන ඇමතුම් ඉතා වියදම් අධික විය හැකි අතර බිල ඉක්මණින් ඉහල යාමට හේතු විය හැක. ඔබගේ විදේශ දුරකථන ඇමතුම් ප්‍රවේශමෙන් බැලිය යුතුය නැතිනම් කලින් ගෙවිය හැකි ඇමතුම් කාඩ්පත් (pre-paid call card) (නිව්ස් ඒජන්සි මගින් ලබා ගත හැක) භාවිතා කල යුතුය.

ඕස්ට්‍රේලියාවේ සිටින බොහෝ අය සතුව ජංගම දුරකථනයක් ඇත. කෙසේ වුවද, ජංගම දුරකථනවලින් ලබා ගන්නා ඇමතුම් ඉතා වියදම් අධික විය හැක. ජංගම දුරකථන භාවිතාකර ප්‍රාන්ත අතර සහ ජාත්‍යන්තරව ලබා ගන්නා ඇමතුම් ඇතුළු දුරකථන ඇමතුම් සඳහා සාමාන්‍යයෙන් මිනිත්තු හෝ තත්පර 30 ඒකක ලෙස ගණන් ගැනේ. **ඔබ ජංගම දුරකථනයක් මිළට ගැනීමට තීරණය කිරීමට පෙර මූල්‍යමය සහ නීතිමය වශයෙන් ඇති වගකීම් අවබෝධ කර ගැනීමට සැලකිලිමත් විය යුතුය.**

**Telecommunications Industry Ombudsman** විසින් පාරිභෝගික ගැටළු ගණනාවක් ඇතුලත් තොරතුරු පත්‍රිකා ගණනාවක් සකස් කර ඇති අතර ඒවා ඉංග්‍රීසි භාෂාවෙන් සහ වෙනත් භාෂා ගණනාවකින් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා වෙබ් අඩවිය වෙත යන්න නැතිනම් පහත ආකාරයට සම්බන්ධවන්න:

| | |
|---|---|
| **Telecommunications Industry Ombudsman** | **1800 062 058** |
| **වෙබ් අඩවිය** | www.tio.com.au/publications/FactSheets.htm |

# 7. රැකියා

## රැකියා සෙවීම

ඕස්ට්‍රේලියාවේ රැකියා වෙළඳපොල ඉතාම තරඟකාරී විය හැකිය. අළුතින් පැමිණෙන අයෙකු හට කොතරම් ඉක්මණින් රැකියාවක් සොයා ගත හැකිද යන්න තීරණය වන්නේ, ආර්ථික සාධක, සොයන රැකියාවේ ආකාරය, රටේ විවිධ පළාත්වල නිශ්චිත ආකාරයේ රැකියා සම්බන්ධයෙන් බලපාන නොයෙකුත් කරුණු ආදිය මතය.

දිනපතා පුවත් පත් වල, විශේෂයෙන් සෙනසුරාදා දිනවල 'Job vacancies' (නැතිනම් ‘Positions vacant’) පළකෙරේ. රැකියා ඇබෑර්තු අන්තර් ජාලයෙන්ද සොයාගත හැක. Yellow Pages දුරකථන නාමාවලියේ සහ අන්තර් ජාල රැකියා පුවරුවල ලැයිස්තුගත කර ඇති පුද්ගලික රැකියා ඒජන්සිද ඇත.

ඕනෑම ඕස්ට්‍රේලියානු වැසියෙකුට රැකියාවක් සොයා ගැනීමට උපකාර ලබා ගැනීම සඳහා **Centrelink** සහ **Job Network** සමඟ ලියාපදිංචි විය හැක. ලියාපදිංචිවීමෙන් පසුව, පුද්ගලික, ප්‍රජා සහ රජයේ සංවිධානවලින් සැදුම්ලත් Job Network වෙත ඔබව යොමු කල හැක. මෙය මිනිසුන් හට රැකියා සොයා දීම සඳහා ඕස්ට්‍රේලියානු රජයෙන් යොදවා ඇත.

අළුතින් පැමිණි අයෙකු වශයෙන්, පළපුරුදු රැකියා උපදේශකයකු හෝ **Centrelink Career Information Centre** සමඟ කථා කිරීම වඩා යෝග්‍ය වන අතර මේ මගින් විශේෂයෙන් ඔබට සම්මුඛ පරීක්ෂණයක් ලබා ගැනීමේ අපහසුව ඇතිනම්, ඔබ රැකියා සොයන ආකාරය යෝග්‍ය බවට තහවුරුවක් ලබා ගත හැක.

**Centrelink හා සම්බන්ධවීමේ විස්තර**

| | |
|---|---|
| **Job Search Information Line** | **13 6268** |
| **ඉංග්‍රීසි හැර වෙනත් භාෂා සඳහා උපකාර** | **13 1202** |
| **පුද්ගලිකව** | Office locations |
| **වෙනත් භාෂාවලින් තොරතුරු** | Centrelink assistance – we speak your language |
| **වෙබ් අඩවිය** | www.centrelink.gov.au |

## Job Network සේවා

Job Network යටතේ රැකියා සේවා ගණනාවක් ඇත. මේවා අතර:

- **Job Search Support Services** – Centrelink සමඟ හෝ Job Network සාමාජිකයෙකු සමඟ ලියාපදිංචිවූ විගස සුදුසුකම් ඇති රැකියා සොයන්නන් හට මෙම සේවා ලබා ගත හැක. මේ මගින් රැකියා සොයන්නන් හට හැකි විගස රැකියා සොයා ගැනීමට උපකාර කෙරේ.
- **Intensive Support Services** – සම්මුඛ පරීක්ෂණ කුසලතා දියුණු කර ගැනීමට පුහුණුව සහ අනාගත සේවායෝජකයන් ඉදිරියේ හොඳින් පෙනී සිටීම ආදී කරුණු සඳහා රැකියා සොයන්නන් හට තවදුරටත් සහාය ලබාදීම.
- **Intensive Support – Job Search Training** – රැකියා සෙවීමේ කුසලතා දියුණු කිරීම සහ Job Search Networks පුළුල් කිරීම වැනි (ක්‍රියාකාරකම් අතර resumes සහ රැකියා අයදුම් පත් සැකසීමට සහාය) කරුණු ඇතුළු එක් එක් රැකියා සොයන්නන් හට ගැලපෙන ආකාරයේ සහාය ලබාදීම.
- **Intensive Support – customised assistance** – සුදුසුකම් ඇති රැකියා සොයන්නන් හට තනි තනිව සහාය ලබා දීම සහ මෙයට රැකියා සොයන්නන් හට රැකියා සඳහා ඇති බාධා සැලකිල්ලට ගැනීම සහ රැකියා සොයන්නන් විසින් ගනු ලබන උත්සාහයන්ද සැලකිල්ලට ගනු ලැබේ.
- **New Enterprise Incentive Scheme (NEIS)** – රැකියා නැති අයහට සිය ව්‍යාපාර ආරම්භකර පවත්වාගෙන යාමට උපකාර කිරීම. සහභාගිවන්නන් හට සහාය ලබාගත හැකි අතර මේ මගින් පළමු වසරේදී කුඩා ව්‍යාපාර පුහුණුව, ආදායම් සහාය සහ උපදෙස් ලබාදේ.
- **Assessment Fee Subsidy for Overseas Trained Australian Residents** – විභාග සහ ඇගයීම් කිරීමේ වියදම් සම්බන්ධ උපකාර මේ මගින් ලබාදේ.

Job Network සේවා සපයන්නකු සමඟ ලියාපදිංචිවූ පමණින් රැකියාවක් ලැබෙන බවට තහවුරුවක් නැති බව මතක තබා ගැනීම වැදගත්වේ. ඔබහට රැකියාවක් සොයා ගැනීමේ අවස්ථාව වැඩිකර ගැනීමට ක්‍රියාකාරීව රැකියා සෙවිය යුතුය.

Centrelink හි ඇති නොමිලේ ලබාදෙන **Job Network Access** පහසුකම සියළුම රැකියා සොයන්නන් විසින් භාවිතා කල හැක. Job Network සාමාජික ඒජන්සි ගණනාවක් විසින් දුරකථන, ෆොටෝ කොපි, ෆැක්ස්, ටච් ස්ක්‍රීන් සහ පරිගණක (ඉන්ටනෙට් ඇතුළුව) භාවිතා කිරීමේ පහසුකම ලබාදේ. කුමන අයට මේ සඳහා හිමිකම් ඇතිද යන්න ඇතුළුව සේවා සඳහා පහත විස්තර බලන්න:

| | |
|---|---|
| **Job Seeker Hotline** | **13 6268** |
| **Job Network** වෙබ් අඩවිය | www.jobnetwork.gov.au |

Centrelink මගින් සේවා දායකයන්ව විදේශීය කුසලතා පිළිගැනීමේ සේවාව (overseas skills recognition) වෙත යොමු කරන අතර ප්‍රාදේශීය වශයෙන් ඇති වෙනත් රැකියා සේවා සම්බන්ධ උපදෙස් ලබාදේ.

Centrelink කාර්යාල ප්‍රධාන නගර මධ්‍යස්ථානවල මෙන්ම පළාත්බදවද පිහිටා ඇත. ඔවුන්ගේ කාර්යාලවල පිහිටීම White Pages දුරකථන නාමාවලියේ 'Centrelink' යටතේද, Centrelink වෙබ් අඩවියේද දක්වා ඇත.

## වැඩි විස්තර

| | |
|---|---|
| **Australian Apprenticeships** | **13 3873** |
| වෙබ් අඩවිය | www.australianapprenticeships.gov.au |
| **Workplace** වෙබ් අඩවිය | www.workplace.gov.au |
| **Australian Jobsearch** වෙබ් අඩවිය | www.jobsearch.gov.au |
| **Skilled Migrant Job Seeker** වෙබ් අඩවිය | https://skilledmigrant.gov.au |
| **Jobguide** වෙබ් අඩවිය | www.jobguide.deewr.gov.au |

## අධ්‍යාපන සුදුසුකම්

ඔබගේ අධ්‍යාපන සුදුසුකම් විධිමත් ලෙස පිළිගැනීමට ලක්කර ගැනීම වඩා යෝග්‍යවේ. මේ මගින් ඔබ සුදුසුකම් ලත් වෘත්තීයේම වැඩ කිරීමේ අවස්ථා වැඩිවනු ඇත.

### වෘත්තීය සුදුසුකම් (Trades qualifications)

ඉංජිනේරු, ඉදිකිරීම්, වානේ වැඩ (metalwork), විදුලි හෝ ආහාරපාන සැපයීම (catering) වැනි ක්ෂේත්‍රයක වෘත්තීය සුදුසුකමක් ඔබ හට ඇතිනම්, ඔබගේ සුදුසුකම් ඕස්ට්‍රේලියාවේදී පිළිගැනීමට ලක්කර ගන්නේ කෙසේද යන්න උපදෙස් දීමට පහත ආයතනයට හැකිවේ. ඔබ ජීවත්වන්නේ Northern Territory හි නම්, පහත ආකාරයට සම්බන්ධවන්න:

**Overseas Qualifications Unit**
Office of Multicultural Affairs
NT House, Level 11
22 Mitchell Street
DARWIN NT 0800
Tel: **8999 3891**

**Trades Recognition Australia**
GPO Box 9879
MELBOURNE VIC 3001
Tel: **1300 360 992** or **(03) 9954 2537**
Fax: (03) 9954 2588

විදේශයක සිට කරන විමසීම් පහත ආකාරයට කරන්න:

**Trades Recognition Australia**
GPO Box 9879
CANBERRA ACT 2601
AUSTRALIA
Tel: **+612 6121 7456**
Fax: +612 6121 7768
E-mail: traenquiries@dewr.gov.au
Website: www.workplace.gov.au/tra

### තෘතීය අධ්‍යාපන සුදුසුකම්

ඔබ යම්කිසි නිශ්චිත වෘත්තීයක රැකියාවක් බලාපොරොත්තුවන්නේ නම්, Australian Skills Recognition Information වෙබ් අඩවියේ දක්වා ඇති ලියාපදිංචි වීමේ, බලපත්‍ර ලබා දීමේ හෝ වෘත්තීය ආයතනය හා සම්බන්ධ වන්න.

ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශ **Overseas Qualifications Units (OQU)** මගින් සංක්‍රමණිකයන් හට තමන් විදේශවලදී ලබා ගත් කුසලතා සහ සුදුසුකම් පිළිගැනීමට ලක්කර ගැනීමට උපකාරවේ. වැඩි විස්තර සඳහා බලන්න:

| | |
|---|---|
| **Skills Recognition website** | www.immi.gov.au/asri/os-qual-units.htm |

Department of Education, Employment and Workplace Relations (DEEWR) විසින්, **Australian Education International - National Office of Overseas Skills Recognition (AEI-NOOSR)** මගින් විදේශයන්හි ලබාගත් සුදුසුකම් ඕස්ට්‍රේලියාවේදී කෙසේ සංසන්දනය කරන්නේ කෙසේද යන්න තොරතුරු සහ උපදෙස් මුදලකට ලබාදේ. වැඩි විස්තර සඳහා පහත විස්තර බලන්න:

| | |
|---|---|
| **AEI-NOOSR Hotline** | **1300 363 079** |
| **AEI-NOOSR වෙබ් අඩවිය** | aei.dest.gov.au/AEI/QualificationsRecognition |

AEI-NOOSR හා සම්බන්ධවීමට පෙර කරුණාකර Overseas Qualifications Unit (OQU) හා සම්බන්ධ වන්න; අවශ්‍ය නම් OQU විසින් ඔබව යොමු කරනු ඇත.

සමහර අවස්ථාවලදී, ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය හෝ ඕස්ට්‍රේලියානු නිත්‍ය වාසය ඇති විදේශයන්හි පුහුණුවලත් වෘත්තිකයන් හට ඕස්ට්‍රේලියාවේ පිළිගැනීම ලබා ගැනීමට අවශ්‍ය අධ්‍යයන කටයුතු කිරීම සඳහා අර්ධ හෝ පූර්ණ වශයෙන් ගාස්තු ගෙවීමට අවශ්‍ය මුදල FEE-HELP assistance මගින් ලබා ගැනීමට හිමිකම් තිබිය හැක.

| | |
|---|---|
| **FEE-HELP** | **1800 020 108** |
| **Going to Uni website** | www.goingtouni.gov.au |

වැඩසටහන් සුදුසුකම් සපුරාලන සමහර වෘත්තීන්හි විදේශයන්හි පුහුණුවලත් වෘත්තිකයන් හට සුදුසුකම් ඇගයීමට සහ විභාග සඳහා අවශ්‍ය වියදම ආවරණය කර ගැනීමට ASDOT මගින් මුදල් ආධාර ලබාදේ.

| | |
|---|---|
| **ASDOT Hotline** | **1300 363 079** |
| **ASDOT website** | aei.gov.au/AEI/QualificationsRecognitionInformation/Asdot |

ඔබගේ අධ්‍යාපන සුදුසුකම් පෙන්වන ලියකියවිලි ඉංග්‍රීසි භාෂාවෙන් නැතිනම්, ඒවා පරිවර්තනය කර ගත යුතුය. 2 වන පරිච්ඡේදයේ, *ඉංග්‍රීසි සඳහා උපකාර* බලන්න.

## රැකියා තත්වයන් (සේවා යෝජක/සේවක අයිතීන්)

ඕස්ට්‍රේලියාවේ සේවකයන් හට අයිතිවාසිකම් ඇති අතර අදාල ෆෙඩරල් සහ ප්‍රාන්ත/සන්තක ප්‍රදේශ නීති යටතේ ආරක්ෂාව ඇත. මෙම නීති මගින් සේවකයන්ගේ අවම වේතන සහ අවම රැකියා තත්වයන් සම්බන්ධ රීතීන් සපයයි.

**Workplace Authority** යනු ඕස්ට්‍රේලියාවේ සේවායෝජකයන් සහ සේවකයන්ගේ රැකියා ස්ථාන සබඳතා ක්‍රමය (workplace relations system) සම්බන්ධ නොමිළේ උපදෙස් සහ තොරතුරු ලබාදෙන ප්‍රධාන ස්ථානයයි. Workplace Authority මගින් රැකියා ස්ථාන ගිවිසුම් (workplace agreements) භාරගන්නා අතර ඒවා සාධාරණද යන්න ඇගයීමක් කරයි. Workplace Authority සෑම ප්‍රධාන නගරයකම ඇති අතර Translation and Interpreting Service ඔස්සේ දුරකථනයෙන් සම්බන්ධ විය හැක.

ඔබගේ රැකියා ස්ථානයේ නීති ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් ඔබට ගැටළු ඇතිනම්, **Workplace Ombudsman** විසින් පැමිණිලි හෝ රැකියා ස්ථාන සම්බන්ධ ෆෙඩරල් නීති උල්ලංඝණයවීම් විමර්ශණය කල හැක; ෆෙඩරල් රැකියා ස්ථාන නීතියට පටහැනි ක්‍රියාවක් හෝ පුරුද්දක් සොයා බැලීම; ෆෙඩරල් රැකියා ස්ථාන නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ කටයුතු ඇරඹීම; සහ *Workplace Relations Act 1996* යටතේ නඩු කටයුත්තකට පාර්ශවකරුවකු වන හෝ විය හැකි සේවකයන් නියෝජනය කිරීම කල හැක.

ඕස්ට්‍රේලියානු රැකියා ස්ථාන සබඳතා ක්‍රමය සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා ඔබට Workplace Infoline ඇමතිය හැක නැතිනම් ඕස්ට්‍රේලියානු රජයේ රැකියා ස්ථාන වෙබ් අඩවිය වෙත යා හැක.

| | |
|---|---|
| **Workplace Ombudsman වෙබ් අඩවිය** | www.wo.gov.au |
| ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් සහාය සඳහා | **13 14 50** |
| **Workplace Ombudsman Helpline** | **1300 724 200** |
| **Workplace Infoline** | **1300 363 264** |
| **Workplace වෙබ් අඩවිය** | www.workplace.gov.au |

රැකියා ස්ථාන සම්බන්ධතා පනත යටතේ සියළුම සේවකයන් හට වෘත්තීය සමිතියකට බැඳීමේ හෝ බැඳී නොසිටීමේ අයිතිය ඇත. සේවායෝජකයකු විසින් සේවකයකුව වෘත්තීය සමිතියකට අයත්වීම හෝ අයත් නොවීම නිසා සේවයෙන් ඉවත් කල නොහැක. වැඩි විස්තර සඳහා පහත ආකාරයට **Australian Council of Trade Unions (ACTU)** හා සම්බන්ධ වන්න.

| | |
|---|---|
| **ACTU Helpline** | **1300 362 223** |
| **ACTU වෙබ් අඩවිය** | www.actu.asn.au |

නැතිනම් අමතන්න:

**Unions NT**
First Floor, 38 Woods St
DARWIN NT 0800
Tel: **8941 0001**

**Northern Territory Working Women's Centre**
98 Wood St
DARWIN NT 0800
Tel: **8981 0655**

**Department of Employment and Workplace Relations**
RCG Centre
47 Mitchell St
DARWIN NT 0800
Tel: **8936 5000**

## Superannuation

Superannuation යනු ඔබගේ විශ්‍රාම කාලය සඳහා විශේෂයෙන් සැලසුම් කල දීර්ඝ කාලීන ආයෝජනයකි. Superannuation ලොව පුරා 'retirement savings' නැතිනම් 'pension income' වශයෙන් හඳුන්වයි. ඔබ රැකියාව කරන කාලයේ superannuation හි ආයෝජනය කිරීම මගින් ඔබගේ විශ්‍රාම සමය සඳහා මුදලක් ඉතිරි කර තැබීමට උපකාර කිරීමට සැලසුම් කර ඇත. ඕස්ට්‍රේලියාවේ රැකියාවක නිරතව සිටින සෑම අයෙකුම වාගේ superannuation අරමුදලක සාමාජිකත්වය රැගෙන ඇත.

ඕස්ට්‍රේලියාවේ Superannuation යන්න පොදුවේ 'Super' ලෙස හඳුන්වයි.

බොහෝ අවස්ථාවල ඔබ උපයන මුදලින් සියයට නමයක් (9%) ඔබ තෝරාගත් superannuation අරමුදලකට යැවීමට ඔබගේ සේවායෝජකයාට නීතියෙන් නියම කරයි. ඔබගේ Super අරමුදලට වැඩිපුර අරමුදල් යැවීමටද ඔබට හැකියාව ඇත. ඔබගේ සොවායෝජකයා ඔබ හට නියමිත මුදල ගෙවන්නේද යන්න සොයා බැලීමට, ඔබගේ superannuation අරමුදල කළමණාකරණය කරන අයගෙන් විමසිය යුතුය. වැඩි විස්තර සඳහා පහත තොරතුරු බලන්න:

| | |
|---|---|
| **ATO Superannuation Infoline** | **13 1020** |
| **ATO වෙබ් අඩවිය** | www.ato.gov.au/super |
| **Australian Securities & Investments Commission (ASIC)** | **1300 300 630** |
| **ASIC වෙබ් අඩවිය** | www.fido.asic.gov.au |

### බදු ගෙවීම

**Tax File Number (TFN)** යනු **Australian Taxation Office (ATO)** මගින් පුද්ගලයන් හෝ ආයතන වෙත නිකුත් කරන අද්විතීය අංකයක් වන අතර සියළුම ආකාරයේ ආදායම් ඉපයීම්වලට මෙය අවශ්‍යවේ. මූලික ප්‍රමුඛතාවයක් ලෙස ඔබගේ TFN සඳහා අයදුම් කරන්න. අළුතින් පැමිණි අයවෙත සිය TFN ලබාගත හැකි කඩිනම්ම ආකාරය වන්නේ අන්තර්ජාලය ඔස්සේය. **Online TFN registration** දිනකට පැය 24 ක් පුරාත්, සතියකට දින 7 ක් පුරාත් සිදුකල හැකි අතර, අවශ්‍ය වන්නේ ඔබගේ ගමන් බලපත්‍ර විස්තර සහ ඔබගේ ඕස්ට්‍රේලියාවේ ලිපිනයයි. දින 10 කට පමණ පසුව ඔබගේ නව TFN තැපෑලෙන් ඔබට ලැබෙනු

ඇත. ඔබ ඔබගේ TFN ආරක්‍ෂා කර ගත යුතු අතර, ඔබගේ පසුම්බිය හෝ ජංගම දුරකථනය වැනි නැතිවිය හැකි තැන්වල ලියා තබා නොගත යුතුය.

අයදුම් පත්‍ර Centrelink offices, ATO වෙබ් අඩවියෙන් මුද්‍රණය කර ගැනීමෙන් හෝ TFN Helpline ඇමතීමෙන් හෝ ලබා ගත හැක. TFN නිකුත් කිරීමට ගතවන කාලය දින 28 කි.

ඔබ රැකියාවක් කිරීම ඇරඹීමෙන් පසු, ඔබගේ සේවායෝජකයා විසින් ඔබට ප්‍රකාශ කිරීමේ පෝරමයක් (TFN Declaration form) පිරවීමට ලබාදෙන අතර එහි ඔබගේ TFN පිරවිය යුතුය. ඔබට TFN නැතිනම්, TFN නිකුත් කිරීමට ගතවන සම්මත කාලය ඉකුත් වන තෙක් සාමාන්‍ය බදු ප්‍රමාණයට වඩා වැඩි බදු ප්‍රමාණයක් අය කිරීමට ඔබගේ සේවායෝජකයා හට නොහැක.

ඔබ මුදල් වර්ෂයක් තුල (ජූලි 1 සහ ජූනි 30 දක්වා කාලය අතර) කිසියම් මුදලක් උපයයි නම්, වෙනත් ආකාරයක වැඩපිළිවෙලක් නැතිනම්, එම වසරේ ඔක්තෝබර් 31 දිනට පෙර ඔබගේ **Income Tax Return** ගොනුකල යුතුය. ඕස්ට්‍රේලියානු වැසියෙකු හැටියට, ඔබගේ income tax return පුරවන අවස්ථාවේ ඕස්ට්‍රේලියාව තුල සහ ඉන් පිටත ලද සියළුම ආදායම් සාමාන්‍යය වශයෙන් හෙළිදරව් කල යුතුය.

ඕස්ට්‍රේලියාවේ බොහෝ දේ සම්බන්ධයෙන් සියයට 10 ක් වන **Goods and Services Tax (GST)** (භාණ්ඩ සහ සේවා බද්දක්) ඇත. ඔබට ගෙවීමට නියම කරන මුදලේ GST ඇතුලත්ය. මූලික ආහාර, බොහෝ අධ්‍යාපන සහ සෞඛ්‍යය සේවා, සුදුසුකම් ලත් ළමා රැකවරණ සහ සාත්තු නිවාස GST ගෙවීමෙන් නිදහස්ය.

ඔබ ව්‍යාපාරයක් කරන්නේ නම්, ඔබට Australian Taxation Office සහ වෙනත් ව්‍යාපාර සමඟ කටයුතු කිරීමට Australian Business Number (ABN) (ඕස්ට්‍රේලියානු ව්‍යාපාර අංකයක්) අවශ්‍යය. වැඩි විස්තර සඳහා පහත ආකාරයට Australian Taxation Office හා සම්බන්ධ වන්න.

## Australian Taxation Office (ATO) හා සම්බන්ධවීමේ විස්තර

| | |
|---|---|
| **Tax File Number Helpline** | **13 2861** |
| **Business and GST enquiries** | **13 2866** |
| **Personal Tax Information Line** | **13 2861** |
| **TFN online registration** | www.ato.gov.au/individuals |
| **Tax Office වෙබ් අඩවිය** | www.ato.gov.au |

## විදේශ වත්කම්. ආයෝජන සහ ආදායම

ඕස්ට්‍රේලියානුවාසීන් හට සිය ලොව පුරා ඇති ආදායම සම්බන්ධයෙන් බදු පනවන අතර සිය income tax return මගින් සියළුම විදේශ ආදායම් හෙළිදරව් කල යුතුය. තමා බදු අරමුණ සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු වැසියෙකුද යන්න එක් එක් අයගේ තත්වයන් අනුව තීරණය කල යුතුය. ඔබගේ බදු වගකීම් සම්බන්ධයෙන් ඔබට අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු, Australian Taxation Office (ATO) මගින් සිය වෙබ් අඩවියේ දක්වා ඇත.

පහත සඳහන් ආදායම කුමන ආකාරයට සැලකිය යුතුද යන්න විස්තර ATO මගින් ලබා දිය හැකඃ

- ව්‍යාපාර වස්තු (securities) සහ කුලී නිවෙස් වැනි ආයෝජනයන්
- පොලී සහ හිමිකම්භාගය (royalties)
- විදේශවල ඇති ව්‍යාපාර ක්‍රියාකාරකම්
- විදේශයකදී විශ්‍රාම වැටුප් ලැබීම

ඔබ විදේශයකදී මුදල් උපයන ඔබ විසින් විදේශයකදී බදු ගෙවන ආදායමක් සම්බන්ධයෙන් වුවද, ඔබ විදේශයකදී උපයන මුදල් සම්බන්ධයෙන් හෙළිදරව් කල යුතුය. ඔබගේ විදේශ ආදායම ඕස්ට්‍රේලියාවේදී බදුවලට යටත් නම් සහ ඔබ විදේශයේදී ඒ සඳහා බදු ගෙවා ඇතිනම්, ඔබ විදේශ බදු ණයවරයකට (foreign tax credit) හිමිකම් ලැබිය හැක. ණයවර ලබා ගැනීමට හිමිකම් ඇති බදු, ණයවර ලබා ගත හැකි බදු (creditable taxes) ලෙස හැඳින්වේ.

ඕස්ට්‍රේලියානු බදුවලින් නිදහස් කරන විදේශ ආදායම ඔබ විසින් පෙන්විය යුතුය. ඔබගේ ආදායම මත ඔබ විසින් ගෙවිය යුතු බදු ප්‍රමාණය තීරණය කිරීමේදී, ඕස්ට්‍රේලියානු සහ විදේශ මූලාශ්‍ර මගින් ඔබට ලැබෙන ශුද්ධ ආදායම සැලකිල්ලට ගනු ලැබේ.

ඔබගේ මූල්‍යමය කටයුතු සංකීර්ණ නම් ඔබ විසින් බදු නියෝජිතයකුගේ සහාය හෝ Australian Taxation Office හි උපදෙස් ලබා ගැනීම හොඳ අදහසකි.

| | |
|---|---|
| **ATO International Tax Essentials** | www.ato.gov.au/individuals/pathway.asp?pc=001/002/012 |

# 8. සමාජ ආරක්‍ෂණ (Social security)

ඕස්ට්‍රේලියානු රජය මගින් මිනිසුන් හට ස්වයංපෝෂිත වීමට සහාය දීම සහ අවශ්‍ය අයට උපකාර කිරීම සඳහා වන සේවා ලබාදීම මගින් සමාජ හා ආර්ථික ප්‍රතිඵල ලබාදීමට දායකවේ. **Centrelink** ලෙස හඳුන්වන රජයේ ආයතනය මගින් ප්‍රධාන වශයෙන් සමාජ ආරක්‍ෂණ සපයයි. **Family Assistance Office** මගින් පවුල්වලට උපකාර ලබාදේ.

ඔබගේ පළාතේ White Pages දුරකථන නාමාවලිය මගින් Centrelink office locations සහ Family Assistance Office locations සොයාගත හැක.

## Centrelink ගෙවීම්

ආදායම් උපකාර ගෙවීම් සඳහා හිමිකම් ලැබෙන්නේ ඔබගේ ආදායම සහ වත්කම් ඇතුළුව ඔබගේ වීසා කාණ්ඩය සහ ඔබගේ අවස්ථානුගත තත්වයන් අනුවය. ඔබ ඕස්ට්‍රේලියාවේ නිත්‍ය පුරවැසියෙකු වුවද, ගෙවීම් සඳහා බලා සිටීමේ කාලයක් අදාල විය හැක (පහත බලන්න).

ඔබ ඉංග්‍රීසි කථා නොකරයිනම්, ඔබගේ හමුවීමේ අවසථාව සඳහා භාෂා පරිවර්තකයකු ලබා දීමට Centrelink හට හැකිවේ. ඔබට ඔබගේ භාෂාවෙන් Centrelink ඇමතිය හැක:

| | |
|---|---|
| **Centrelink (බහු භාෂා සේවාව)** | **13 1202** |
| **Centrelink වෙබ් අඩවිය** | www.centrelink.gov.au |

ඔබ ගෙවීම් සඳහා Centrelink වෙත අයදුම් කරන විට හඳුනා ගැනීමේ ලියකියවිලිද (ගමන් බලපත්‍රය සහ ගමන් කිරීමේ ලියකියවිලි, බැංකු ගිණුම් විස්තර සහ වාසස්ථාන විස්තර) ලබා දිය යුතුය. හඳුනා ගැනීමේ ලියකියවිලි සම්බන්ධ වැඩි විස්තර ඉහත අංකය මගින් හෝ Centrelink වෙබ් අඩවියේ ඇති Proving your identity to Centrelink විස්තර පත්‍රිකාවෙන්ද ලබා ගත හැක.

ආදායම් උපකාර ගෙවීම් ලබා ගැනීම සඳහා ඔබ හට Tax File Number (TFN) තිබිය යුතුය. ඔබට Australian Taxation Office වෙත ගොනු කිරීමට TFN අයදුම්පත්‍රයක් Centrelink වෙතින් ලබා ගත හැක.

## බලා සිටීමේ කාලය

රැකියා විරහිත සහ අසනීප ප්‍රතිලාභ, ශිෂ්‍ය දීමනා සහ වෙනත් ගෙවීම් ගණනාවක් ඇතුළු බොහෝමයක් සමාජ ආරක්‍ෂණ ගෙවීම් ලබා ගැනීම සඳහා සාමාන්‍යයෙන් අළුතින් පැමිණෙන සංක්‍රමණිකයන් ඕස්ට්‍රේලියාවේ නිත්‍ය වාසීන් වශයෙන් අවුරුදු දෙකක් ජීවත්විය යුතුය. බලා සිටීමේ කාලයට ඇතුලත් වන්නේ ඕස්ට්‍රේලියාව තුල නිත්‍යවාසීන් වශයෙන් සිටි කාලය පමණි. වයස් සහ ආබාධිත විශ්‍රාම දීමනා ලබා ගැනීම සඳහා සාමාන්‍ය වශයෙන් ඕස්ට්‍රේලියාවේ වසර 10 ක් ජීවත්විය යුතුය.

### බලා සිටීමේ කාලයෙන් නිදහස් වන අවස්ථා

සරණාගතයන් සහ මානව හිතවාදී පදනම යටතේ රටට ඇතුළුවන්නන් වසර දෙකක බලා සිටීමේ කාලයෙන් නිදහස්වේ. සරණාගතයන් සහ මානව හිතවාදී පදනම යටතේ රටට ඇතුළුවන්නන් හට ඕස්ට්‍රේලියාවට ඇතුළු වන විට සම්බන්ධතාවයක් තිබුණිනම්, මෙය ඔවුන්ගේ හවුල්කාරයන් සහ යැපෙන දරුවන් හටද අදාලවේ.

එසේම, ඕස්ට්‍රේලියානු පුරවැසියන් සහ අවම වශයෙන් වසර දෙකක නිත්‍ය වාසය ඇති අයගේ හවුල්කාරයන් සහ යැපෙන දරුවන් හටද බලා සිටීමේ කාලයෙන් නිදහස්වීම අදාලවේ. අදාලවන වෙනත් නිදහස්වීම්ද තිබිය හැක.

බොහෝ ගෙවීම් ලබා ගත හැකි වන්නේ, ඕස්ට්‍රේලියාවේ ජීවත්වන මෙහි ස්ථිරව සිටීමට අවසර තිබෙන අය හට පමණි. ඔබගේ පාලනයෙන් බැහැර ඔබගේ තත්වයේ සැලකිය යුතු මට්ටමේ වෙනසක් සිදුව ඇති අවස්ථාවක **Special Benefit** ලෙසින් හැඳින්වෙන ගෙවීමක්, බලා සිටීමේ කාලයේදී ලබා ගත හැකිවනු ඇත. මෙම ගෙවීම ලබාගත හැකිවනුයේ ඉතාම සීමිත අවස්ථාවලදී පමණි. Special Benefit සඳහා සුදුසුකම් ලැබීමට රැකියාවක් සොයා ගැනීමට නොහැකිවීම හෝ මුදල් අවසන් වීම ප්‍රමාණවත් හේතු නොවේ. ඔබ සංක්‍රමණය කලේ, සහාය ලබා දෙන බවට තහවුරුවක් (Assurance of Support) ඇතිව නම්, ඔබ වෙනුවෙන් තහවුරුව ලබා දුන් අය ඔබට ලබාදුන් ගෙවීම නැවත ගෙවීමට වගකිමෙන් බැඳී සිටී.

ඔබ ඕස්ට්‍රේලියානු නිත්‍යවාසියෙකු හට රැකවරණය ලබා දෙන්නේ නම්, බලා සිටීමේ කාලයේදී ඔබ හට **Carer Payment** ලබා ගත හැකි අතර ඔබ නිරතුරුවම රැකවරණය ලබා දෙන්නේ නම්ද බලා සිටීමේ කාලයේදී ඔබ හට **Carer Payment** ලබා ගත හැකි විය හැක.

ඔබ ඕස්ට්‍රේලියානු වැසියකුවීමට පසු වැන්දඹුවුවහොත්, ආබාධිත වුවහොත් හෝ තනි මවක් හෝ තනි පියෙක් වුවහොත්, ඔබට දීමනාවකට හෝ විශ්‍රාම වැටුපකට හිමිකම් තිබිය හැක. ඔබ ජාත්‍යන්තර සමාජ ආරක්‍ෂණ ගිවිසුමකින් ආවරණය වන්නේ නම්, වසර 10 ක් ඕස්ට්‍රේලියාවේ ජීවත්ව සිටීමේ අවශ්‍යතාවයකින් තොරව විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හිමිකම් තිබිය හැක. 2008 ජනවාරි මාසය වනවිට ඕස්ට්‍රේලියාව රටවල් 19 ක් සමඟ සමාජ ආරක්‍ෂණ ගිවිසුම් ඇතිකරගෙන ඇත.

## මානව හිතවාදී පදනම යටතේ රටට ඇතුළුවන්නන් හට අර්බුද ගෙවීම් (**Crisis Payment**)

2008 ජනවාරි 1 දින සිට, පහත වීසා කාණ්ඩයක් යටතේ ප්‍රථම වරට 2008 ජනවාරි 1 වන දින හෝ ඉන්පසු මානව හිතවාදී පදනම යටතේ ඕස්ට්‍රේලියාවට ඇතුළුවූ අය හට ලබාදුන් **Crisis Payment** ලබාදීම දීර්ඝ කර ඇත:

- වීසා උපකාණ්ඩ 200 – Refugee
- වීසා උපකාණ්ඩ 201 – In-country Special Humanitarian
- වීසා උපකාණ්ඩ 202 – Global Special Humanitarian
- වීසා උපකාණ්ඩ 203 – Emergency Rescue, and
- වීසා උපකාණ්ඩ 204 – Woman at Risk

යම් අයෙකු ගෙවීමට හිමිකම් ලැබීමට නම්, Centrelink විශ්‍රාම වැටුපකට හෝ ප්‍රතිලාභයකට හිමිකම් තිබිය යුතු අතර මුදල් දුෂ්කරතා තිබිය යුතුය. අදාල පුද්ගලයා **ඕස්ට්‍රේලියාවට පැමිණ දින 7 ක් ඇතුලත ඉල්ලීම ඉදිරිපත් කල යුතුය** නැතිනම්, ඉල්ලීමක් ගොනු කිරීමේ අරමුණ ඇතිව ඕස්ට්‍රේලියාවට පැමිණ දින 7 ක් ඇතුලත Centrelink හා සම්බන්ධ විය යුතු අතර එදින සිට දින 14 ක් ඇතුලත ඉල්ලීම ගොනු කල යුතුය.

මානව හිතවාදී පදනම යටතේ අළුතින් රටට පැමිණි අය සඳහා ගෙවන Crisis Payment එක් වරක් පමණක් කරන ගෙවීමක් වන අතර මේ මෙය සුදුසුකම් ඇති අයට ආරම්භයේදී ස්ථාපනය වීමට කරන අමතර මුදල් ආධාරයකි. Crisis Payment ලෙසින් ගෙවන මුදල එම පුද්ගලයාගේ සතියක Centrelink විසින් ගෙවන මූලික ගෙවීම හා සමානවේ (කුලී උපකාර සහ ඖෂධ දීමනා වැනි අමතර ගෙවීම් හැර).

# Family Assistance payments

ඔබගෙන් යැපෙන දරුවන් සිටිනම්, සිය රාජකාරි සහ පවුල් වගකීම් සම්බන්ධයෙන් උපකාර කිරීම සඳහා පවුල් වෙත ඕස්ට්‍රේලියානු රජය මගින් **Family Assistance Office** ඔස්සේ විවිධ ආකාරයේ ගෙවීම් සිදු කරයි. ප්‍රධාන Family Assistance payment අතර Family Tax Benefit, Baby Bonus, Child Care Benefit, Child Care Tax Rebate, Baby Bonus සහ Maternity Immunisation Allowance ඇතුලත්වේ.

සුදුසුකම් ලැබීමට සාමාන්‍යයෙන් ස්ථිර වීසා බලපත්‍රයක් තිබිය යුතු අතර මෙයට සමහර නිදහස් කිරීම් ඇත. මෙම ගෙවීම් සඳහා බලා සිටීමේ කාලයක් නැත. Family Assistance payments ආදායමට අතිරේකයක් වන අතර ඒ මත ජීවත්වීමට ප්‍රමාණවත් නොවන බව අවබෝධ කර ගැනීම වැදගත්වේ. Family Assistance payments ආදායම් පරීක්ෂාවකට යටත්ය.

Family Assistance Offices පිහිටා ඇත්තේ Centrelink, Medicare සහ Australian Taxation Office තුලය. Family Assistance payments සම්බන්ධ වැඩි විස්තර හෝ ඔබට හිමිකම් ඇත්තේ කුමක් ලබා ගැනීම සඳහාද යන්න උපදෙස් ලබා ගැනීමට, Family Assistance Office හා සම්බන්ධවන්න.

### Family Assistance Office හා සම්බන්ධවීමේ විස්තර

| | |
|---|---|
| දුරකථන | **13 6150** |
| ඉංග්‍රීසි හැර වෙනත් භාෂා | **13 1202** |
| **TTY** (ඇසීමේ හා කථා කිරීමේ ආබාධ ඇති අය) | **1800 810 586** |
| **Family Assistance** වෙබ් අඩවිය | www.familyassist.gov.au |

### තරුණ අය

ඔබට වයස අවුරුදු 16 ට වැඩි දරුවන් සිටිනම්, Youth Allowance හෝ Austudy වැනි සමාජ ආරක්ෂණ ගෙවීම්වලට ඔවුන් හට සුදුසුකම් තිබිය හැක. වැඩි විස්තර සඳහා www.centrelink.gov.au වෙත යන්න නැතිනම් අමතන්න:

| | |
|---|---|
| **Youth and Student Services** | **13 2490** |
| ඉංග්‍රීසි හැර වෙනත් භාෂා සඳහා | **13 1202** |

## Centrelink හෝ Family Assistance Office සමඟ ඔබ වෙනුවෙන් වෙනත් අයෙකු කටයුතු කිරීම

Centrelink හෝ/සහ Family Assistance Office සමඟ ඔබගේ කටයුතුවලදී ඔබ වෙනුවෙන් කටයුතු කිරීමට, 'nominee' ලෙසින් හැඳින්වෙන පුද්ගලයකු හෝ සංවිධානයක් ඔබ විසින් නම් කළ හැක.

### අයිතීන් සහ වගකීම්

ඔබ හට ගෙවීම් ලබා ගැනීමට ඔබ විසින් සපුරාලිය යුතු රීති සහ කොන්දේසි කිහිපයක් ඇත. ඔබ ඒවා සපුරන්නේ නැතිනම්, ඔබගේ ගෙවීම් වලට බලපෑ හැකි අතර ගෙවීම් නතරවීම වුවද විය හැක.

### Centrelink

ඔබට ආදායමක් ලැබුණහොත්, ඔබට ලැබිය යුතු නියම ගණන ලැබෙන බවට වග බලා ගැනීමට, ඔබගේ තත්වයේ වෙනස්වීම Centrelink වෙත දැනුම් දිය යුතුය. මේවා අතර:

- ඔබගේ ආදායමේ වෙනස්කම්
- ඔබගේ ජීවත්වන ආකාරයේ වෙනස්කම්
- ඔබ විවාහවුණිද, වෙන්වුණිද යන්න
- ඔබ ඉගෙනීම ඇරඹුවාද, නැවැත්වුවාද යන්න
- ඔබ වැඩ කිරීම ඇරඹුවාද, නැවැත්වුවාද යන්න.

ඔබට Centrelink වෙතින් ලැබෙන සියළු ලිපි කියවිය යුතු අතර අවශ්‍ය නම්, පිළිතුරු ලබා දිය යුතුය.

Centrelink සිය සේවාදායකයන් හට සවන් දෙන අතර, මේ මගින් Centrelink වෙත සිය සේවා වර්ධනය කර ගැනීමට උපකාරීවේ. ඔබහට පැසසුමක්, යෝජනාවක් හෝ පැමිණිල්ලක් ඇතිනම්, අමතන්න:

| | |
|---|---|
| **Centrelink's Customer Relations Unit** (නොමිළේ ඇමතුම) | **1800 050 004** |
| **ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින්** | **13 1202** |

ඔබගේ තොරතුරුවල පුද්ගලිකභාවය – ඔබගේ පුද්ගලික තොරතුරු ලබාදිය හැක්කේ, නීතියේ අවසරය ඇති අවස්ථාවක හෝ අවසර ලබා දුන් අවස්ථාවක Centrelink හෝ Family Assistance Office වෙතින් පමණි.

### Family Assistance Office

ඔබට ගෙවීමක් ලැබී, ඔබගේ හිමිකම්වලට බලපෑ හැකි පවුලේ තත්වය වෙනස් වීමක් වුවහොත් Family Assistance Office වෙත දැනුම් දීමට ඔබට සිදුවේ. ඔබගේ rights and responsibilities සම්බන්ධ වැඩි විස්තර සඳහා Family Assistance වෙබ් අඩවිය වෙත යන්න.

## Centrelink Multicultural Service Officers (බහුසංස්කෘතික සේවා නිලධාරීන්)

Multicultural Services Officers (MSOs) යනු සංක්‍රමණ සහ සරණාගත ප්‍රජාවට Centrelink හි ඇති පුරුකයි. ඔවුන් විසින් සේවාදායකයන් සහ ප්‍රජාවන් හට වැඩසටහන් සහ සේවා සම්බන්ධ තොරතුරු ලබාදෙන අතර Centrelink හට සිය සේවා වර්ධනය කර ගැනීමේ අරමුණින් පුළුල් ලෙස මිනිසුන්ගෙන් විමසීම් සිදු කරයි.

### වැඩිදුර විස්තර

සිය සේවා සහ ගෙවීම් සම්බන්ධ තොරතුරු සමුදායක් Centrelink සතුව ඇත. අළුතින් පැමිණි සංක්‍රමණිකයන් සහ සිය ඉංග්‍රීසි පළමු භාෂාව නොවන ඕනෑම අයෙකු හට '**Welcome to Centrelink**' යන සාමාන්‍ය මාර්ගෝපදේශය ඇතුළු පරිවර්තනය කළ තොරතුරු රාශියක් ඇත. මෙහි පිටපතක් සහ වෙනත් පරිවර්තනය කරන ලද තොරතුරු සඳහා, අංක 13 1202 අමතන්න නැතිනම් www.centrelink.gov.au වෙබ් අඩවිය වෙත ගොස් පළමු පිටුවේ 'We speak your language' තෝරන්න. Centrelink ගෙවීම් සහ සේවා සම්බන්ධ වැඩි විස්තර ලබා ගැනීම සඳහා Centrelink මුල් පිටුවේ 'individuals' වෙත ගොස් 'Moved to Australia' තෝරා ගන්න. වෙනත් විස්තර ලබා ගැනීමට පහත අංක අමතන්න:

| | |
|---|---|
| **Centrelink multilingual** (ඉංග්‍රීසි හැර වෙනත් භාෂා සඳහා උපකාර) | **13 1202** |
| **හමුවීම් සහ විවෘතව තබන වේලාවන්** | **13 1021** |

| | |
|---|---|
| **Employment Services, Newstart, Special Benefit** | **13 2850** |
| **Age Pensions** සහ **Pensioner Concession Cards** | **13 2300** |
| දෙමාපියන් හෝ භාරකරුවන් | **13 6150** |
| **Youth Allowance** සහ **Student Services** | **13 2490** |
| **Disability, Sickness and Carers** | **13 2717** |
| **Centrelink International Services (overseas pensions)** | **13 1673** |
| **New Apprenticeship Line** | **13 3633** |
| **Customer feedback** | **1800 050 004** |
| **Centrelink TTY** (ඇසීම සහ කථාකිරීම ආබාධිත අය සඳහා) | **1800 810 586** |
| **Customer feedback TTY** | **1800 000 567** |
| විදේශයක සිට කථා කරන්නේ නම් | **+613 6222 3455** |

## Family Assistance Office

Family Assistance Office මගින් සිය සේවා සහ ගෙවීම් සම්බන්ධ තොරතුරු ලබාදේ. අළුතින් පැමිණි සංක්‍රමණිකයන් සහ සිය ඉංග්‍රීසි පළමු භාෂාව නොවන ඕනෑම අයෙකු හට, පවුල් සහාය සම්බන්ධ පරිවර්තනය කල තොරතුරු රාශියක් ඇත. පවුල් උපකාර ගෙවීම් සම්බන්ධ තොරතුරු පත්‍රිකාවේ පරිවර්තනය කල පිටපතක් සඳහා, අංක 13 1202 අමතන්න, නැතිනම් Family Assistance වෙබ් අඩවිය වෙත ගොස් Multilingual Services තෝරන්න.

# 9. ප්‍රවාහනය

## පොදු ප්‍රවාහනය

Darwin සහ Alice Springs හි පොදු බස්සේවා ඇත. මේවා සඳහා ගාස්තු ඔබට ගමන් කිරීමට අවශ්‍ය දුර ප්‍රමාණය අනුව වෙනස්වේ. Centrelink මගින් නිකුත්කල Health Care Card පත හෝ Pension Card පත රියදුරු මහතා හට පෙන්වුවහොත්, ඔබට ගෙවීමට සිදුවන්නේ අඩුකල ගාස්තුවකි.

වඩා කුඩා මධ්‍යස්ථානවල පාසැල් ගමන් යන පුද්ගලික බස් සමාගම් ඇත. වැඩි විස්තර සඳහා ඔබගේ පළාත් ආයතනය හා සම්බන්ධ වන්න (14 වන පරිච්ඡේදයේ, *පළාත් ආයතන* බලන්න).

| | |
|---|---|
| **Darwin Bus Information** | **8924 7666** |
| **Alice Springs Bus Information** | **8952 5611** |

බස්රථ සම්බන්ධ තොරතුරු බොහෝ අවස්ථාවල රියදුරු මහතාගෙන් හෝ බස් රථ සමාගමට දුරකථනයෙන් කථා කිරීම මගින් හෝ ලබා ගත හැක. බස් රථ සමාගම්, Yellow Pages දුරකථන නාමාවලියේ 'Bus and coach scheduled services' යටතේ ලැයිස්තු ගත කර ඇත.

### ටැක්සි සේවා

ඕස්ට්‍රේලියාවේ බොහෝ පළාත්වල ටැක්සි රථ දිනකට පැය 24 පදනමින් ක්‍රියාත්මකවේ. ටැක්සි රථයේ පාලක පුවරුවේ සවිකර ඇති මීටරයේ ගාස්තුව පෙන්වයි. ටැක්සි රථ සමාගම් Yellow Pages දුරකථන නාමාවලියේ යටතේ 'Taxi cabs' ලැයිස්තු ගත කර ඇත. රෝද පුටු භාවිතා කරන අය සඳහා බොහෝ නගරවල විශේෂ ටැක්සි රථ ඇත.

## පුද්ගලික වාහන

පුවත්පත් සහ සඟරාවල අළුත් සහ පාවිච්චි කල වාහන විකිණීම සඳහා දැන්වීම් පළ කරන අතර අළුත් වාහන ප්‍රදර්ශනාගාර සහ පරණ වාහන අංගනවලද වාහන අලෙවිය සඳහා ඇත. වාහනයක මිලට ගන්නා මුදලට සාමාන්‍යයෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තු, මුද්දර ගාස්තු හෝ අනිවාර්ය රක්ෂණ ගාස්තු ඇතුලත් නොවේ. මෙම වියදම් සාමාන්‍ය වශයෙන් මිලට ගන්නා අය විසින් වෙනමම ගෙවිය යුතුය.

Western Australia සහ Tasmania හැර වෙනත් ප්‍රාන්ත හෝ සන්තක ප්‍රදේශවල ලියාපදිංචි කල වාහනයක කලින් අයිතිකරු විසින් යම්කිසි මුදලක් ගෙවීමට ඇතිද යන්න සොයා බැලීම සඳහා පහත ආකාරයට සම්බන්ධ වන්න:

| | |
|---|---|
| **Registrar of Encumbered Vehicles** | **13 32 20** |

වාහනයක් මිළට ගැනීමට මුදලක් ණයට ගැනීම සම්බන්ධ තොරතුරු සඳහා, ඔබගේ බැංකුව හෝ මූල්‍ය සමාගම හා සම්බන්ධ වන්න. **කුමන ආකාරයක හෝ මූල්‍ය ගිවිසුමකට අත්සන් කිරීමට පෙර එහි ඇති සියළුම කොන්දේසි ඔබ විසින් හොඳින් අවබෝධ කර ගත් බවට වග බලා ගන්න.**

සෑම ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශයකම motorists' associations ඇති අතර මේවා මගින් පාවිච්චි කල වාහන මිළට ගන්නා අය හට වාහන පරීක්ෂාව, ගමන් කිරීමේ තොරතුරු, රක්ෂණ සහ මාර්ග සේවා (ඔබගේ වාහනය කැඩුණු අවස්ථාවක) ඇතුළු සේවා ලබාදේ. මෙම බොහෝ සේවා සාමාජිකයන් හට මෙන්ම සාමාජිකයන් නොවන අය හටද ලබා ගත හැකි අතර, වෙනත් ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශවල තිබෙන සහෝදර සංවිධාන ඔස්සේ එවායේ සිටින සාමාජිකයන් හටද ආවරණය ලබාදේ. Northern Territory හි ඔබට පහත ලෙස සම්බන්ධ විය හැක:

| | |
|---|---|
| **Automobile Association of Northern Territory (AANT)** | **8981 3837** |
| **AANT website** | www.aant.com.au/ |
| **Australian Automobile Association website** | www.aaa.asn.au |

ඕස්ට්‍රේලියාවේ රිය පැදවීමට දැනට වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය. රියදුරු බලපත්‍රයක් ලබාගැනීම සම්බන්ධ විස්තර සඳහා 1 වන පරිච්ඡේදයේ, *මෙහි පැමිණි විගස කල යුතු දේ* බලන්න.

**කරුණාවෙන් සලකන්න:** ඕස්ට්‍රේලියානු මාර්ග නීති ඉතා දැඩිය. 5 වන පරිච්ඡේදයේ, *ඕස්ට්‍රේලියානු චාරිත්‍ර සහ නීතිය* බලන්න.

# 10. අධ්‍යාපනය සහ ළමා සුරැකුම් (child care)

## ළමා සුරැකුම්

පාසැල් යාමට කුඩා ළමුන් සහ පාසැල් වේලාවෙන් පිටත ළමුන් සඳහා විවිධ ආකාරයේ පූර්ණ කාලීන සහ අර්ධ කාලීන ළමා සුරැකුම් සේවා රැසක් ඇත. Yellow Pages දුරකථන නාමාවලියේ ළමා සුරැකුම් ආකාර ගණනාවක් ඇති බවට ඔබට පෙනෙනු ඇත. මේවා අතර, ළමුන්ව පාසැල් වලට පිළියෙල කරන **preschool** සහ **kindergarten** ද, කුඩා ළමුන් බලා ගන්නා **child care** සහ **day care** මධ්‍යස්ථානද, සිය පවුලේ අය සමගින්ම වෙනත් ළමුන් දෙමාපියෙකු විසින් ළමුන් බලා ගන්නා **family day care** ද වේ.

ළමුන් හට එක්ව කටයුතු කිරීමට ඉගෙනීමට සහ ඔවුන්ගේ දෙමාපියන් හට කථා කරන අතර තොරතුරු බෙදාහදා ගැනීමට අවස්ථාව ලැබෙන **playgroup** ද ඇත.

| | |
|---|---|
| **Playgroup Australia** | **1800 171 882** |
| **Website** | www.playgroupaustralia.com.au |

**Adult Migrant English Program (AMEP)** පංතිවලට ඔබ සහභාගි වන අතරම, ඔබගේ පෙර පාසැල් වයසේ ළමුන් සඳහා නොමිළේ ලබා දෙන ළමා රැකවරණ සඳහා ඔබට හිමිකම් තිබිය හැක. ඔබගේ AMEP පාඨමාලාව අවසාන කිරීමෙන් අනතුරුව වෙනත් අධ්‍යාපන වැඩසටහනක් ඔබ විසින් ආරම්භ කලහොත්, ඔබගේ ළමා සුරැකුම් දීමනා සම්බන්ධයෙන් සොයා බැලිය යුතු වන්නේ වෙනත් වැඩසටහන් සඳහා මෙම හිමිකම් නොමැති විය හැකි බැවිනි.

පහත සඳහන් සේවා සම්බන්ධයෙන් රජයෙන් ලබාදෙන තොරතුරු සඳහා:

- ඔබ ප්‍රදේශයේ ළමා සුරැකුම් සේවා
- ඉඩ පහසුකම් ඇති ළමා සුරැකුම් ආකාර සහ තිබෙන පුරප්පාඩු
- සුරැකුම සම්බන්ධයෙන් යන වියදම සම්බන්ධව රජය මගින් ලබාදෙන උපකාර
- විශේෂ අවශ්‍යතාවයන් ඇති ළමුන් සඳහා සේවා
- විවිධ සංස්කෘතික පසුබිම් වලින් පැමිණෙන ළමුන් සඳහා සේවා

Child Care Access Hotline තොරතුරු සේවාව හා සම්බන්ධ වන්න:

| | |
|---|---|
| **Child Care Access Hotline** (සඳුදා සිට සිකුරාදා තෙක් පෙ.ව. 8 ප.ව. 9 දක්වා) | **1800 670 305** |
| **TTY** (ඇසීමේ සහ කථා කිරීමේ ආබාධ ඇති අය සඳහා) | **1800 639 327** |

ළමා සුරැකුම් සහ වෙනත් වියදම් සම්බන්ධයෙන් උපකාර කිරීමට ඇති Child Care Benefit සහ Family Assistance දීමනා සඳහා ඔබ හට හිමිකම් තිබිය හැකි බව මතක තබා ගන්න. 8 වන පරිච්ඡේදයේ, *සමාජ ආරක්ෂණ* බලන්න.

## පාසැල්

වයස අවුරුදු 4 සිට 5 දක්වා ළමුන් සඳහා Preschool ඇත. Preschool මගින් පාසැලට යාමට පෙර වසරේදී ළමුන්ගේ කායික, මානසික සහ සාමාජීය වර්ධනය සම්බන්ධයෙන් ඔවුන් හට උපකාර කරයි.

වයස අවුරුදු 6 සහ 15 අතර ළමුන් පාසැල් යැවීම අනිවාර්යයවේ. ළමුන් සාමාන්‍යයෙන් පාසැල් යාම අරඹන්නේ ඔවුන් වයස 4 හෝ 5 වයසේදී වන අතර වයස අවුරුදු 17 හෝ 18 තෙක් පාසැල් යාම සිදු කරයි. මේ වයසේදී විශ්ව විද්‍යාල හෝ වෙනත් වැඩිදුර අධ්‍යාපනයට සූදානම්වේ.

ඔබට ඔබගේ දරුවාව රජයේ පාසැලකට හෝ රජයේ නොවන පාසැලකට යැවිය හැක. ඔබගේ ප්‍රදේශයේ ඇති පාසැල් සොයා ගැනීම සඳහා White Pages දුරකථන නාමාවලියේ 'Schools' යටතේ බලන්න, නැතිනම් www.education.gov.au වෙබ් අඩවිය වෙත යන්න.

**රජයේ පාසැල්** මගින් නොමිළේ අධ්‍යාපනය ලබාදේ. කෙසේ වුවද, පාසැලේ අධ්‍යාපනික සහ ක්‍රීඩා වැඩසටහන් වැඩිදියුණු කිරීමට බොහෝ පාසැල් මගින් ස්වේච්ඡාවෙන් කරන මුදල් දායකත්වයක් ඉල්ලා සිටී. ගෙවීම කිරීම සම්බන්ධ තීරණය දෙමාපියන් විසින් ගත යුතුය. දෙමාපියන් විසින් තව අමතර අධ්‍යාපනික උපකරණ හෝ සේවා ලබාදීම හෝ එවා ලබාදීම සඳහා පාසැලට ගෙවීම අපේක්ෂා කල හැක. සිය ළමුන් හට පැන්සල්, පෑන්, ලියන පොත් සහ පාසැල් නිල ඇඳුම් (අවශ්‍ය අවස්ථාවලදී) ලබාදීමට දෙමාපියන් හට සිදු වනු ඇත.
**සටහන**: තාවකාලික වීසා බලපත්‍ර ඇති සියුන් විසින් සම්පූර්ණ පාසැල් ගාස්තු ගෙවීමට සිදුවිය හැකිය. විස්තර සඳහා එක් එක් පාසැලින් විමසන්න.

**රජයේ නොවන පාසැල්** විසින් ගාස්තු අය කරන අතර, ඒවා ආගම්වලට සබඳතා තිබීම හෝ විශේෂ අධ්‍යාපනික දර්ශනයක් තිබිය හැක. පුද්ගලික අධ්‍යාපනය සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය දෙමාපියන් විසින් අදාල රජයේ නොවන අධ්‍යාපන අධිකාරිය හෝ තෝරාගත් පාසැල හෝ සමඟ කෙළින්ම සම්බන්ධ විය යුතුය.

**Before and after school care** (පෙර සහ පසු පාසැල් රැකවරණ) හෝ පාසැල් වයසේ ළමුන් සඳහා **school holiday programs** (පාසැල් නිවාඩු වැඩසටහන්) සම්බන්ධයෙන් ඔබගේ පාසැලෙන් විමසන්න.

## ඉංග්‍රීසි කථා නොකරන ළමුන්

ඉංග්‍රීසි කථා නොකරන අළුතින් පැමිණි ළමුන් හට ඔවුන් වෙනුවෙන් සැලසුම් කල විශේෂිත ඉංග්‍රීසි වැඩසටහන් සපයන English Language Schools (ELS) සහ English Language Centres (ELC) වලට ඇතුල් විය හැක.

## භාෂා පරිවර්තකයන්

සීමිත ලෙස ඉංග්‍රීසි කථා කරන හෝ ඉංග්‍රීසි කථා නොකරන දෙමාපියන් සහ රැකවරණ කරුවන්, සිය දරුවන් සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීමේදී භාෂා පරිවර්තකයෙකුගේ සහාය ලබාදෙන ලෙස පාසැලෙන් ඉල්ලා සිටිය හැක. තවද **Translating and Interpreting Service (TIS National)** අමතා පාසැල හා සම්බන්ධ වෙන ලෙසද ඉල්ලා සිටිය හැක.

| | |
|---|---|
| **Translating and Interpreting Service (TIS National)** | **13 1450** |
| **TIS National** වෙබ් අඩවිය | www.immi.gov.au/tis |

## පාසැලට ඇතුලත් කිරීම

ඔබගේ දරුවා පාසැලකට ඇතුලත් කර ගැනීම සඳහා, පාසැලට දුරකථනයෙන් අමතන්න නැතිනම් පාසැල වෙත යන්න. ඔබ රැගෙන යා යුතු ලියකියවිලි වන්නේ, ඔබගේ වීසා බලපත්‍රය හෝ ඕස්ට්‍රේලියාවට පැමිණි ලේඛණ, ඔබගේ දරුවාගේ උපන් දිනය සනාථ කරන ලේඛණ සහ ඔවුන්ගේ කලින් අධ්‍යාපනය සම්බන්ධ වාර්තා ඇතුළු වෙනත් ලියකියවිලිය. එන්නත් කිරීම සම්බන්ධ ලියකියවිලිද රැගෙන යාම අවශ්‍ය විය හැක.

## පාසැලට ඇතුලත් කිරීම

ඔබගේ දරුවා පාසැලකට ඇතුලත් කර ගැනීම සඳහා, පාසැලට දුරකථනයෙන් අමතන්න නැතිනම් පාසැල වෙත යන්න. ඔබ රැගෙන යා යුතු ලියකියවිලි වන්නේ, ඔබගේ වීසා බලපත්‍රය හෝ ඕස්ට්‍රේලියාවට පැමිණි ලේඛණ, ඔබගේ දරුවාගේ උපන් දිනය සනාථ කරන ලේඛණ සහ ඔවුන්ගේ කලින් අධ්‍යාපනය සම්බන්ධ වාර්තා ඇතුළු වෙනත් ලියකියවිලිය. එන්නත් කිරීම සම්බන්ධ ලියකියවිලිද රැගෙන යාම අවශ්‍ය විය හැක.

**Charles Darwin University**
Casuarina Campus
Ellengowan Drive
CASUARINA NT 0810
Tel: **8946 6666**

## විශ්ව විද්‍යාල

ලෝකයේ තිබෙන විශ්ව විද්‍යාල අතර ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාල ඉතාම හොඳ විශ්ව විද්‍යාලවේ. සාමාන්‍ය ප්‍රථම උපාධි පාඨමාලාවක් සඳහා වසර 3 ක් ගතවන අතර, ද්විත්ව උපාධි (double-degree) සහ පශ්චාත් උපාධි අධ්‍යයනයන් (post-graduate studies) අවසන් කිරීමට වඩා දිගු කාලයක් ගතවේ. සමහර පාඨමාලා සම්බන්ධයෙන් දුරස්ථ ලෙස සහ අර්ධ කාලීන ලෙස ඉගෙනීමේ අවස්ථා ඇත. විශ්ව විද්‍යාල මගින් වඩා කෙටිකාලීන වෘත්තීය සංවර්ධන පාඨමාලාද ලබාදේ.

ඇතුළුවීම සහ පාඨමාලා සම්බන්ධ විස්තර සඳහා, එක් එක් විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වන්න, නැතිනම් **going to university** වෙබ් අඩවිය වෙත යන්න.

**Study in Australia** වෙබ් අඩවියේ ඕස්ට්‍රේලියාවේ ඉගෙන ගැනීම සම්බන්ධ වැදගත් විස්තර භාෂා 12 කින් ඇත.

| | |
|---|---|
| **Study in Australia** වෙබ් අඩවිය | studyinaustralia.gov.au |
| **Going to Uni** වෙබ් අඩවිය | www.goingtouni.gov.au |

වැඩි විස්තර සඳහා සම්බන්ධ වන්න:

| | |
|---|---|
| **Charles Darwin University** | **8946 6666** |
| **Website** | www.cdu.edu.au |

විශ්ව විද්‍යාලවල පාඨමාලා ගාස්තුවලට ඉගෙනීමේ ගාස්තු, අමතර ගාස්තු,  පොත්, වාසස්ථාන සහ සාමාන්‍ය ජීවත්වීමේ වියදම් ඇතුලත් විය හැක. ඔබට ලබාගත හැකි උපකාර සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා පහත විස්තර බලන්න:

| | |
|---|---|
| **Going to Uni Student Enquiry Line** | **1800 020 108** |

**Youth Allowance** (වයස අවුරුදු 16-24 දක්වා අය) සහ **Austudy** දීමනා (වයස අවුරුදු 25 ට වඩා වැඩි අය) මගින් අනුමත පාඨමාලා පූර්ණ කාලීනව හදාරන සිසුන් හට මුදල් උපකාර ලබාදේ. දීමනා දෙකම තීරණය වන්නේ යම් සීමාවන් තුල ඇති ආදායම් සහ සහ වත්කම් මතය. අළුතින් පැමිණෙන අය හට සාමාන්‍යයෙන් වසර දෙකක බලා සිටීමේ කාලයක් අදාලවේ. මෙම මුදල් ආධාර වැඩසටහන් සම්බන්ධ වැඩි විස්තර සඳහා, Centrelink හා සම්බන්ධවන්න (8 වන පරිච්ඡේදයේ, *සමාජ ආරක්ෂණ* බලන්න).

# 11. සෞඛ්‍යය ක්‍රමය

## Medicare

**Medicare** නමින් හඳුන්වන වැඩසටහනක් මගින් වෛද්‍ය වියදම් සහ රෝහල් රැකවරණය සඳහා ඕස්ට්‍රේලියානු රජය මගින් උපකාර ලබාදේ. Medicare මගින් වෛද්‍යවරුන් හමුවට යාම, එක්ස් රේ, ලේ පරීක්ෂා, රජයේ රෝහල්වල රැකවරණ සහ වෙනත් නිශ්චිත සේවාවන් සඳහා යන වියදම්වලින් බොහෝමයක් ලබාදේ.

ඔබ Medicare හා ලියාපදිංචිවීමට හිමිකම් ඇතිද යන්න සොයා බැලීමට, ඔබගේ ගමන් බලපත්‍රය, ගමන් ලියකියවිලි සහ ස්ථිර වීසා බලපත්‍රය රැගෙන Medicare කාර්යාලයකට යායුතුය.

Medicare මගින් ගිලන් රථ ගාස්තු, දන්ත සේවා, භෞත චිකිත්සාව (physiotherapy), ඇස් කන්ණාඩි, පාද චිකිත්සාව (podiatry), හන්දි චිකිත්සා සේවා (chiropractic services) සහ පුද්ගලික රෝහල්වල නැවතීමට **ගෙවීම් නොකරයි.** Medicare සම්බන්ධ තොරතුරු සඳහා, 1 වන පරිච්ඡේදයේ, *මෙහි පැමිණි විගස කල යුතු දේ* බලන්න.

**Medicare වෙබ් අඩවිය** www.medicareaustralia.gov.au

**Office locations**

The Galleria,
DARWIN

36 Hartley St
ALICE SPRINGS

Casuarina Shopping Square,
CASUARINA

Palmerston Shopping Centre,
PALMERSTON

## Centrelink Health Care Card

ඔබ **Centrelink** දීමනාවක් ලබා ගන්නේ නම් හෝ ඔබගේ ආදායම අඩුනම්, ඔබ රජයේ Health Care Card පතකට හිමිකම් කිව හැක. මෙම කාඩ්පත මගින් බෙහෙත් වියදම්, සහ සෞඛ්‍යය සේවා: වෛද්‍යවරයා, දන්ත වෛද්‍ය වරයා සහ ගිලන් රථ ඇතුළු විවිධ ආකාරවල සහන ගාස්තු සඳහා ඔබ හට හිමිකම් කිව හැක. Centrelink සම්බන්ධ වැඩි විස්තර සඳහා, 8 වන පරිච්ඡේදයේ, *සමාජ ආරක්ෂණ* බලන්න.

ඔබට Health Care Card පතක් තිබුණද, සියළුම මූලික රෝහල් සහ වෛද්‍ය ප්‍රතිකාර සඳහා ඔබගේ Medicare කාඩ්පත සමගින් Health Care Card පත ඉදිරිපත් කල යුතුය.

### පුද්ගලික සෞඛ්‍යය රක්ෂණය

බොහෝ ඕස්ට්‍රේලියානුවන් පුද්ගලික සෞඛ්‍යය රක්ෂණ අරමුදල් හා සම්බන්ධවීම තොරා ගනී. මේ මගින් පුද්ගලික හෝ රජයේ රෝහල්වල පුද්ගලික රෝගියකු ලෙස ඔබට ප්‍රතිකාර කිරීමට ආවරණයක් ලැබෙන අතර දන්ත රැකවරණ බොහෝ ඇස් රැකවරණ සහ ගිලන් රථ වැනි Medicare මගින් ආවරණය නොකරන වෙනත් සේවාද මෙම ආවරණයට ඇතුලත් විය හැක. ආවරණයේ ආකාරය සහ වියදම බොහෝසේ වෙනස් වන බැවින්, ඔබ පුද්ගලික සෞඛ්‍යය ආරක්ෂණයක් ලබා ගැනීමට තීරණය කලහොත්, ඔබ **රක්ෂණ ආවරණය ලබා ගැනීමට පෙර විස්තර පරිස්සමින් කියවා බැලීම** ඉතා වැදගත්වේ.

#### දිරි දීමනා

මිනිසුන් හට පුද්ගලික සෞඛ්‍යය රක්ෂණ ලබා ගැනීමට උනන්දු කිරීම අරමුණු කරගෙන රජය විසින් මූල්‍ය දිරි දීමනා ලබාදේ. ඔබ පුද්ගලික සෞඛ්‍යය ආරක්ෂණයක් ලබා ගැනීමට තීරණය කලහොත්, පහත කරුණු සම්බන්ධයෙන් අවබෝධයෙන් සිටිය යුතුයඃ

1. **සියයට 30 වට්ටම** - සියළුම ඕස්ට්‍රේලියානුවන් Medicare සඳහා සුදුසුකම් ලබයි නම් සහ රෝහල් ප්‍රතිකාර, සාමාන්‍ය ප්‍රතිකාර (උපකාර සහ අමතර) ආවරණය සහ මෙම ආවරණ දෙකම සපයන අනුකූල සෞඛ්‍යය රක්ෂණ ආවරණයක් ඇති නම් සියයට 30 වට්ටම ලබා ගැනීමට සුදුසුකම් ලබයි (වයස අවුරුදු 65-69 දක්වා අය හට වට්ටම සියයට 35 ක් වන අතර වයස අවුරුදු 70 හෝ වැඩි අයට වට්ටම සියයට 40 කි).
2. **Medicare බදු අධිභාරය (Medicare Levy Surcharge)** බදු ගෙවන වැඩිපුර ඕස්ට්‍රේලියානුවන් සංඛ්‍යාවකට තමුන් විසින් ගෙවන බදු ප්‍රමාණයෙහි Medicare බද්දක් ඇතුලත්වී ඇත. බදු අධිභාරය යනු යම්කිසි මුදලකට වඩා ආදායමක් ලබන රෝහල් ආරක්ෂණ ආවරණය නැති අය මත පනවා ඇති අමතර සියයට 1 ක මුදලකි. දැනට ඇති ආදායම් සීමාව වසරකට තනි අයෙකු වෙනුවෙන් AUD70,000 වන අතර යුවලක් හෝ පවුලක් වෙනුවෙන් AUD140,000 කි.

3. **ජීවිතකාල සෞඛ්‍යය ආවරණය -** මෙම වැඩසටහන මගින් අඩු වයසින් රෝහල් රක්ෂණ ආවරණය ගැනීමට මිනිසුන් උනන්දු කෙරේ. සිය 31 වන උපන්දිනය අවසන් වීමට පසු එළඹෙන ප්‍රථම ජූලි 1 වන දිනට පසුව රෝහල් රක්ෂණ ආවරණය ගන්නා අය විසින් සිය 31 වන උපන් දිනය අවසාන වීමට පසුව එළඹෙන ප්‍රථම ජූලි 1 වන දිනට පෙර රෝහල් රක්ෂණ ආවරණය ගන්නා අය විසින් ගෙවන මුදලට වඩා වැඩි මුදලක් ගෙවයි. රෝහල් රක්ෂණ ආවරණය ලබා ගැනීමට ප්‍රමාද කරන සෑම වසරකටම වියදම සියයට 2 කින් වැඩිවේ.

සිය 31 වන උපන් දිනයට පසුව එළඹෙන ජූලි 1 වන දිනට පසුව ඕස්ට්‍රේලියාවට පැමිණෙන නව සංක්‍රමණිකයන් සඳහා විශේෂ කොන්දේසි අදාලවේ. සිය රෝහල් රක්ෂණ ආවරණය Medicare සඳහා සුදුසුකම් ලැබූ ලෙස ලියාපදිංචි වන දිනයේ සිට මාස 12 ක් ඇතුලත ලබා ගන්නේ නම්, සංක්‍රමණිකයන් විසින් වැඩිපුර මුදලක් නොගෙවයි.

ඔබ Medicare සඳහා ලියාපදිංචිවී මාස 12ක් ඇතුලත රෝහල් රක්ෂණ ආවරණය ලබා ගැනීමට සලකා බැලීම වැදගත්වේ. ඔබ Medicare සඳහා ලියාපදිංචිවී මාස 12 කට වඩා සිටීමට තීරණය කලහොත්, වයස අවුරුදු 30 ට පසුව ප්‍රමාද කරන සෑම වසරක් සඳහාම Lifetime Health Cover සියයට 2 ක අධිභාරයක් ඔබගේ රෝහල් රක්ෂණ ආවරණය ලබා ගන්නා තෙක් අමතරව ගෙවීමට සිදුවනු ඇත.

### වැඩි විස්තර

පුද්ගලික සෞඛ්‍යය රක්ෂණය සම්බන්ධ වැඩි විස්තර www.privatehealth.gov.auහෝ www.phiac.gov.au වෙබ් අඩවි වෙත යාමෙන් හෝ පහත ආකාරයට ලබා ගත හැක:

| | |
|---|---|
| **Private Health Insurance Ombudsman** | **1800 640 695** |
| **Private Health Insurance Ombudsman** වෙබ් අඩවිය | www.phio.org.au |

## වෛද්‍ය සහාය

## Emergencies (හදිසි අවස්ථා)

Emergency ප්‍රතිකාර සමහර වෛද්‍ය මධ්‍යස්ථානවලින් හෝ රෝහල්වල emergency අංශ වලින් ලබාගත හැක. රජයේ සහ පුද්ගලික රෝහල්, White Pages දුරකථන නාමාවලියේ 'Hospitals' යටතේ ලැයිස්තුගත කර ඇත. ආතුර රථ සම්බන්ධ තොරතුරු 3 වන පරිච්ඡේදයේ, *හදිසි සේවා* යටතේ ඇත.

ඔබ රෝහලට යනවිට, ඔබ දැනට පාවිච්චි කරන බෙහෙත්, ඔබගේ Medicare කාඩ්පත, පුද්ගලික සෞඛ්‍යය රක්ෂණ සාමාජික කාඩ්පත, Health Benefits නැතිනම් Pension Concession Card පත රැගෙන යාමට මතක තබා ගන්න.

රජයේ රෝහල්වල 'Casualty' හෝ 'Emergency' අංශවල දිනකට පැය 24 පදනම මත හදිසි ප්‍රතිකාර ලබා ගත හැක.

ඔබගේ තත්වය හදිසි අවස්ථාවක් නොවේනම්, general practitioner (සාමාන්‍ය වෛද්‍යවරයෙකු) ගෙන් ප්‍රතිකාර ලබා ගත යුතුය.

## General practitioners (GPs)

හදිසි අවස්ථාවක් නොවේනම්, ප්‍රථමයෙන් ඔබ යායුත්තේ පවුලේ වෛද්‍යවරයෙකු ('general practitioner' හෝ **GP** ලෙසින් හැඳින්වේ) හෝ වෛද්‍ය මධ්‍යස්ථානයක් වෙතය. ඔබ යායුතු වෛද්‍යවරයා හෝ වෛද්‍ය මධ්‍යස්ථානය කුමක්ද යන්න ඔබට තීරණය කල හැක. Yellow Pages දුරකථන නාමාවලියේ '*Medical practitioners'* යටතේ එවා ලැයිස්තුගතකර ඇත.

ඔබගේ වෛද්‍යවරයා හට **bulk bill** කල හැක. මෙයින් අදහස් වන්නේ, ඔබට **Medicare** පෝරමයක් අත්සන් කිරීමට දී, වෛද්‍යවරයා විසින් මෙය Medicare වෙත යවා, ඔවුන් විසින් එම ගාස්තුව ගෙවීමයි. එසේ නැතිනම්, වෛද්‍යවරයා ඔබගෙන් ගාස්තුව අයකර, ඉන්පසුව Medicare හෝ පුද්ගලික සෞඛ්‍යය රක්ෂණ අරමුදල වෙතින් (ඔබට හිමිකම් ඇතිනම්) මෙම මුදල ඔබට නැවත ලබා ගැනීමට ඉල්ලා සිටිය හැක. මෙම අවස්ථා දෙකේදීම, ඔබගේ Medicare කාඩ්පත (ඔබට Health Care Card පතක් ඇතිනම් එයද) රැගෙන යා යුතුය.

### භාෂා පරිවර්තන

ඔබගේ වෛද්‍ය හමුවේදී භාෂා පරිවර්තන සේවාව ලබා ගැනීම සඳහා වෛද්‍යවරුන් හට ප්‍රමුඛතාව ඇති දුරකථන සේවාවක් හා සම්බන්ධවිය හැක. ඔබ ස්ථිර පදිංචිකරුවකු හෝ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු නම් සහ වෛද්‍ය හමුව Medicare මගින් ආවරණය වන්නේ නම්, මේ සඳහා ඔබට හෝ ඔබගේ වෛද්‍යවරයාට වියදමක් දැරීමට සිදු නොවේ. අවශ්‍ය නම්, වෛද්‍යවරයා හට එතැනට පැමිණෙන පරිවර්තකයෙකු සූදානම් කල හැක.

| | |
|---|---|
| **TIS National Doctors Priority Line** (පැය 24 පුරා) | **1300 131 450** |
| **TIS National** වෙබ් අඩවිය | www.immi.gov.au/tis |

### **Specialists** (වෛද්‍ය විශේෂඥයන්)

ප්‍රථමයෙන් GP වරයෙකු හමු නොවී ඔබට වෛද්‍ය විශේෂඥයකු හමුවිය නොහැක. වෛද්‍යවරයා විසින් ඔබව වැඩිදුර ප්‍රතිකාර සඳහා වෛද්‍ය හෝ වෙනත් විශේෂඥයන් වෙත යොමු කල හැක.

#### බෙහෙත්

ඔබට බෙහෙත් අවශ්‍ය බවට ඔබගේ වෛද්‍යවරයා විශ්වාස කරයි නම්, ඔබට බෙහෙත් ලබා ගැනීමට **chemist** (හෝ **pharmacy**) වෙත යාමට තුණ්ඩුවක් (prescription) ලියා දෙනු ඇත. ප්‍රතිජීවක ඇතුළු බොහෝ බෙහෙත් වර්ග ලබා ගත හැක්කේ වෛද්‍යවරයකු විසින් ලබා දුන් තුණ්ඩුවක් ඇතිනම් පමණි. Centrelink මගින් ලබාදුන් Health Care Card හෝ Pension Concession Card ඇතිනම්, සමහර බෙහෙත් අඩු වියදමට ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබ chemist වෙතින් බෙහෙත් ලබා ගැනීමේදීද Medicare කාඩ්පත රැගෙන යා යුතුය.

බෙහෙත්වල ඇති ලේබල් සහ උපදෙස් පරිස්සමින් කියවිය යුතු අතර අපැහැදිලි නම් ප්‍රශ්න ඇසිය යුතුය. බෙහෙත් සම්බන්ධ උපකාර හෝ උපදෙස් සඳහා, pharmacist වරයෙකු හා කථා කරන්න නැතිනම් පහත තොරතුරු බලන්න:

| | |
|---|---|
| **Medicines Line** | **1300 888 763**<br>(සඳුදා සිට සිකුරාදා දක්වා, පෙ.ව. 9 සිට ප.ව.6 තෙක්) |
| **වෙබ් අඩවිය** | www.nps.org.au |

## Community Health Centres

**Community Health Centres** මගින් සියළුම වයස්වල අයට අඩු වියදමකට සෞඛ්‍යය සේවා ලබාදේ. සෑම මධ්‍යස්ථානයක් මගින්ම එකම ආකාරයේ සේවා ලබා නොදේ. කෙසේ වුවද, සාත්තු සේවා, සෞඛ්‍යය අධ්‍යාපනය සහ ප්‍රවර්ධනය, භෞත චිකිත්සාව, දන්ත, වෛද්‍ය, උපදේශක සහ සමාජ සුභසාධන ඇතුළු සේවා බොහෝවිට ලබා ගත හැක. මේවා White Pages දුරකථන නාමාවලියේ ‘Health and Community Services’, Community Health Centres යටතේ දක්වා ඇත.

### මානසික සෞඛ්‍යය

මානසික සෞඛ්‍යය ගැටළු සහ මානසික අසනීප සඳහා උපකාර අවශ්‍ය අයට සේවා ගණනාවක් ඇත. බොහෝ අවස්ථාවල මානසික සෞඛ්‍යය අපහසුතා ඇති අය සිය general practitioner හෝ Community Health Centre වෙත යා යුතුය.

| | |
|---|---|
| **Top End Mental Health Services** | **8999 4988** |

### සංස්කෘතික හෝ භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වලින් පැමිණෙන අය සඳහා සේවා

ප්‍රාදේශීය සංක්‍රමණ ප්‍රජාවන් සඳහා සේවා සපයන බොහෝ රෝහල් සහ විශාල සෞඛ්‍යය මධ්‍යස්ථාන සතුව සෞඛ්‍යය වෘත්තීය කණ්ඩායම් ඇත. මෙම සේවා අතර උපදේශක සේවා, අවවාද ලබාදීම, යොමු කිරීම් සහ සෞඛ්‍යය තොරතුරු ඇතුලත්වේ. ඔබගේ භාෂා කණ්ඩායම සඳහා **Multicultural Health Worker** කෙනෙකු ඇතිද යන්න සොයා බැලීමට ඔබ පළාතේ රෝහල හෝ Community Health Centre අමතන්න.

### ළමුන්ගේ ආරක්ෂාව සහ හදිසි අනතුරු වැළැක්වීම

**Kidsafe**, Child Accident Prevention Foundation of Australia යනු ඕස්ට්‍රේලියාවේ දෙමාපියන් සහ ප්‍රජාවන් හට ළමුන්ගේ ආරක්ෂාව සහ හදිසි අනතුරු වැළැක්වීම සම්බන්ධ තොරතුරු සහ සේවා ලබා දෙන රාජ්‍ය නෙවන සංවිධානයකි. Kidsafe වෙබ් අඩවියේ Western Australia සහ Victoria කොටස්වල සමහර පරිවර්තිත විස්තර පත්‍රිකා ඇත.

| | |
|---|---|
| **Kidsafe NT** | **8985 1085** |
| **Help in languages other than English** | **131 450** |
| **Website** | www.kidsafe.com.au |

## එන්නත් කිරීම

එන්නත් කිරීම මගින් ළමුන්ව (සහ වැඩිහිටියන්ව) හානිකර ලෙඩ රෝගවලින් ආරක්‍ෂා කරදේ. එන්නත් කිරීම අනිවාර්‍ය නොවුවද, සියළුම ළමුන් සඳහා නිර්දේශ කෙරේ. සමහර ප්‍රාන්තයන් සහ සන්තක ප්‍රදේශවල (NSW, VIC, TAS සහ ACT) ළමුන් day care හෝ පාසැලට යාම ආරම්භ කරන විට ළමුන්ගේ එන්නත් වාර්තාවක් ඉදිරිපත් කිරීම අවශ්‍යවේ. මේ මගින් කුමන ළමුන් හට එන්නත් ලබා දී නොමැතිද යන්න child care centre හෝ පාසැල දැනගනී. එන්නත් සිය පවුලේ වෛද්‍යවරායාගෙන් හෝ Community Health Centre වෙතින් ලබා ගත හැක.

ඔබගේ Community Health Centre හෝ පළාත් පාලන ආයතනයෙන් එන්නත් ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔවුන් හා සම්බන්ධවී කුමන එන්නත් තිබේද යන්නත්, කුමන දිනවල එවා ලබා ගත හැකිද යන්නත් සොයා ගත යුතුය.

ඔබට ළමා රැකවරණ ප්‍රතිලාභ ලබා ගැනීමට ඔබගේ දරුවාව නිසි ලෙස ප්‍රතිශක්තිකරණය කර තිබිය යුතුය නැතිනම් එයින් දරුවාව මුදවා ඇති බවට සහතිකයක් තිබිය යුතුය.

| | |
|---|---|
| **National Immunisation Infoline** | **1800 671 811** |
| **Australian Childhood Immunisation Register** | **1800 653 809** |
| **National Immunisation වෙබ් අඩවිය** | http://immunise.health.gov.au |

## දන්ත සේවා

ඔබගේ පළාතේ ගාස්තු අයකර සේවා සපයන දන්ත වෛද්‍යවරුන් සිටී. දන්ත සේවා සඳහා ගෙවීම් කිරීමට උපකාර කරන පුද්ගලික සෞඛ්‍යය රක්‍ෂණ ලබා ගැනීමට ඔබ කැමැත්තක් දැක්විය හැක.

ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශ මගින් සුදුසුකම් ඇති Centrelink කාඩ් පත් ඇති අය හට සීමිත ආකාරයකට නොමිළේ ලබා දෙන දන්ත සෞඛ්‍යය රැකවරණද සපයයි. ලබා දෙන සේවා අතර මූලිකව වේදනා නාශක සහ කෘතිම දත් ඇතුළුව මූලික දන්ත සෞඛ්‍යය රැකවරණ වේ. ඔබගේ ප්‍රදේශයේ ඇති සේවා සම්බන්ධව දැන ගැනීම සඳහා ලඟම ඇති වෛද්‍ය මධ්‍යස්ථානය හෝ රෝහල හා සම්බන්ධ වන්න. ඉන්පසුව ඔබ මෙම සේවා සඳහා සුදුසුකම් ලබයිද යන්න දැන ගැනීම සඳහා Centrelink හා සම්බන්ධවන්න (8 වන පරිච්ඡේදයේ, *සමාජ ආරක්‍ෂණ* බලන්න).

## වයෝවෘද්ධ රැකවරණ (aged care) ලබා ගැනීම

නේවාසික වයෝවෘද්ධ රැකවරණ (Residential aged care) ඇත්තේ අසනීප, ආබාධිත බව, වයසට යාම, හදිසි අවස්ථාවක්, සිය රැකවරණකරුගේ, පවුලේ සහ මිතුරන්ගේ අවශ්‍යතාවයන් හෝ උපකාර නොමැතිව ගෙදරදොර කටයුතු තනිවම කර ගත නොහැකිවීම ආදී විවිධ හේතු නිසා නිවසේ තවදුරටත් ජීවත්විය නොහැකි වයසින් වැඩි අය සඳහාය. වයෝවෘද්ධ රැකවරණ මගින් ලබන රැකවරණයට වඩා අඩු රැකවරණයක් අවශ්‍ය අය විසින්, ස්වාධීනව ජීවත්වීම සඳහා තට්ටු ගෙවල් හෝ විශ්‍රාමිකයන් සඳහාවූ ගම්මාන (retirement villages) සලකා බැලිය හැක.

Aged Care Assessment Teams (ACATs) මගින් ඔබ තව දුරටත් ඔබගේ නිවසේ ජීවත්වීම සඳහා ඕස්ට්‍රේලියානු රජය මගින් ලබාදෙන කුමන ආකාරයේ සේවා ඔබට ලබා දිය යුතුද යන්නත් එසේ නැතිනම් ඔබ වයෝවෘද්ධ රැකවරණ නිවෙසකට යා යුතුද යන්නත් සම්බන්ධයෙන් උපදෙස් ලබාදේ.

ඔබ වයෝවෘද්ධ රැකවරණ නිවෙසකට යාමට පෙර අනුගමනය කලයුතු පියවර 5 ක් ඇත. එවානම්:

- ඔබගේ හිමිකම තක්සේරු කිරීම
- නිවෙසක් සොයා ගැනීම
- වියදම ගණන් බැලීම
- ඉල්ලුම් කිරීම
- නව ස්ථානයට පැමිණ ස්ථාපනය වීම.

ඕනෑම වයෝවෘද්ධ රැකවරණ උපකාරයක් සඳහා පහත විස්තර බලන්න:

| | |
|---|---|
| **Aged and Community Care InfoLine** | **1800 500 853** |
| **Seniors වෙබ් අඩවිය** | www.seniors.gov.au |

Commonwealth Carelink Centres මගින් වැඩිහිටියන් සහ ආබාධිත අයට රැකවරණය සපයන අය හට තොරතුරු සහ සහාය ලබාදේ. වැඩි විස්තර සඳහා පහත විස්තර බලන්නඃ

| | |
|---|---|
| **Commonwealth Carelink Centres** | **1800 052 222** |
| **Carelink Centres website** | www.commcarelink.health.gov.au |

## වැඩි විස්තර

වෙනත් සෞඛ්‍යය සේවා සම්බන්ධ වැඩි විස්තර සහ තොරතුරු සඳහා, ඔබගේ පළාතේ වෛද්‍යවරයා, වෛද්‍ය මධ්‍යස්ථානය, Community Health Centre, රෝහල හෝ chemist යන අයගෙන් විමසන්න.

# 12 විනෝද ක්‍රියා සහ ජනමාධ්‍යය

## එළිමහන් ක්‍රියාකාරකම්

ගමන් කිරීම (travelling), කැළෑවල ඇවිදීම (bushwalking), කඳවුරු බැඳීම (camping), ක්‍රීඩා වැනි එළිමහන් ක්‍රියාකාරකම්වලට ඕස්ට්‍රේලියාව ඉතා යෝග්‍යවේ. එළිමහනේ සිටිනවිට මතක තබා ගත යුතු ආරක්‍ෂාකාරී රීතීන් කිහිපයක් ඇත:

- මුහුදු වෙරළේ ජීවිතාරක්‍ෂකයන් (lifesavers) මුරසංචාරයේ යෙදෙන ප්‍රදේශවල පමණක් පිහිනීමට යන්න. සැමවිටම කොඩි සිටුවා ඇති ප්‍රදේශ අතර පිහිනන්න. සෑම වෙරළකම ජීවිතාරක්‍ෂකයන් මුරසංචාරයේ නොයෙදේ.
- තනියෙන් පිහිනීමට හෝ මසුන් ඇල්ලීමට නොයන්න.
- හිරු ඇති දිනවල හිරු එළියෙන් පිළිස්සීම (sunburn) සහ සමෙහි පිළිකා ඇතිවීම වැළැක්වීමට තොප්පි හෝ හිස්වැසුම් පළඳින්න. මෙය තරුණ ළමුන් සම්බන්ධයෙන් විශේෂයෙන් වැදගත් වන අතර ග්‍රීෂ්ම (summer) මාස පුරා හිරුපළඳනා පාවිච්චි කරන ලෙස පාසැල් මගින් උනන්දු කරනු ඇත.
- ආරක්‍ෂාකාරී හිරුආලේප (sunscreen) පාවිච්චි කරන්න. බෙහෙත් සාප්පුවලින් (chemist) හෝ සුපිරි වෙළඳසැල් (supermarket) වලින් මේවා මිළට ගත හැක.
- **Total fire ban** (ගිනි ඇවිලීමට ඇති සම්පූර්ණ තහනම) ඇති දිනවල විවෘත ස්ථානවල ගිනි ඇවිලීම සහ බාබෙකූව් (barbeques) අනුමත නොකෙරේ. Total fire ban දින සම්බන්ධයෙන් විස්තර සඳහා පහත තොරතුරු බලන්න:

| | |
|---|---|
| **Weather forecasts** | **1196** |
| **Bureau of Meteorology website** | www.bom.gov.au/weather/ |
| **The Royal Life Saving Society Australia** | www.royallifesaving.com.au |
| **Swim Australia** | www.swimaustralia.org.au |
| **Kidsafe** | www.kidsafe.com.au |

පහත දුරකථන අංක ප්‍රයෝජනවත් විය හැක:

| | |
|---|---|
| **Northern Territory Tourist Commission** | **(Toll Free) 13 67 68** |
| **Parks and Wildlife Commission** | **8999 4555** |

## ජනමාධ්‍ය

ප්‍රධාන සාප්පු මධ්‍යස්ථානවල ඇති බොහෝ නිව්ස් ඒජන්සිහි විවිධ භාෂාවලින් ඇති පුවත් පත් ඇත. කෙසේවුවද ඔබට අවශ්‍ය පුවත්පත ඔවුන් ලඟ නැතිනම්, ඔබ වෙනුවෙන් එය ගෙන්වා දෙන ලෙස ඉල්ලා සිටින්න.

**Special Broadcasting Service (SBS)** රූපවාහිණී සහ ගුවන්විදුලි මධ්‍යස්ථාන විසින් විවිධ ප්‍රජා භාෂාවලින් වැඩසටහන් විකාශණය කෙරේ. සතිපතා වැඩසටහන් ප්‍රධාන පුවත්පත්වල පළකෙරේ. වාර්ගික ගුවන් විදුලි මධ්‍යස්ථාන ලැයිස්තුවක් National Ethnic and Multicultural Broadcasters' Council (NEMBC) වෙබ් අඩවියේ ඇත.

**Communication services (සන්නිවේදන සේවා) සඳහා කිසියම් ගිවිසුමක් අත්සන් කිරීමට පෙර,** තමාගේ ජීවන රටාවට එම සේවාව අත්‍යාවශ්‍යද යන්න සියළුම පාරිභෝගිකයන් විසින් සොයා බැලිය යුතුය. සමහර අවස්ථාවල නොමිළේ බැලීමට විකාශනය කරන රූපවාහිණී සේවා සඳහා ගෙවිය යුතු බව විශ්වාස කරමින් ගෙවීම් කරන රූපවාහිණී සේවා (**pay television**) සඳහා දායක මුදල් ගෙවීමට සමහර අය සත්සන් කර ඇත.

## ඉන්ටනෙට්

වැඩසටහන් ගණනාවක් මගින්ම ඉන්ටනෙට් පහසුකම් නැති අයට නොමිලේ හෝ ඉතා සහනදායී ආකාරයේ ඉන්ටනෙට් පහසුකම් සහ පුහුණුව ලබාදේ. වැඩිදුර විස්තර සඳහා ඔබගේ පළාත් පාලන ආයතනය හෝ පළාතේ පාසැල (ග්‍රාමීය හෝ ප්‍රාදේශීය ස්ථානවල) හා සම්බන්ධවන්න. මහජන පුස්තකාල වෙතින් නොමිලේ ඉන්ටනෙට් පහසුකම් ලබාගත හැකිය.

| | |
|---|---|
| **Australian Library Gateway** | www.nla.gov.au/libraries |
| **Australian Internet Cafes** | www.gnomon.com.au/publications/netaccess/ |

# 13. Department of Immigration and Citizenship

**Department of Immigration and Citizenship (DIAC)** යනු ඔබගේ සියළුම වීසා බලපත්‍ර සහ ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය සම්බන්ධයෙන් ඔබ යායුතු ස්ථානයයි. ඕස්ට්‍රේලියාවේ පදිංචිවීම ඇතුළුව වෙනත් බොහෝ සාමාන්‍ය තොරතුරු DIAC **Living in Australia** වෙබ් පිටුවල ඇත.

| | |
|---|---|
| **DIAC enquiries** | **131 881** |
| **DIAC වෙබ් අඩවිය** | www.immi.gov.au |
| **Living in Australia වෙබ් පිටු** | www.immi.gov.au/living-in-australia |

DIAC ප්‍රාදේශීය කාර්යාල මගින් වීසා සහ බලපත්‍ර, තාවකාලික සහ ස්ථිර ලෙස පදිංචිය සඳහා අයදුම්පත්‍ර වැනි බොහෝ කරුණු සම්බන්ධයෙන් කටයුතු කරයි:

**NT Regional Office**
40 Cavenagh St
DARWIN NT 0800

## ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය

බොහෝ ස්ථිර වාසීන් හට ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය ලබා ගැනීමේ ප්‍රථම අදියර වන්නේ පුරවැසිභාවය සම්බන්ධ විභාගය සමත්වීමය. විභාගයට සුදානම්වීම සඳහා පහත සඳහන් වෙබ්අඩවියේ ඇති citizenship resource book කියවිය යුතුය.

ඔබ විභාගය සමත්වී ඕස්ට්‍රේලියාවේ නිශ්චිත කාලයක් ජීවත්වීම සහ මනා චරිතයකින් යුක්තවීම වැනි ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය සම්බන්ධයෙන් ඇති වෙනත් අවශ්‍යතා සපුරාලීමෙන් පසු ඔබ විසින් ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කල යුතුය. ඔබගේ අයදුම්පත්‍රය සාර්ථක නම්, පුරවැසිභාවය ලබා දීමේ උත්සවයකට (citizenship ceremony) පැමිණෙන ලෙසට ඔබට ආරාධනය කරනු ඇත. උත්සවයේදී, බොහෝ වැඩිහිටියන් විසින් පුරවැසියන් වීමට පෙර කැපවීමේ පොරොන්දුව (Pledge of Commitment) ලබා දිය යුතුය. සුදුසුකම් සහ අයදුම් පත්‍ර සම්බන්ධයෙන් විස්තර ඇතුළුව වැඩිදුර විස්තර සඳහා පහත තොරතුරු බලන්න:

| | |
|---|---|
| **Citizenship Information Line** (ඕස්ට්‍රේලියාව තුල) | **131 880** |
| **Citizenship වෙබ් අඩවිය** | www.citizenship.gov.au/ |

ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු වීමෙන් අනතුරුව, ඕස්ට්‍රේලියානු ගමන් බලපත්‍රයකට අයදුම් කල හැක. ඔබට ඕස්ට්‍රේලියානු පුරවැසිබව මෙන්ම වෙනත් රටක පුරවැසිබවද ඇතිනම්, ඕස්ට්‍රේලියාවෙන් පිටතට සහ ඕස්ට්‍රේලියාව වෙතට ගමන් කිරීමේදී ඕස්ට්‍රේලියානු ගමන් බලපත්‍රය භාවිතා කල යුතුය.

වයස අවුරුදු18 හෝ එයට වැඩි ඕස්ට්‍රේලියානු පුරවැසියන් සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ලියාපදිංචිවීම අනිවාර්යයවේ. ඔබගේ ඕස්ට්‍රේලියානු පුරවැසි උත්සවයේදී ඒ සඳහා ලියාපදිංචි විය හැක. ඔබගේ වයස අවුරුදු 18 දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඔබට අවුරුදු 17 දී වුවද ලියාපදිංචි විය හැක.

ලියාපදිංචිවීමේ පෝරම තැපැල් කාර්යාල, **Australian Electoral Commission (AEC)** කාර්යාල සහ AEC වෙබ් අඩවියෙන් ලබා ගත හැක. එක පෝරමයක් පිරවීම මගින් ඔබ හට ෆෙඩරල් මැතිවරණ, ප්‍රාන්ත/සන්තක ප්‍රදේශ මැතිවරණ සහ බොහෝ පලාත් පාලන මැතිවරණ සඳහා ලියාපදිංචිවීම සිදුවේ. ඔබගේ ලිපිනය වෙනස් කල සෑම අවස්ථාවකම ඔබ විසින් නව ලියාපදිංචිවීමේ පෝරමයක් පිරවිය යුතුය. වැඩිදුර විස්තර වෙබ් අඩවියේ ඇත (ඉංග්‍රීසි හැර වෙනත් භාෂාද ඇතුළුව), නැතිනම් ඔබට වෙනත් ගැටළු ඇතිනම් AEC අමතන්න.

| | |
|---|---|
| **Australian Electoral Commission (AEC)** | **13 23 26** |
| **AEC වෙබ් අඩවිය** | www.aec.gov.au |

## Resident Return Visas (නේවාසිකයන් නැවත පැමිණීමේ වීසා බලපත්‍ර)

ඔබ තාවකාලිකව ඕස්ට්‍රේලියාවෙන් බැහැරව ගොස් නැවත පැමිණීමට බලාපොරොත්තු වන ඕස්ට්‍රේලියානු නිත්‍ය වාසිකයෙකු නම් ඔබ හට **Resident Return Visa** බලපත්‍රයක් අවශ්‍ය විය හැක. ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණීමට වීසා බලපත්‍රයක් අවශ්‍යද යන්න සොයා ගැනීම සඳහා DIAC හා සම්බන්ධවන්න.

## ඥාතීන් බැලීමට ඕස්ට්‍රේලියාවට පැමිණීම

### පැමිණීමට

මෙහි පැමිණෙන අය සඳහා ඕස්ට්‍රේලියාවේ සිටින මුළු කාලය සඳහා වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සිදුවේ. විවිධ ආකාරයේ සංචාරක වීසා බලපත්‍ර සඳහා විශේෂ කොන්දේසි ඇති බැවින් වැඩිදුර විස්තර සඳහා ළඟම ඇති **Australian Overseas Immigration Office** (පහත බලන්න) හා සම්බන්ධවන්න.

**Electronic Travel Authority (ETA)** ක්‍රමය බලයලත් ට්‍රැවල් ඒජන්සි සහ ගුවන් සේවා සහ බොහෝ ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාල මගින් රටවල් 30 කට අධික ගමන් බලපත්‍ර හිමියන් හට ලබා ගත හැක. ETA මගින් ඕස්ට්‍රේලියාවට කෙටි කාලයකට පැමිණෙන සංචාරකයන් හට සිය ගුවන් ගමන පිළියෙල කර ගන්නා අවස්ථාවේම ඕස්ට්‍රේලියාවට පැමිණීමට අවසරය ලබා ගත හැක. ETA පහසුකම ඇති අය විසින් වීසා බලපත්‍රයක් ලබා ගැනීමට අයදුම් පත්‍රයක් පිරවීමට අවශ්‍ය නැත. වැඩිදුර විස්තර www.eta.immi.gov.au/ හි ඇත.

### සංක්‍රමණය වීමට

ඕස්ට්‍රේලියාවේ සංක්‍රමණ වැඩසටහන තුල මූලික කොටස් තුනක් ඇත:

- **Family migration**. අයදුම්කරු හට අනුග්‍රහය ලබා දීමට ඥාතියෙකු ඕස්ට්‍රේලියාවේ සිටිය යුතුය.
- **Skilled migration**. ඕස්ට්‍රේලියාවේ ආර්ථිකයට හෝ ඕස්ට්‍රේලියාවේ ජීවිතයට වෙනත් ආකාරයකට දායක විය හැකි නිපුණතාවයන් හෝ විශේෂ හැකියාවන් අයදුම්කරුට තිබිය යුතුය.
- **Refugee, Humanitarian, Special Humanitarian** සහ **Special Assistance** වැඩසටහන්.

එක් එක් සංක්‍රමණ කාණ්ඩ සඳහා ස්ථිර අවශ්‍යතාවයන් ඇති අතර ඔබගේ ඥාතියා එම අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය. සංක්‍රමණ රෙගුලාසි සංකීර්ණ අතර නිතර වෙනස් වන බැවින් තමාගේ පුද්ගලික තත්වය සම්බන්ධයෙන් විස්තර දැන ගැනීමට DIAC හා සම්බන්ධවීම වඩා යෝග්‍යවේ. විස්තර සඳහා පහත බලන්න:

**Migrating to Australia** www.immi.gov.au/immigration.htm

Australian Overseas Immigration Office ලැයිස්තුවක් සඳහා
www.immi.gov.au/contacts/overseas/index.htm

# 14. පළාත් පාලනය සහ ප්‍රජා සේවා

ඕස්ට්‍රේලියාවේ රාජ්‍යය පාලනය මට්ටම් තුනක පවතී: කොමන්වෙල්ත්, ප්‍රාන්ත හෝ සන්තක ප්‍රදේශ සහ පළාත් පාලන මේවාවේ. ඔබගේ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය මගින් ඔබ ජීවත්වන ප්‍රදේශය රැකබලා ගන්නා අතර පළාතේ ප්‍රජාවට වැදගත් සේවාවන් රාශියක් සපයයි. පළාත් පාලන ආයතනවලට ප්‍රධාන වශයෙන් මුදල් ලැබෙන්නේ පළාතේ දේපළ හිමි අය විසින් ගෙවනු ලබන වරිපනම් බදු මගිනි. ඔබ හට මෙම සේවා ලබා ගැනීමට දේපළක් හිමිව තිබීම අවශ්‍ය නැත.

## ප්‍රජා සේවා

පළාත් පාලන ආයතන මගින් බොහෝ අවස්ථාවල ප්‍රජා කණ්ඩායම්වල ක්‍රීඩා, විනෝද ක්‍රියා සහ සංස්කෘතික කටයුතු සඳහා භාවිතයට පොදු ශාලා පහසුකම් ලබාදේ. පළාත් පාලන ආයතන මගින් ළමා සෞඛ්‍යය මධ්‍යස්ථාන, ළමා රැකවරණ මධ්‍යස්ථාන, තරුණ සේවකයන්, සහ වයෝවෘද්ධ රැකවරණ සහ ආබාධිත සේවා වැනි විවිධ ආකාරයේ උපකාර සේවාද ලබාදේ.

## බහු වාර්ගික සේවා

බොහෝ පළාත් පාලන ආයතන සතුව ඔබ ඕස්ට්‍රේලියාවේ ජීවිතයට හුරු වන අතර වටිනා උපකාර සහ උපදෙස් ලබාදිය හැකි බහුවාර්ගික හෝ ප්‍රජා සේවකයන් ඇත. සමහර සේවා සංස්කෘතිකමය සහ භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වලින් පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ විශේෂිත අවශ්‍යතාවයන් අරමුණු කරගෙන සම්පාදනය කර ඇත.

## පුස්තකාල

බොහෝ ප්‍රදේශවල මිනිසුන් හට සාමාජිකත්වය ලබාගෙන නොමිළේ පොත් බැහැර ගත හැකි මහජන පුස්තකාල ඇත. පුස්තකාල සතුව ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් ලියවුණු පොත් ඇත. නැතිනම් ඒවා ඇණවුම් කර ගෙන්වා ගත හැක. බොහෝ පුස්තකාලවල ඔබට ඉන්ටනෙට් පහසුකම් ලබා ගත හැක.

**Casuarina: Bradshaw Terrace**
Casuarina
Tel: **8927 9655**
Email:
casuarinalibrary@darwin.nt.gov.au

**Karama: Karama Shopping Plaza**
Kalymnos Drive
Tel: **8927 2505**
Email:
karamalibrary@darwin.nt.gov.au

**Taminmin Community Library**
Humpty Doo NT 0836
Tel: **8988 1200**
Email: taminmin.dcis@nt.gov.au

**Nhulunbuy Community Library**
Matthew Flinders Way
Nhulunbuy NT 0881
Tel: **8987 0860**
Email:
nhulunbuylibrary.dcis@nt.gov.au

**Tennant Creek Library**
Peko Road, Tennant Creek
Tel: **8962 2657**
Email: library@tennantcreek.nt.gov.au

**Northern Territory Library**
Parliament House
Tel: **8999 7177**
Toll Free: **1800 019 155**
Email: ntlinfo.dcdsca@nt.gov.au

**Darwin City: Civic Centre**
Harry Chan Avenue
Tel: **8930 0230**
Email: citylibrary@darwin.nt.gov.au

**Nightcliff: Pavonia Place**
Nightcliff Shopping Centre
Tel: **8985 1461**
Email:
nightclifflibrary@darwin.nt.gov.au

**Palmerston Library**
Goyder Square, The Boulevard
Palmerston NT 0830
Tel: **8935 9993**
Email: askus@palmerston.nt.gov.au

**Katherine Public Library**
Randazzo Centre
Katherine Terrace
Tel: **8971 1188**
Email: library@ktc.nt.gov.au

## වෙනත් සේවා

පළාත් පාලන ආයතන මගින් පළාතේ මාර්ග නඩත්තු කිරීම, පොදු වැසිකිළි පහසුකම් ලබාදීම, සාප්පු සහ භෝජන ශාලා නිසි සෞඛ්‍යය සම්මතයන් පවත්වාගෙන යන බවට වග බලා ගැනීම ආදිය සිදු කරයි. ඔවුන් විසින් ගොඩනැගිලි සංවර්ධනය පාලනය කරන අතර ඔබගේ දේපළට යම්කිසි වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නම්, ඔබට ඒ සඳහා අනුමැතිය ඇතිද යන්න ඔබගේ පළාත් පාලන ආයතනය සමගින් සොයා බැලිය යුතුය.

කුණු කසළ එකතු කිරීම සහ චක්‍රීයකරණය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත වගකීම ඇත. ඔබගේ පළාත් පාලන ආයතනය හෝ අසල්වාසීන්ගෙන් විමසා කුණු කසළ එකතු කරන වේලාවල් දැනගන්න.

## වැඩි විස්තර

ඔබගේ වටපිටාවේ ඇති සේවා සම්බන්ධයෙන් වැඩි විස්තර ලබා ගැනීම සඳහා ඔබගේ පළාත් පාලන ආයතනය හෝ පළාතේ පුස්තකාලය වෙත යන්න. පළාත් පාලන ආයතන දුරකථන අංක සහ ලිපිනයන් White Pages දුරකථන නාමාවලියේ පළාත් දිස්ත්‍රික්කය යටතේ දක්වා ඇත. ඔබගේ පළාත සම්බන්ධයෙන් විශේෂඥයන් ඔවුන් බව මතක තබා ගන්න! පළාත් පාලනය සම්බන්ධ තොරතුරු www.gov.au වෙබ් අඩවිය මගින්ද ලබා ගත හැක.

**Local Government website** www.gov.au

**Alice Springs Town Council**
Todd St
Tel: **8950 0500**
www.alicesprings.nt.gov.au

**Tennant Creek Town Council**
Peko Rd
Tel: **8962 0000**
www.tennantcreek.nt.gov.au

**Katherine Town Council**
Stuart Hwy
Tel: **8972 5500**
www.katherine.nt.gov.au

**Jabiru Town Council**
Tasman Crs
Tel: **8979 2230**
www.jabiru.nt.gov.au

**Darwin City Council**
Harry Chan Ave
Tel: **8930 0300**
www.darcity.nt.gov.au

**Palmerston City Council**
2 Chung Wah Tce
Tel: **8935 9922**
www.pcc.nt.gov.au

**Litchfield Shire Council**
Bees Creek Rd
Tel: **8983 1912**
www.litchfield.nt.gov.au